රළ සමග
ISSN 1391 - 1031
2016 ජූලි
22 වෙළුම 04 කලාපය
ආධාරය රු 30/=

# ඇ නියමුවා

ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත
පුවත්පතක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී

"ඉතිහාසයේ අක් වක් මාර්ග නිසා සමාජවාදී විප්ලවය ආරම්භ කිරීමට සිදුවූ රට නොදියුණු වූ තරමට, එම රටට පැරණි ධනපති සබඳතාවයන්ගේ සිට සමාජවාදී සබඳතාවයන් දක්වා පරිවර්තනය වීම වඩාත් අසීරු වන්නේය. විශ්වාස නොකළහැකි තරම් අසීරු කර්තව්‍යයන්, සංවිධානාත්මක කාර්යයන් විනාශයේ කර්තව්‍යයන්ට එකතුවන්නේය."


**ලෙනින්**
**විප්ලවවාදී වාග් පාඨ**
**84 පිටුව**

**05 විධායක ජනාධිපති...**



ටට නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සකස් කරන්නේ නම් එය සකස් විය යුත්තේ, 2015 ජනවාරි...

**09 යහපාලන ණය...**



සාමාන්‍ය පිළිගත් සිද්ධාන්ත අනුව, රජයේ විගණකාධිපතිවරයා ස්වාධීන මතයක් ඉදිරිපත් කරන්නෙකු...

**11 මිත්‍යාව තවමත්...**



මිනිසුන් මිත්‍යා විශ්වාසවලට යොමු වීමේ අතීත හේතු පැවතුණේ ඔහු සොබාදහම...

සංවාදය.......................... 03
තරුණ............................ 04
ආවර්ජනා......................... 06
කාන්තා........................... 10
ජාත්‍යන්තර ........................ 12
වේදිකාව .......................... 13
විශේෂාංග......................... 14



ජූලි 14
මතකය අලුත් වෙයි
නුඹ ගැන...
නුඹේ පරපුර ගැන
ලෝකය එකට හිනැහෙන
අලුත් දවසක් ගැන
අපට කියාදුන් නුඹ ගැන
දහිරියේ ධජ එසවෙයි
අරමුණ කරා එළඹෙන
ඔබෙන් මඟ දැනගෙන
අපේ පරපුර
ඉදිරියට යන...
අලුත් ලෝකය දොරටු ඇරගෙන
පුපුරුවා බැස්ටිලය බිඳහැර
නිදහස ගෙනා ඒ දින
සම්මතය බිඳගෙන
අලුත් මඟකට
අලුත් ලොවකට
මඟ කියාදුන්
පහන් තරුවේ උපත සිදුවූ
දිනය අද විය
දයාබර ගුරුතුමනි...
ඔබෙන් මඟ දැනගෙන
දිනා දෙන්නෙමු
නියත හෙට දින

**ජූලි 14 දිනට යෙදෙන ජ.වි.පෙ. නිර්මාතෘ සදාදරණීය රෝහණ විජේවීර සහෝදරයාගේ 73වැනි ජන්ම සංවත්සරය වෙනුවෙනි.**

# නව ව්‍යවස්ථාව අවුලක!

# විධායක ක්‍රමය අත්නොහරින ලකුණු

02 පිටුවට




ජුනි 03 කොළඹ දී පැවති උද්ඝෝෂණ පාගමන...

# ILO සමුළුවට වසන්ත ජිනීවා නුවරට



ජාත්‍යන්තර කම්කරු සම්මේලනයේ 105වැනි සමුළුව පසුගිය ජූනි මස මුල් සති දෙක තුළ ස්විස්ටර්ලන්තයේ ජිනීවා නුවරදී පැවැත්විණි. මේ සඳහා අන්තර් සමාගම් සේවක සංගමය නියෝජනය කරමින් සභාපති වසන්ත සමරසිංහ සහෝදරයා සහභාගි වූ අතර මෙම සමුළුව සඳහා ලාංකේය වැඩකරන ජනතාව නියෝජනය කරමින් යෝජනා කිහිපයක් ඉදිරිපත් කිරීමට ඔහු පියවර ගත්තේය.

# තැපැල් සේවා සංගමයේ වාර්ෂික සමුළුව මුළුදෙයි




පසුගියදා ලංකා තැපැල් සේවා සංගමයේ වාර්ෂික නියෝජිත සමුළුව කොළඹ මහජන පුස්තකාලයේදී ජාතික වෘත්තීය සමිති මධ්‍යස්ථානයේ සභාපති ලාල්කාන්ත සහෝදාරයාගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණි. දිවයිනේ විවිධ පෙදෙස්වලින් පැමිණි තැපැල් සේවකයෝ විශාල පිරිසක් මෙම අවස්ථාවට සහභාගි වූහ.

ලංකා තැපැල් සේවා සංගමයේ ප්‍රධාන ලේකම් ඩී.එම්. විජේරත්න සහෝදරයා ඇතුළුව ඉදිරි වර්ෂය සඳහා නිලධාරී මණ්ඩලයක් මෙහිදී පත්කර ගනු ලැබිණි.

# දේශපාලන අතපෙවීම්වලට එරෙහිව ගුරු විදුහල්පති උද්ඝෝෂණයක්



විදුහල්පති ශ්‍රේණිධාරීන්හට පත්වීම් ලබාදීමේදී සිදුව ඇති දේශපාලන අතපෙවීම්වලට එරෙහිව ගුරු-විදුහල්පති වෘත්තීය සමිති එකමුතුව මගින් පසුගියදා අධ්‍යාපන අමාත්‍යාංශය ඉදිරිපිටදී උද්ඝෝෂණයක් පැවැත්විය. නව ශ්‍රේණිධාරී විදුහල්පතිවරු විධිමත් ලෙස ස්ථානගත කිරීම, එම ස්ථානගත කිරීමේදී දේශපාලන අතපෙවීම් නොකිරීම, නව ශ්‍රේණිධාරීන් අත්තනෝමතිකව දුෂ්කර සේවයේ නොයෙදවීම, විදුහල්පති දීමනාව වැඩිකිරීම යන ප්‍රධාන ඉල්ලීම් මූලික කරගෙන මෙම උද්ඝෝෂණය පවත්වනු ලැබිණි.

මෙහිදී මහින්ද ජයසිංහ සහෝදරයා පැවසුවේ අධ්‍යාපන අමාත්‍යාංශයේ පවතින අකාර්යක්‍ෂමතාවයත්, නොහැකියාවත් නිසා විදුහල්පතිවරු සති ගණනක් පාසල්වල පත්වීම් නොලැබ සිටින බවත් ආණ්ඩුවේ දේශපාලන වුවමනාව හමුවේ මෙම පත්වීම් ලබා දීම ප්‍රමාද කර ඇති බවත්ය. ඔහු වැඩිදුරත් පැවසුවේ විදුහල්පති පත්වීම් විභාගය අසමත් පිරිසකට පවා අමාත්‍යාංශය විසින් පත්වීම් ලබාදී ඇති බවය. ආණ්ඩුව මෙම විධිමත් බඳවාගැනීම තවදුරටත් ප්‍රමාද කරන්නේ නම් ලංකා ගුරුසේවා සංගමය ඇතුළුව ගුරු-විදුහල්පති වෘත්තීය සමිති එකමුතුව ලෙස දැවැන්ත වෘත්තීය ක්‍රියාමාර්ගවලට යාමට සූදානම් බවද ඔහු මෙහිදී පැවසීය.

# දේශපාලන වුවමනාවට විගණන පනත වෙනස් කරනු බැහැ

## ජාතික වෘත්තීය සමිති මධ්‍යස්ථානය




ආණ්ඩුවේ දේශපාලන වුවමනාව මත ජාතික විගණන පනත වෙනස් කිරීමට ඉඩ නොදෙන බවත් විගණන පනත මගින් විගණකාධිපතිට අධිභාරයක් පැනවීම සඳහා හිමි බලය වළක්වාලන්නට කටයුතු කිරීම පිළිකුල් සහගත බවත් වසන්ත සමරසිංහ සහෝදරයා පවසයි.

පසුගියදා ජාතික වෘත්තීය සමිති මධ්‍යස්ථානය මගින් කොළඹදී පැවැත්වූ මාධ්‍ය හමුවකදී ඔහු මේ බව පැවසීය. විශාල මූල්‍ය වංචාකිරීමේදී අධිභාරයක් පැනවීමේ විගණකාධිපතිට හිමි බලය ඉවත් කිරීමට කටයුතු කිරීම නැවැත්විය යුතු බවත් ඔහු මෙහිදී අවධාරණය කළේය. එමෙන්ම රටේ විගණන ක්ෂේත්‍රයේ නිලධාරීන්, රජයේ ගණකාධිකාරිවරුන් ඇතුළු වෘත්තීය සමිති නියෝජිතයින් ලෙස මේ සම්බන්ධයෙන් ආණ්ඩුවට බලකරන බවත් වහාම මෙම ජාතික විගණන පනතේ අධිභාරයක් පැනවීමේ බලය අහිමි නොකර රාජ්‍ය සේවයේ ස්වාධීනත්වයත්, නිලධාරීන්ට ඇති ස්වාධීනත්වයත්, මහජනතාවට ඇති ආරක්ෂාවත් සලකා බලා මෙම අදාල වගන්තිය සහිතව විගණන පනත කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කර වහාම ක්‍රියාත්මක කළ යුතු බවත් මෙහිදී වසන්ත සමරසිංහ සහෝදරයා පැවසීය. පසුගිය කාලයේ විශාල ලෙස සිදුවූ මූල්‍ය වංචාවන් සිදුවුයේ රාජ්‍ය සේවකයින් පීඩාවට පත්කරමින්, ඔවුන්ට බලපෑම් කිරීම මගින් බවත් එබැවින් රාජ්‍ය සේවාවේ ස්වාධීනත්වය ආරක්ෂා කිරීම ප්‍රමුඛ බවත් ඔහු මෙහිදී පැවසීය. මෙම වගන්ති අහිමි කිරීමෙන් මහ බැංකුවේ මුදල්වලට සිදුවූ ප්‍රතිඵලයම ඉදිරියේදී සිදුවිය හැකි බවත් ජාතික විගණන පනත දේශපාලනීකරණයට ලක්වීම වැළැක්විය යුතු බවත් මෙහිදී ඔහු කියා සිටියේය. මෙම මාධ්‍ය හමුව සඳහා එම මධ්‍යස්ථානය නියෝජනය කරමින් රංජන් ජයලාල් සහෝදරයාද සහභාගි විය.

## නව ව්‍යවස්ථාව...

මුල් පිටුවෙන්

වත්මන් හවුල් ආණ්ඩුව බලයට පැමිණීමට පෙර සිටම ජනතාවට මහත් සේ අවධාරණය කරන ලද විධායක ජනාධිපති ධුරය අහෝසි කරන නව ව්‍යවස්ථාවක් සකස් කිරීම පිළිබඳ පොරොන්දුව පුස්සක් වන ලකුණු පහළ වී තිබේ. එසේම තමන්ට වාසිදායක ලෙසට ඡන්ද ක්‍රමය වෙනස් කිරීම මූලික කරගත් නව ව්‍යවස්ථාවක් කෙරෙහි ආණ්ඩුවේ අවධානය යොමු වී ඇති බවද ආණ්ඩුවේ අභ්‍යන්තර ආරංචි මාර්ග පවසයි.

විශේෂයෙන් මෛත්‍රීපාල සිරිසේන මහතා ජනාධිපතිවරණයට ඉදිරිපත්වීමේදීද ජයග්‍රහණයෙන් පසුව දිවුරුම් දීමේදීද මෙය ලංකාවේ අවසාන ජනාධිපතිවරණය වනු ඇති බවට අදහස් පළ කර තිබුණි. එහෙත් මේවන විට මෛත්‍රීපාල ජනාධිපතිවරයාට සහය දීමට ඉදිරිපත්වී සිටින, මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිවරයාට සහය දුන් ශ්‍රීල.නි.ප. මැති ඇමතිවරුන්ගේ වුවමනාව වනුයේ විධායක ජනාධිපති ධුරය අහෝසි නොකර එලෙසම පවත්වා ගැනීමය. එය මෛත්‍රීපාල ජනාධිපතිවරයාගේ අකමැත්ත මත සිදුවන බවට හැඟවෙන නමුත් ශ්‍රීල.නි.ප ප්‍රබලයින් මේ පිළිබඳව අදහස් දක්වද්දී ජනාධිපතිවරයා ඒ පිළිබඳව මේ දක්වා නිශ්චිත අදහසක් ප්‍රකාශ නොකිරීමෙන් එය ඔහුගේද අනුමැතිය ඇතිව සිදුවන්නක් බව දේශපාලන ආරංචි මාර්ග පවසයි.

මේ අතර 1978 ව්‍යවස්ථාව මගින් විධායක ජනාධිපති ධුරය හඳුන්වා දුන් එක්සත් ජාතික පක්ෂය පසුකාලීනව ඊට එරෙහි ජනමතය තීව්‍ර වීමත් සමඟ පසුගිය මැතිවරණ සමය වන විට විධායක ජනාධිපති ධුරය අහෝසි කිරීමට පක්ෂ බව ප්‍රකාශ කර තිබිණි. කෙසේ වුවද මේ වන විට එ.ජා.ප.ය නැවත වරක් තමන්ගේ නව ලිබරල් ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා ඊට ගැලපෙන නව ව්‍යවස්ථාවක් ගැන පමණක් සිතන තත්වයක් තුළ විධායක ජනාධිපති ධුරය අහෝසි කිරීම වෙනුවෙන් වන මැදිහත්වීම අත්හැරීමේ ඉඩකඩ ඇති බවද පැවසේ.

කෙසේ වුවද හවුල් ආණ්ඩුවේ ප්‍රධාන පාර්ශව දෙකම විධායක ජනාධිපති ධුරය සම්බන්ධයෙන් දරන මෙම නව ස්ථාවරය ඔවුන් මැතිවරණයේදී ජනතාව හමුවේ ප්‍රකාශ කරන ලද අදහසට සම්පූර්ණයෙන් පටහැණි වන අතරම විධායක ජනාධිපති ධුරය අහෝසි කිරීම සඳහා දෙන ලද ජනවරමට සෘජු ලෙසම පිටුපෑමකි.

මේ පිළිබඳව නියමුවා කරන ලද විමසුමකට පිළිතුරු දුන් ජ.වි.පෙ. ප්‍රචාරක ලේකම් විජිත හේරත් සහෝදරයා, ආණ්ඩුව අත්තනෝමතික ලෙස විධායක ජනාධිපති ධුරය ආරක්ෂා කිරීමට උත්සාහ දරන්නේනම් විධායක ජනාධිපති ක්‍රමයට එරෙහි සියලු සමාජ බලවේග ඒකරාශී කරගනිමින් ආණ්ඩුවේ එම උත්සාහය පරාජය කිරීමට ජ.වි.පෙ. නායකත්වය ගන්නා බව අවධාරණය කළේය. වසර එකහමාරක් යන්නටත් පෙර ආණ්ඩුව තමන් බලයට ගෙන ආ බලවේගවලට පිටුපෑමට කටයුතු කර ඇති බවත් මෙම ජනතා විරෝධී ගමන හේතුවෙන් ඔවුන් ඉතිහාසයේ ඉක්මණින්ම අප්‍රසාදයට ලක්වූ ආණ්ඩුව බවට පත්වී ඇති බවත් ඔහු වැඩිදුරටත් පැවසීය.

# රාජ්‍ය නාට්‍ය උළෙල සහ නාට්‍යකරුවන් හැල්ලු කිරීමට එරෙහිව විරෝධය පළකරමු!

## සමාජවාදී කලා සංගමය

**රාජ්‍ය නාට්‍ය උත්සව සංවිධානයේදී කලාකරුවන්ගේ අභිමානය කැළලක් සිදුකර ඇති බවත් සමස්ත කලකරුවන් වෙනුවෙන් ඊට අප්‍රසාදය පළ කරන බවත් සමාජවාදී කලා සංගමය පසුගිය 30වැනි දින නිවේදනයක් නිකුත් කරමින් පවසයි. දීපානි සිල්වා, ප්‍රේමරත්න තෙන්නකෝන්, චන්ද්‍රසෝම බිංදුහේවා යන සහෝදර සහෝදරියන්ගේ අත්සනින් නිකුත් කර ඇති නිවේදනය සම්පූර්ණයෙන් මෙසේය.**

නිදහසින් පසු වරින් වර බලයට පත් වූ සෑම රජයක්ම නාට්‍යකරුවන්ගේ උන්නතිය වෙනුවෙන් කටයුතු කරන බව පැවසුවද මෙතෙක් දුන් පොරොන්දු ඉටුකිරීමට කටයුතු කර නොමැත. කෙසේ වුවද ලාංකේය වේදිකා නාට්‍ය කලාවේ නියැලෙන නාට්‍යකරුවන් වෙනුවෙන් සම්මාන හා ඇගයීම් උළෙලක් දශක හයකට වැඩි කාලයක් අඩුපාඩු සහිතව වුව පූර්ණ රාජ්‍ය අනුග්‍රහය යටතේ පවත්වන ලදී.

ඉතා අවම දුෂ්කරතා හා පහසුකම් යටතේ නාට්‍යකරුවන්ගේ කැපකිරීම් හා උත්සාහයන් මත මෙතෙක් නාට්‍ය කලාව මේ මට්ටමින් හෝ පවතින අතර රාජ්‍ය මැදිහත්වීමක් දක්නට ලැබුණේ වාර්ෂිකව පවත්වන රාජ්‍ය නාට්‍ය උළෙල මගින් පමණි. පසුගිය කාල පරිච්ඡේදයේ නාට්‍ය කලාවේ සියලු අර්බුදයන්ට වගකිව යුතු ආණ්ඩු බලය හෙබ වූ පක්ෂ දෙකම එකතුවී වර්තමාන යහපාලන ආණ්ඩුව ගොඩනගා තිබේ.

වත්මන් ආණ්ඩුව ආරම්භයේදීම සංස්කෘතික හා කලා ක්ෂේත්‍රයට අදාලව වගකීම් හා විෂයන් බෙදා වෙන් කිරීමේදීම අර්බුද ගණනාවක් නිර්මාණය කරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස සාහිත්‍යය, කලා, නාට්‍ය ඇතුළු සියලු ක්ෂේත්‍රවලට අදාළව වගකිවයුත්තන් කිසිවෙකු නොමැති හෙයින් කලාකරුවන් තවත් අර්බුද ගණනාවකට ඇදදමා තිබේ. එහිම ප්‍රතිඵලයක් ලෙස මෙවර රාජ්‍ය නාට්‍ය උළෙල නිලධාරීන්, අමාත්‍යංශ සහ අනුමණ්ඩල අතර කඹ ඇදිල්ලක් බවට පත්ව තිබේ.

2016 මාර්තු මාසයේ පැවැත්විය යුතුව තිබූ රාජ්‍ය නාට්‍ය සම්මාන උළෙල පවත්වාගත නොහැකිව මාස 04කට වැඩිකාලයක් ප්‍රමාද කර අවසානයේ නාට්‍යකරුවන්ගේ අභිමානය නොසලකා හරිමින් ජූලි මස 01 වැනි දින බස්නාහිර පළාත් සෞන්දර්ය නිකේතනයේ පැවැත්වීමට කටයුතු කරමින් තිබේ. නාට්‍යකරුවන්ට ලබාදිය යුතු නිසි ඇගයීම ලබානොදී ඔවුන් හැල්ලු කිරීමට කටයුතු කිරීම පිළිබඳව සමාජවාදී කලා සංගමය ලෙස අපි ලාංකේය වේදිකාව නියෝජනය කරන සමස්ත නාට්‍යකරුවන් වෙනුවෙන් වර්තමාන ආණ්ඩුවට දැඩි අප්‍රසාදය පළකර සිටිමු.

## උඩින් මෙගා...

07 පිටුවෙන්

**ජනතාවට පදිංචියට නුසුදුසු යැයි තහවුරු කළ ප්‍රදේශයන්හිය. එනිසා මෙම වතු ජනයාගේ මළ අපද්‍රව්‍ය ඉවත් කිරීම සඳහා විධිමත් ක්‍රමයක් සකස් කිරීමට නගර සභාවට නොහැකිව තිබේ. එබැවින් බොහෝ ස්ථායන්හි ඒවා ජලය බැස යන කාණු පද්ධතියට එකතු වීම සිදුවේ. අනෙක් පැත්තෙන් තවත් ගැටලුවක් මතුව එන්නේ වර්ෂා කාලවලදී මෙබඳු වතුවල එකතු වන වැහි වතුරද මළ නාලිකා පද්ධතියට එකතු කිරීමට එම වැසියන් කටයුතු කිරීමයි. එනිසා එම වැසි වතුර සමග එන අපද්‍රව්‍ය හේතුවෙන් මළ නාලිකා පද්ධතියේ අවහිරතා ඇතිවේ.**

රටේ තුළ සිදුවන අනෙක් කාරණා මෙන්ම නගර සභාවේ ක්‍රියාවලියටත් සෘජුවම දේශපාලන අධිකාරීත්වය බලපාන අතර සේවය නිසි ලෙස අවංකව සිදු කරන නිලධාරීන් නොමැති වීමද මළ නාලිකා පද්ධතියේ නඩත්තුව හා ගැට ගැසී ඇත. සාමාන්‍යයෙන් අපේ රටේ පාලකයන් කටයුතු කරනු ලබන්නේ 'යටින් හපේ වුවත් උඩින් ඔපේ' ඇති කිරීමයි. පැවති රාජපක්ෂ පාලන කාලයේදී වුවද කටයුතු කරනු ලැබුවේ නගර අලංකාරයයි පවසමින් මතුපිට ඔපය පමණි. වත්මන් එ.ජා.ප. ශ්‍රී.ල.නි.ප. ආණ්ඩුවද 'මෙගා පොලිස්' (මහා නගර) ගෙන එමින් සැරසෙනු ලබන්නේ උඩින් ඔපයටම පමණි. එහි සැකයක් නැත.

බ්‍රිතාන්‍යයන් තමන්ගේ ආර්ථික ක්‍රියාවලිය ශක්තිමත් කර ගැනීම සඳහා මෙරට දුම්රිය මාර්ග, මහා මාර්ග ආදී යටතල පහසුකම් දියුණු කරන ලදී. කොළඹ නගරය ඔවුන්ගේ යටතේ කිසියම් සංවර්ධනයක් ලබා ගනු ලබන්නේද එම ආර්ථික ඉලක්කයන්ට අදාළ යටිතල පහසුකම් සාක්ෂාත් කර ගැනීමේ ක්‍රියාවලියේ ප්‍රතිඵල ලෙසය.

එහෙත් කණගාටුදායක කරුණ වන්නේ, බ්‍රිතාන්‍යයන් දුන් නිදහසින් පසු අපේ රට පාලනය කළ ප්‍රධාන ධනපති දේශපාලන පක්ෂ දෙකටම සුද්දාගේ මළ නාලිකා පද්ධතිය වත් අද වන තෙක් නිසි ලෙස වැඩිදියුණු කර ගත නොහැකි වීමයි.

නියමුවා
ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත
464/20. පන්නිපිටිය පාර පැලවත්ත. බත්තරමුල්ල දුර. 0112-785612 Email: niyamuwanews@gmail.com

# වැට් බදු විරෝධය හා ආණ්ඩුව

වත්මන් එජාප - ශ්‍රීලනිප හවුල් ආණ්ඩුව පසුගිය මැයි මස සිට ක්‍රියාත්මක කරමින් සිටින අසාධාරණ වැට් බදු බරට එරෙහිව ජනතා විරෝධය දිනපතා වැඩි වෙමින් තිබේ. පසුගිය ජුනි 03දා ජ.වි.පෙ. කොළඹ කොටුවේදී වැට් විරෝධී දැවැන්ත උද්ඝෝෂණයක් ආරම්භ කළ අතර රට පුරා සම්මන්ත්‍රණ මාලාවක්ද ආරම්භ කළේය. විවිධ ජන කණ්ඩායම්ද වැට් බදු විරෝධී සටනට එක්ව සිටින අතර ඊට අලුතින්ම එක්වූයේ රටේ ප්‍රධාන නගරවල කඩ සාප්පු හිමියන්ය. පසුගියදා ගාල්ල නගරයේ සියලුම කඩ සාප්පු වසා දමා පාරට බැස, ගාල්ල නගරයේ වෙළඳසැල් හිමියන් ආරම්භ කළ වැට් බදු විරෝධී සටන පසුව ගම්පහ, මාතර ආදී ප්‍රධාන නගර හරහා රට පුරා පැතිර යන්නට විය.

පසුගිය ඉතිහාසය පුරාම විවිධ ආණ්ඩු යටතේ මෙරට ජනතාවත් වෙළඳ ව්‍යාපාරිකයෝත් විවිධ වර්ගයේ බදු ආණ්ඩුවට ගෙවූහ. ඒ අතර බදු පැහැර හරින්නන්ද සිටි බව රහසක් නොවේ. මහා පරිමාණ ජාවාරම්කරුවෝ ආණ්ඩුවල පිහිටෙන්ම බදු නොගෙවා සිටි අතර බහුජාතික සමාගම් ඇතුළු මහා පරිමාණ ව්‍යාපාරිකයන්ට හැම ආණ්ඩුවක්ම අසීමිත බදු සහනද දුන්නේය. ඒ, ජනතාව මත හා කුඩා ව්‍යාපාරිකයන් මත බදු බර පටවමිනි. එම කරුණු කෙසේ වෙතත් වත්මන් ආණ්ඩුව දැන් පනවා තිබෙන 15% වැට් බද්ද කිසිසේත් සාධාරණ නැත. එය වෙනස් කළ යුතුය. ජනතාවට දැරිය නොහැකි බරක් වූ වැට් බද්ද සංශෝධනය කොට ජනතාවට සහන දෙනවා වෙනුවට, ජනතා හඬට ඇහුම්කන් දෙනවා වෙනුවට ආණ්ඩුව කරමින් සිටින්නේ වෙනත් දෙයකි.

බදුබර වැඩිවීමට හේතුව රාජපක්ෂ පාලනය අසීමිතව ණය ගැනීම බව පවසා ජනතාවට තිත්ත බෙහෙත් බීමට සූදානම් වෙන්නැයි පැවසූ ආණ්ඩුව එක් අතකින් නැවත කෝටි ගණන් ණය ගන්නා අතරම අනෙක් අතින් මහජන මුදල් නාස්ති කිරීමද කරයි. වැට් බදු මගින් ජනතාවගේ සාක්කුවට පොකට් ගසන ආණ්ඩුව එම මුදල් නාස්ති කරමින් ලොක්කන්ට වාහන ගෙන්වීමට කෝටි ගණන් නාස්ති කරයි. මෙසේ වාහන සඳහා වෙන්කරගත් මුදල අගමැතිවරයාට රුඃ කෝටි 60ක් සහ ඇමතිවරුන්ට කෝටි 118කි. එය කිසිසේත් සාධාරණ නොවේ.

මෙලෙස ජනතාවට බර පටවා මුදල් නාස්තිකරන ආණ්ඩුව බදු බරට එරෙහි ජනතාවගේ උද්ඝෝෂණයට කන් දෙනවා වෙනුවට, ඔවුනට සහන සලසනවා වෙනුවට එය මර්දනය කිරීමට, බිය වැද්දීමට හා ජනතාව නොමඟ යැවීමට කටයුතු කරමින් සිටී. වෙළඳ ව්‍යාපාරිකයන් විසින් කඩ සාප්පු වසාදමා පළ කළ විරෝධයත් සමග ආණ්ඩුව දැනුවත්ව ඒ පිළිබඳ වැරදි මතයක් හැදීමටත් බිය වැද්දීමටත් උත්සාහ කරන බව පෙනෙන්නට තිබේ. උද්ඝෝෂණවලින් පසු පුවත්පත් කිහිපයකම පළකොට තිබූ ප්‍රවෘත්තිය මීට නිදසුන්ය. එක් පුවත්පතක පළකර තිබූ ප්‍රවෘත්තිය වූයේ කඩ සාප්පු වසනු ලැබූයේ කඩ වසන ලෙස දන්වා තුණ්ඩු බෙදීමෙන් බවය. තවත් පුවත්පතක පළවූයේ වෙළඳසැල් වැසීම පිළිබඳ වාර්තාවක් රහස් පොලිසිය විසින් ජනාධිපතිට හා අගමැතිට බාරදෙන බවය. මෙම ප්‍රවෘත්තිවල අරමුණ ඉතා පැහැදිලිය. ආණ්ඩුවේ සූදානම ජනතා හඬට කන්දීම නොව එම හඬ බියවද්දා යටපත් කිරීමය. මෙම ප්‍රජාතනත්‍ර විරෝධී ප්‍රවේශය වහාම පරාජය කළ යුතුය.

මෝඩයාට සඳ පෙන්වූවිට ඔහු ඒ දෙස නොබලා ඇඟිල්ල දෙස බලන්නේයයි කියමනක් තිබේ. ආණ්ඩුවට බදු බර පෙන්වූ විට ඒ දෙස නොබලා රහස් පොලිස් වාර්තා සොයන්නේ මෝඩකම නිසා නොව කපටිකම නිසාය; දුෂ්ටකම නිසාය. නැග එන ජනතා විරෝධයට මුහුණ දීමට අසමත් ආණ්ඩුව ඒ සඳහා ප්‍රජාතන්ත්‍ර විරෝධී ක්‍රමවල පිහිට පැතීම වහාම නැවැත්විය යුතුය. එබැවින් වත්මන් මෛත්‍රී-රනිල් හවුල් ආණ්ඩුව ජනතාව මත පටවා ඇති අසාධාරණ බදුබර පැරදවීම සඳහා මෙන්ම ආණ්ඩුවේ ජනතා විරෝධී හා මර්දනකාරී භාවිතය පැරදවීම සඳහාද සියලු ප්‍රගතිශීලී හා ප්‍රජාතන්ත්‍රවාදී බලවේග එක්ව අත්වැල් බැඳගත යුතුය.

# ජනතාවට COPE කමිටුවේ කටයුතුවලට සම්බන්ධ වෙන්න ඉඩ හදන්න ඕනැ



ජ.වි.පෙ. දේශපාලන මණ්ඩල සභික, පාර්ලිමේන්තු මන්ත්‍රී **සුනිල් හඳුන්නෙත්ති සහෝදරයා**

***නියමුවාඃ- ඔබ පාර්ලිමේන්තුවේ පොදු ව්‍යාපාර කාරක සභාව හෙවත් COPE කමිටුවේ වත්මන් සභාපතිවරයායි. කෝප් කමිටුවේ මතභේද ඇතැයි මාධ්‍ය වාර්තා කර තිබුණා. ඒ ඇයි?***

***සුනිල් හඳුන්නෙත්ති සහෝදරයාඃ-*** මතභේද නැහැ. නමුත් මේ ආණ්ඩුව තමන් මූණදී තියෙන දේශපාලන අර්බුදයන් සමහර ඔවුන්ගේ ක්‍රියාකාරිත්වයන්ගේ ගැටලු විසඳගන්න කෝප් කමිටුව පාවිච්චි කරන්න උත්සාහ කරමින් ඉන්නවා. ඒක තමයි විශේෂයෙන්ම මහ බැංකු අධිපතිවරයාගේ සිදුවීම මගින් දැක්කේ. මොකද මහ බැංකු අධිපතිවරයාගේ සේවා කාලය තවදුරටත් දීර්ඝ කරනවාද නැද්ද කියල තීරණය කරන්න තියෙන්නේ කොප් කමිටුවට නොවේ. ඒක මේ රටේ ජනාධිපතිවරයා ගන්න ඕන තීරණයක්. මුදල් පනත අනුවත් ඔහුගේ බලතල අනුවත් එය කළ යුත්තේ ජනාධිපතිවරයායි. නමුත් රනිල් වික්‍රමසිංහ සහ මෛත්‍රීපාල සන්ධානයේ අර්බුදය නිසා ඒක දෙන්නම පටවන්න උත්සාහ කළේ පොදු ව්‍යාපාර කාරක සභාවේ පැත්තට.

ඇත්තටම ඒකත් එක්ක මතුවුණු බැඳුම්කර ගනුදෙනුව සම්බන්ධයෙන් තීන්දු තීරණ ගැනීමේදී ආණ්ඩු පක්ෂය හා විපක්ෂය හැටියටත් මධ්‍යස්ථ කණ්ඩායම හැටියටත් බෙදීමක් තියෙන බවත් එවැනි බෙදීම් ඇතිවෙලා මේක විසඳගන්න බැරිවුනොත් මම ඉල්ලා අස්වෙනවා කියලත් සමහර මාධ්‍ය පළ කර තිබුණා. ඒක ඉතාම පැහැදිලිව මාධ්‍යවල හිතලුවක් විතරයි. මොකද හේතුව එහෙම ඉල්ලා අස්වෙලා වගකීමක් ඉටුකරන්න බැරි මට්ටමේ අර්බුදයක් අපට නැහැ. අපි කාගෙවත් අතකොලු බවට පත්වෙලාවත් කාටවත් ඕන දේශපාලන න්‍යාය පත්‍රයකට අනුවවත් ඒ කාරක සභාවේ කටයුතු කරන්නේ නැහැ. ඉතා පැහැදිලි ලෙසම අපේ ස්වාධීනත්වය ආරක්ෂාකර ගනිමින් රටේ ජනතාවගේ බදු මුදල් වංචාකර තියෙන හොරුන් කවුද කියන එක හෙළිදරව් කිරීමත් ඔවුන්ට අදාළව ගතහැකි උපරිම පියවර ගැනීමට කටයුතු කිරීමට තමයි අපි පාර්ලිමේන්තු ගියේ. ජනතාවගේ මුදල් ආරක්ෂා කරදීම වෙනුවෙන් ජනතාව අපෙන් බලාපොරොත්තු වන සේවය ඉෂ්ට කරදීම වෙනුවෙන් අපිට ඒ වගකීම දරන්න පුළුවන් උපරිම කාලයක් ස්වාධීනව නිවැරැදිව අපේ දැනුම පාවිච්චි කරල හැකියාවන් පාවිච්චි කරලා ඒ කටයුත්ත කරනවා.

මහ බැංකු අධිපතිවරයාගේ සිදුවීමේදී ආණ්ඩු පක්ෂයේ සංවිධායකවරයා කියන්නේ අපිට මේ කටයුත්ත කරන්න හැකියාවක් නැහැ; නීතිමය බාධාවල් තියෙනවා කියන එක. ඔවුන්ට ඕනෙ අපිව මෙතනින් අයින් කරලා ඔවුන්ගේ මහ බැංකු අධිපතිවරයා බේරගන්න. එතකොට විපක්ෂයෙන් රාජපක්ෂ කල්ලියෙන් චෝදනා කරනවා අපි මහ බැංකු අධිපතිවරයා ගලවා ගන්න කටයුතු කරනවා කියලා. අනෙක් අතට ආණ්ඩුව කියනවා අපි ඒක කරන්නේ නැහැ කියලා. මේ වගේ විකාර තත්වයක් තමා එතන තිබුණේ. අපේ ස්වාධීනත්වය ආරක්ෂා කරගෙන දේශපාලන වශයෙන් අපිට කළ හැකි කටයුතු පුළුවන් උපරිම කාලයක් අපි කරනවා. ඒ ගැන අපිට බාධාවක් නැහැ.

***නියමුවාඃ- මෑත ඉතිහාසය තුළ මහත් ආන්දෝලනයට තුඩු දුන් COPE පරීක්ෂණය වූයේ අර්ජුන් මහේන්ද්‍රන් මහ බැංකු අධිපතිවරයාගේ බැඳුම්කර ගනුදෙනු පිළිබඳ පරීක්ෂණයයි. මෙහි COPE භූමිකාව පිළිබඳව කීවොත්.***

***සුනිල් හඳුන්නෙත්ති සහෝදරයාඃ-*** මෙහි කෝප් භූමිකාව ගැන කීවොත් ඇත්තටම මීට කලින් පාර්ලිමේන්තුවෙත් සාකච්ඡා වෙලා නතර වුණ ප්‍රශ්නයක්. ඒ පාර්ලිමේන්තුවට පුළුවන්කමක් තිබුණේ නැහැ, එවකට කෝප් කමිටුවට නිසි ක්‍රමවේදයක් පාවිච්චි කරලා විභාගයක් කරල පාර්ලිමේන්තුවට වාර්තාවක් ඉදිරිපත් කරල අදාල වංචා දූෂණයන්ට සම්බන්ධ අයට විශේෂයෙන් මහ බැංකු බැඳුම්කර ගනුදෙනුවේදී වංචා දූෂණයන්ට සම්බන්ධ අදාළ අයට පියවර ගන්න.

අපි මෙවර සිද්ධකරමින් උත්සාහ කරමින් ඉන්නේ කාගෙවත් වුවමනාවකට අර්ජුන මහේන්ද්‍රන් අධිපතිවරයා තියාග න්න හෝ ගෙදර යවන්න නොමෙයි. ඉතා පැහැදිලි ලෙස විගණකාධිපතිවරයාත් සම්බන්ධකරගෙන විගණකාධිපතිවරයාගේ බලතල යටතේ ස්වාධීන පරීක්ෂණයක් කරන එක. ඒ ස්වාධීන පරීක්ෂණය මේ වන විටත් අපි කරමින් ඉන්නවා. ඒක නිසා තමයි බැඳුම්කර ගණුදෙනුව ගැන පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන විශාලම වාර්තාව පිටු 1251ක සියලු ලිපි ලේඛන අඩංගු වාර්තාවක් පසුගියදා කථානායකවරයාට ඉදිරිපත් කිරීමට හැකිවුණේ. ඒ පිළිබඳ පරීක්ෂණ කටයුතු ආරම්භ කරලා තියෙන්නේ. විගණකාධිපතිවරයාගේ ලේඛන පදනම් කර ගෙන තවත් කටයුතුත් එක්කර ගනිමින් මේ පරීක්ෂණය සිදුකරනවා.

එහිදී විශේෂයෙන්ම මේ සිද්ධිය සම්බන්ධයෙන් කීවොත් රජයේ මුදල් පාවිච්චි කරලම භාණ්ඩාගාරය මහ බැංකුවට ණයට දෙන ක්‍රමයක් හරහා රාජ්‍ය අරමුදල් මංකොල්ලකෑමක් තමයි මෙතන සිද්ධවෙන්නේ. දැන් බැඳුම්කරයක් කියල කියන්නේ මහ බැංකුව ජනතාවගෙන් නැත්නම් රජයේ අරමුදල්වලින් දිගුකාලීන ණය ලබාගන්නා ක්‍රමයක්. අවුරුදු 30කට බැඳුම්කර නිකුත් කළහොත් සාමාන්‍ය පුද්ගලයෙකුට ඒ වෙනුවෙන් මුදල් සම්පාදනය කර ගන්න 15 වැනි පිටුවට



## YES WE CAN



# විශ්වාස කරන්න! අපිට එක්ව පියාඹිය හැකියි.

සහෝදරත්වය බොඳ කර, ජාතිවාදයේ සළුපිළි පොරවා ශාන්තිවාදී වදන් තෙපලන ව්‍යාජ බලලෝභී කණ්ඩායම් ජාතික සමගිය පිළිබඳ බලාපොරොත්තු බොඳකිරීමට උත්සාහ ගනිති.

ජාතික ගැටලුව ගැන විමසද්දී බොහෝ අය පවසනුයේ එවැනි ප්‍රශ්නයක් අද නොමැති බවයි. 2009 මැයි මාසයේ යුද්ධය නිමාවීමෙන් ජාතික ප්‍රශ්නය නිමා වී ඇති බව ඔවුන්ගේ අදහසයි. නමුත් ජාතික ප්‍රශ්නය සමාජය තුළ තවදුරටත් නොවිසඳී පවතී. ජාතික ප්‍රශ්නය තරම් ව්‍යාකූල කරන ලද තවත් ගැටලුවක් ලාංකේය සමාජය තුළ නොමැති තරම්ය. ජාතික සමගිය ගොඩනැගීම සඳහා කටයුතු කළ යුතු මේ අවධිය තුළ දේශපාලන සංවිධානත්, පුද්ගලයන් හා පුද්ගල කණ්ඩායමුත්, විවිධ සමාජ සංවිධානත් තම තමන්ගේ වුමනාවන් වෙනුවෙන් ජාතික ප්‍රශ්නය විග්‍රහ කර ගනිමින් සහ යොදා ගනිමින් සිටී. ඔවුන් පිළිබඳවත්, ඔවුන්ගේ අවශ්‍යතා පිළිබඳවත් සියුම්ව විග්‍රහ කරගත යුතු වුවත් එය පසුවට තබා මේ පිළබඳ විවිධ අය දක්වන අදහස් කීපයක් විමසා බැලීම වැදගත්ය.

මේ ගැන දක්වන මත අනුව සමාජය තුළ කණ්ඩායම් කීපයක් දැකගත හැකිය. එක් කණ්ඩායමකගේ අදහස වනුයේ මහ ජාතිය වූ සිංහලයන්ගේ පීඩනය අනෙක් ජන කොටස් මත එල්ලවීමෙන් ජාතික ප්‍රශ්නය ගොඩනැගී ඇති බවයි. එයට විරුද්ධව මත පළකරන්නන්ගේ අදහස වනුයේ දෙමළ මුස්ලිම් ජාතිකත්වයන්ගේ අසාධාරණ ඉල්ලීම නිසා ජාතික ප්‍රශ්නය ගොඩනැගී ඇති බවයි.

මේ කිසිවෙක් ජාතික ප්‍රශ්නය මූලයෙන් අල්ලා විග්‍රහ කරගෙන නැත. ඔවුන් තමන්ගේ ජාතිවාදී අරමුණු ඉටුකරගැනීමටත්, ඒ හරහා තම පැවැත්ම තබාගැනීමත් වෙනුවෙන් එම විග්‍රහයන් යොදා ගනිමින් සටිති. මෙම මතවාදයන්ගේ සත්‍යාසත්‍යභාවය විශ්ලේෂණය කරගත යුතුව ඇත. අප මුලින්ම විග්‍රහ කරගත යුත්තේ ජාතිවාදයට ගොදුරු වන්නේ කවුරුන්ද කියාය. සමාජය තුළ නිෂ්පාදනයේ වැඩි පංගුව භුක්තිවිඳිනු ලබන්නේ පාලක සුළුතරයකි. ඔවුන්ගේ පීඩනයට පොදු මහත් දුගී දුප්පත් ජනතාව ගොදුරු වී තිබේ. ජාතිවාදී ගැටුම්වලටත්, යුද්ධයටත් මැදිහත් වී ජීවිත, දේපළ, අහිමි වූයේද ඔවුන්ගේය.

යුරෝපීය ආක්‍රමණයන්ගෙන් පසුව පාලනය සඳහා ජනතාව බෙදා වෙන්කර පාලනය කිරීමේ ක්‍රමවේදය ආරම්භ විය. එසේ කලේ අධිරාජ්‍යවාදීන්ට විරුද්ධව පොදු ජනතාව නැගී සිටීම වැළැක්වීමේ අරමුණෙන්ය. ඔවුන් දේශීය පාලකයන් වෙත බලය ලබා දීමෙන් පසුවද ඔවුන්ගේ ක්‍රියාමාර්ගය වූයේ ද තම අසාර්ථක පාලන යන්ත්‍රණයට විරුද්ධව පොදු ජනතාව නැගී සිටීම වැළැක්වීම සඳහා ජාතිවාදය භාවිතයට ගැනීමයි. පාලක පංතියට ජනතා අයිතිවාසිකම් ලබාදීමට ඇති නොහැකියාව වසාගත්තේ මෙසේ ජාතිවාදය වැපිරීමෙනි. දෙමළ, මුස්ලිම් ව්‍යාපාරිකයින්ගේ ව්‍යාපාර බිඳවැටීමට හේතුව සිංහල ව්‍යාපාරිකයන් බවත් සිංහල ව්‍යාපාරිකයන්ගේ ව්‍යාපාර බිඳවැටීමට හේතුව දෙමළ මුස්ලිම් ව්‍යාපාරිකයන් බවත් ප්‍රචාරය කෙරිණ. එවැනි විවිධාකාර විෂකුරු මතවාද පීඩිත ජන මනස් තුළට රිංගවන ලදී.

බොහෝ දෙනා විග්‍රහයකින් තොරවම ඒවා වැළඳගත්හ. එමගින් ජාතිකත්වයන් අතර විශ්වාසය, අන්‍යෝන්‍ය ගෞරවය, සමගිය බිඳවැටිණි. ඒ අතර ඇමරිකානු හා ඉන්දීය අධිරාජ්‍යවාදීන්ගේ කලාපීය වුවමනාවන් සඳහාද මෙම ජාතිවාදී ප්‍රවනතාවයන් යොදාගැනීමේ වටපිටාවක් නිර්මාණය විය. මේ සියල්ලේ අවසන් ප්‍රතිඵලය වූයේ ක්‍රම ක්‍රමයෙන් වර්ධනය වූ ජාතිවාදී බලවේගයන්ය. අවසන එය දැවැන්ත යුද්ධයක් බවටද පත්විය.

බැලූ බැල්මට දෙමළ මුස්ලිම් සිංහල ධනපති පාලකයන් හා කණ්ඩායම් ජාතිවාදී මරඋගුල පීඩිත ජන කොටස් මත පටවූහ. එසේ ඔවුන් පෝරකයට තල්ලු කර ඒ රුධිරය මතින් තමන්ගේ පණනල රැක ගැනීමට එම ජාතිවාදී නායකයන් හා කණ්ඩායම් කටයුතු කළහ. මේ අන්දමට තම ධනපති පාලනය රැක ගැනීමට ඔවුන් කටයුතු කළහ.


මේ කිසිවක් අවබෝධ නොවූ පීඩිත අපගේ සහෝදරත්වය ඔවුන්ගේ ගොදුරු බවට පත් නොවූයේ ද? ඇත්ත ජාතික සමගිය සහෝදරත්වය අවශ්‍ය කාටද ? ජාතිවාදී මතවාද පතුරන්නන්ගේ ස්වභාවය කෙබඳුද? ජාතික සමගිය සහෝදරත්වය නොදී ඉන්නේ කවුරුන්ද? එය ලබා ගැනීමට පෙළ ගැසිය යුත්තේ කවුරුන් ද ? කෙසේද? යන්න පුළුල් සාකච්ඡාවක් සමාජය තුළ මතු කළ යුතුව ඇත.

ජූලි 23 යනු ලාංකේය ඉතිහාසයේ අඳුරුතම දිනයකි. කළු පැල්ලමකි. එය ඉතිහාසයෙන් මකා දැමිය නොහැකිය. එහෙත් වර්තමානයටත් අනාගතයටත් ඉන් ලද හැකි පාඩම් අති විශාලය. යළි එවන් බේදවාචකයන් ඇති නොවීමට උගත හැකි පාඩම් බොහෝමය. සහෝදරත්වය, සමගිය පිරි සැබෑ මිනිස් සමාජයක් ගොඩනගාගැනීම වෙනුවෙන් කළයුතු කාර්යභාරය වටහාගත යුතුව තිබේ.

එම අධිෂ්ඨානය සහිතව මේ ජූලි 23 සහෝදරත්වයේ දිනය සැමරිය යුතු නොවේද ?

# ලෝකයටම ආදරය කළ ලොකයක්ම ආදරය කළ මිනිසා

"ජීවිතය කියන්නේ හරියට බොක්සින් තරගයක් වගෙයි. පරාජය තීරණය කරන්නේ ඔබ බිම වැටුණාම නොවෙයි නැගිටීම ප්‍රතික්ෂේප කළ විටදීයි", ඉහත ප්‍රකාශය එදා මෙදා තුර ලෝක බොක්සින් වළල්ලේ බිහි වූ විශිෂ්ඨ ක්‍රීඩකයෙකු වන මොහොමඩ් අලීගේය.



පසුගිය ජුනි මස 04 වන දින සදහටම මෙලොවින් සමු ගත්තද ඔහුගේ වසර 74 ක ජීවන ගමන් මගේ මතක සටහන් පෙළ ක්‍රීඩාවට ලැදි ලෝක ප්‍රජාවගේ හදවත්වලට පමණක් නොව සමස්ත ලෝක වාසීන්ගේම මතකයන් තුළ සදහටම තැන්පත් වි පවතී.

විසිවැනි සියවසේ ක්‍රීඩකයා ලෙසින් සම්මානයට පාත්‍ර වී ඉතිහාස ගතවූ අලි 1942 ඇමරිකාවේ දී කැෂියස් මාර්සලස් ක්ලේ යන නමින් උපත ලැබීය. 12 හැවරිදි වියේදී සිය බොක්සිං ක්‍රීඩා දිවිය ආරම්භ කළ ඔහු ඉන් වසර 06 කට පසුව එනම් 1960 වසරේදී රෝමයේ පැවැත් වූ ඔලිම්පික් තරඟාවලියේ ලයිට් හෙවිවේට් අංශයේ බොක්සිං රන් පදක්කම දිනා ගනිමින් පළමු වරට ලෝක අවධානය තමන් වෙතට දිනා ගැනීමට සමත් විය.

ඒ වන විටත් ඇමරිකාවේ කළු සුදු වර්ණභේද වාදය තදබල ලෙසම පැතිර පැවතිනි. එහි ගොදුරක් බවට පත්වීමට ඔහුට සිදුවිය. ඇමරිකාවට දිනාගෙන ආ ඔලිම්පික් රන් පදක්කම්ලාභියා ලෙස ඔහුගේ හැකියාවන් ඇගයීම පසෙක ලා දේශපාලඥයින් ,ජනමාධ්‍ය හා බළධාරීන් ඔහුගේ ප්‍රකාශ ඉස්මතු කරමින් කළු ජාතිකයන්ට වන තාඩන පීඩන වසා දැමීමට උත්සාහ කළ නිසාත්, අසාධාරණයටත් වර්ණ භේද වාදී පීඩනයටත් විරුද්ධව ඔහුගේ අභ්‍යන්තරයේ තිබූ ආවේගය හා විරෝධය විසිනුත් ඔහු දිනාගත් රන් පදක්කම, "සුද්දා ගේ ඉත්තෙක් හැටියට ගතකළ ඔලිම්පික් මධුසමය අදින් ඉවරයි, මම දැන් අලුත් මිනිසෙක්," යැයි පවසමින් ඔහියෝ ගඟට විසිකර දැමුවා පමණක් නොව එවකට ඇමරිකාවේ ක්‍රියාත්මක වූ නේෂන් ඔෆ් ස්ලාම් නම් මුස්ලිම් සංවිධානයට බැදුණු ඔහු "ක්ලැසියස් ක්ලේ" කියන්නේ වහල් නමක් යනුවෙන් පවසමින් සිය නම මොහොමඩ් අලි ලෙස වෙනස් කර ගැනිනි.

වර්ණභේදවාදයට එරෙහිව ගෙන ගිය සටනට මාටින් ලූතර් කිං සමඟ එක්වුණු ඔහු 1967 දී ඇමරිකාව විසින් සිදුකල වියට්නාම් ආක්‍රමණයටද දැඩිව විරුද්ධ විය.

ඔහු පැවසූයේ, මම සාමයට කැමතියි. මට සාමය ඕනෑ. මුළු ලෝකයටත් සාමය ඕනෑ. වියට් කොං හටයොත් එක්ක මට කිසි තරහක් නැහැ. එයාලා මට කවදාවත් කල්ලා කියලා සමච්චල් කලේ නැහැ. ඉතින් මම මොකටද එයාලට විරුද්ධව සටන් කරන්නේ. යුද්දෙට නොයන උන්ට උන් කියන්නේ දේශ ද්‍රෝහියෝ කියලා ඔව් මම දේශ ද්‍රෝහියෙක් තමයි. මම හමුදාවට බැදෙන්නේ නැහැ, යනුවෙනුයි.

මෙම කළු ජාතික ක්‍රීඩකයාගේ ක්‍රීඩා දිවිය එහෙම පිටින්ම උඩු යටිකුරු කල වියට්නාම් යුද්ධයට විරුද්ධත්වය පළ කිරීම අන්තිමේදී නිව් යෝර්ක් නුවර ශ්‍රේෂ්ඨාධිකරණය දක්වා ගියේය. ඔහුට විරුද්ධ නඩුව අවුරුදු 03 ක් පැවති අතර ඒ කාළය තුළ ඔහුට බොක්සිං ක්‍රීඩාව තහනම් විය. ඔහුගේ ජයග්‍රහණ සියල්ල අවලංගු කෙරිණි. එහෙත් කළු ජාතිකයන්ගේ විරයෙකු සේ නැගිසිටීමටත් සිය සටන්කාමී අදහස් මහජනතාව අතරට යැවීමටත් එය ඔහුට කදිම අවස්ථාවක් උදාකොට දුන්නේය. බොක්සිං වළල්ලේ දී මෙන්ම ඉන් පිටතදීත් දැඩි සටන්කාමියෙකු බවට පත්වූ අඩි 6කුත් අඟල් 3ක් උසැති මේ සද්දන්ත මිනිසාට වාසි දායක ලෙස නඩු තීන්දුව ප්‍රකාශයට පත්වීමෙන් පසු නැවතත් වසර 4කට පසු බොක්සිං වළල්ලට පිවිසි අලී තවත් දෙවතාවක්ම ලෝක හෙවිවේට් කිරුළ ජය ගත්තේය. ඔහු 1964 - 1974 සහ 1978 වසරවල ලෝක හෙවිවේට් ශූරයා බවට පත්විය. 1974 දී එවකට ලෝක හෙවිවේට් ශූරයා වූ ජෝර්ජ් ෆෝර්මන් අතර පැවති තරඟය 20 වැනි සියවසේ අනර්ඝතම ක්‍රීඩා තරඟය ලෙස සැලකේ. ඔහු 1964 සිට 1971 දක්වා පැවති තරඟවලින් නොකඩවාම ජයග්‍රහණ ලැබූ අතර එය අසිරිමත් වාර්තාවකි. 1981 ඔහු විශ්‍රාම ගන්නා විට ඔහුගේ අවසන් තරඟ වාර්තාව ලෙස තරඟ 61 කින් ලබා තිබුණේ පරාජයන් 5ක් පමණි. 37 වතාවක් හෙතෙම ප්‍රතිවාදියා බිම දමා නොකවුට් කොට තිබේ. සිය අවසන් වසර පුරා පාර්කින්සන් රෝගයෙන් පෙළී සිටි අලිට 1996 දී ඇට්ලන්ටා ඔලිම්පික් උළෙලේදී හා 2012 ලන්ඩන් ඔලිම්පික් උළෙලේදී ඔලිම්පික් ගිනිසිළුව දල්වීමටද අවස්ථාව උදාවියග ඔහුට අසාධාරණය හා අයුක්තිය හමුවේ නිහඬව සිටීමට නොහැකි විය. දුප්පත් පවුලක ඉපදී බොක්සිං ක්‍රීඩාවෙන් කෝටි ගණන් මුදල් ලැබුවත් ඒ සියල්ලටම වඩා සමාජ අසාධාරණය දකින්න ඔහුට පුළුවන්කම තිබුණි. සියල්ල මුදල් මත පදනම් වු වත්මන් ධනවාදී සමාජය තුළ අලිගේ ජීවිතයෙන් තරුණ අපට හැකි ගුණාංග හා ආදර්ශයන් ගණනාවක්ම පවතින බව අවිවාදිතය.

# දුරකථන මත පැන වූ අසාධාරණ බදුවලට එරෙහිව තරුණයෝ වීදි බසිති

දුරකථන මත පැන වූ අසාධාරණ බදු වහා ඉවත් කරන ලෙස ආණ්ඩුවට බල කරන විරෝධතා ව්‍යාපාරයක් සමාජවාදී තරුණ සංගමය විසින් ආරම්භ කරන ලදී. පසුගිය ජුනි 08 දින කොටුව දුම්රියපළ ඉදිරිපිටින් ආරම්භ කළ විරෝධතාවය දිවයිනේ ප්‍රධාන නගර රැසකදී පැවැත්විණි. මෙහි දී විරෝධතා බැනර් හා පෙත්සම් අත්සන් කෙරුණු අතර වීදි නාට්‍යය සංදර්ශන ද පවත්වනු ලැබිණි.





## බවුන් වඩා නොව...

බොල් පින්නටත්
ගොබ අදින
නවමු බිජු වෙමු අප..
ඉකිලන හෙටට
කුස දාහය නිවන....
එරමිණි ගොතා
බවුන් වඩන වුන් නොව;
මහා පර්වත වුව අස්වද්දන
වීර්ය හිමි අප..
බිඳ දමන්නෙමු ධනපති කෙළෙස්..
මෙලොව හිමි දුක් ශිඛර;
මලිනුපුටා දමන්නෙමු..
දුකට හේතුව
උන්ගේ තෘෂ්ණාව
හැඳින්නෙමු..
බවුන් මෙත් වඩා නොව..
විසෙන් විස නසා මිස...



# විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරයිද?



වත්මන් මෛත්‍රී-රනිල් හවුල් ආණ්ඩුව ලංකාවට නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් නිර්මාණය කිරීමට ලහිලහියේ කටයුතු කරමින් සිටී. මෙම හවුල් ආණ්ඩුව බලයට ආවේ රට තුළ ප්‍රජාතන්ත්‍රවාදය හා යහපාලනය තහවුරු කිරීමේ ප්‍රධාන පොරොන්දුව මතය. නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් නිර්මාණය කිරීම සඳහා තර්කය මතුවූයේද ඉහත කරුණු ඉටුකිරීම සඳහාය. එහිදී වත්මන් විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීම, නව ඡන්ද ක්‍රමයක් ඇතිකිරීම, පාලනයේ විනිවිදභාවය තහවුරු කිරීම, සියලු පුරවැසියන්ගේ සමාන අයිතීන් හා මානව හිමිකම් තහවුරු කිරීම නව ව්‍යවස්ථාවේ ප්‍රමුඛ කාර්යයන් විය. එහෙත් දැන් ඊට කණ කොකා ඇඬීමට පටන්ගෙන තිබේ.

ලංකාව මුහුණපා සිටින වත්මන් සමාජ ආර්ථික හා දේශපාලන අර්බුදයන්ට නව ව්‍යවස්ථාවෙන් විසඳුම් ලැබේ යයි අපි නොසිතමු. මන්ද යෝජිත ව්‍යවස්ථාව ඉතාම ප්‍රජාතන්ත්‍රවාදී එකක් වුවත් එය ධනපති ව්‍යවස්ථාවක් වන නිසාය. ලංකාව මුහුණ දී සිටින සියලුම ගැටලුවලට ස්ථිරසාර විසඳුම ඇත්තේ නව සමාජවාදී ව්‍යවස්ථාවක් තුළය. එහෙත් ඒ කෙසේ වෙතත් වත්මන් ව්‍යවස්ථාවේ පවතින ප්‍රජාතන්ත්‍ර විරෝධී ස්වභාවය තරමක් හෝ අඩුකොට ප්‍රජාතන්ත්‍රවාදය දෙසට කිසියම් ඉදිරි පියවරක් තබන්නේ නම් එයට විරුද්ධ වීමට කිසිවෙකුට නොහැක. එහෙත් දැන් කෙරෙන කතාබහට අනුව නව ව්‍යවස්ථාවද පාලක කණ්ඩායමේ කැමැත්ත වීමේ ගැටලුව මතුව තිබේ.

පසුගියදා පළවූ ප්‍රවෘත්තියකින් කියවුණේ විධායක ජනාධිපති ධුරය අහෝසි නොකොට එය තවදුරටත් තබාගත යුතු යැයි ශ්‍රීල.නි.ප. ඉහළ මණ්ඩලයක් තීරණය කළ බවය. එය පවසා තිබුණේ අමාත්‍ය ඩිලාන් පෙරේරාය. පසුගිය ජනාධිපතිවරණයේදී මෙන්ම මහ මැතිවරණයේදීද ඩිලාන්ලා නිමල් සිරිපාලලා සිටියේ විධායක ජනාධිපති ධුරය අහෝසි කිරීමට පොරොන්දු වූ මෛත්‍රීගේ පිලේ නොව රාජපක්ෂලා දිනවන පිලේය. එහෙත් රාජපක්ෂවරුන්ගේ පරාජයෙන් පසු ඔවුහු ආණ්ඩුවට එකතු වූහ. ඩිලාන් පෙරේරලා කෙසේ වෙතත් ශ්‍රීල.නි.ප. සභාපති හා වත්මන් ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා පොදු අපේක්ෂකයා ලෙස ජනාධිපතිවරණයට ඉදිරිපත් වූයේම විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීමටය. මුළු මැතිවරණ ව්‍යාපාරය පුරාම විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරන බව ඔහු පුන පුනා පැවසුවේය. ජයග්‍රහණයෙන් පසු ජනාධිපති ලෙස දිවුරුම් දෙන අවස්ථාවේද පැවසුවේ පළමු වාරය අවසන් වීමට පෙර විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරන බවය. එහෙත් දැන් තනුව හා සින්දුව මාරුකර තිබේ. ඒ අතර චම්පික රණවක ඇමතිවරයාද පවසා තිබුණේ විධායක ජනාධිපති ක්‍රමය අහෝසි නොකළ යුතු බවය. අලුත් තනුවට අත්වැල් ගායනය ඔහුගෙන්ය.

මේ සිදුවෙමින් තිබෙන්නේ කුමක්ද? බලය වෙනුවෙන් පොරොන්දු කැඩීමට සූදානම් වීමය. පන්ති සහිත සමාජයක බලය අත්පත් කරගත්තවුන් එම බලය තව තවත් ශක්තිමත් කර ගන්නවා මිස බලය අත්හැරීමේ අත්දැකීම් ඉතිහාසය තුළ නැත. මෛත්‍රීපාල ජනාධිපතිවරයා මේ සූදානම් වන්නේද එයටය. බලය අත්හැරීමට පොරොන්දු වී බලය ගත්තද දැන් එය අත්හැරීමට ඔහු සූදානම් නැති බව පෙනේ. විධායක ජනාධිපති ක්‍රමය තවදුරටත් තබා ගැනීම සඳහා අවශ්‍ය මානසික පසුබිම සකස් කිරීම දැන් සිටම අරඹා ඇත්තේ ඒ අනුවය.

විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීමේ පොරොන්දුවෙන් මඟහැර යන, එය තවදුරටත් තබා ගැනීමට පිඹුරුපත් සකස්කරන ජනාධිපතිවරයා හා ඔහුගේ කණ්ඩායම ඡන්ද ක්‍රමය වෙනස් කිරීමට දක්වන්නේ පුදුම හදිසියකි. ඔවුනට අනුව ජනාධිපතිවරණයේ ප්‍රධාන පොරොන්දුව ඡන්ද ක්‍රමය වෙනස් කිරීමය. විධායක ජනාධිපති ක්‍රමය වෙනස්කිරීම නොවේ. කන්න ඕනෑ වූ විට කබරයා තලගොයා වී ඇත්තේ එසේය. වත්මන් 78 ව්‍යවස්ථාව තුළ විධායක ජනාධිපති ක්‍රමයත් මැතිවරණ ක්‍රමයත් එකට බැඳී පවතී. 19වන සංශෝධනයෙන් විධායක ජනාපධිති ක්‍රමයේ බලතල රැසක් අහෝසි කිරීමට උත්සාහ කරද්දී ශ්‍රීල.නි.ප. කණ්ඩායම තර්ක කරනු ලැබුවේ මැතිවරණ ක්‍රමය වෙනස් නොකර විධායක ජනාධිපති ක්‍රමය පමණක් වෙනස් කිරීම වැරදි බවය. දෙකම එකට වෙනස් කළ යුතු යැයි ඔවුහු පැවසූහ. එහෙත් දැන් එම වරදම අනෙක් පැත්තට, තමන්ට වාසි පැත්තට කිරීමට ඔවුන් සූදානම්ය. විධායක ජනාධිපති ක්‍රමය මෙලෙසම තබාගෙන තමන්ට වාසිදායක ඡන්ද ක්‍රමයක් පමණක් හැදීමට ඔවුන්ට අවශ්‍ය වී තිබේ. ඒ අනුව නව ව්‍යවස්ථාව අලුත් එකක් වන්නේ නැත. මන්ද එහි වෙනස් කිරීමට උත්සාහ කරන්නේ ඡන්ද ක්‍රමය පමණක් වන නිසාය.

විධායක ජනාධිපති ක්‍රමය අහෝසි නොකර මැතිවරණ ක්‍රමය පමණක් වෙනස් කිරීමට කල්පනා කරන්නේ නම් එය ජනතාවගේ කැමැත්ත නොව මෛත්‍රීපාල ජනාධිපතිවරයා ඇතුළු ශ්‍රීල.නි.ප. කණ්ඩායමේ වුවමනාවය. මෛත්‍රීපාල මහතා ඇතුළු පිරිස දැන් කල්පනා කරන ක්‍රමයක් තිබේ. එක් අතකින් මෛත්‍රීපාල ජනාධිපතිවරයා තමන්ට අහම්බෙන් ලැබුණ බලය අත්හැරීමට සූදානම් නැත. එසේම එම බලය හිතු ලෙස යොදාග ැනීමට නම් තමන්ගේම ආණ්ඩුවක් ඔහුට අවශ්‍යය. එ.ජා.ප.ය සමඟ හවුලේ ආණ්ඩුකරන විට ඔහුගේ වුවමනාවට අනුවම කටයුතු කළ නොහැක. ඒ නිසා හවුලේ බුක්ති විඳින බලයක් වෙනුවට තනි බලයකට ඔවුන් කැමතිය. මෛත්‍රීපාල ජනාධිපතිවරයාගේ ප්‍රධානත්වයෙන් ශ්‍රීල.නි.ප. ආණ්ඩුවක් හදාගැනීමේ සිහිනය පවතින්නේ ඒ අනුවය.

එසේම එ.ජා.ප.ය සමඟ හවුලේ ආණ්ඩු කරන විට ආණ්ඩුව තුළ ඉන්නා ඇමතිවරුන්ට බිමේ පාක්ෂිකයන්ගේ විරෝධය නිතර එල්ල වේ. ඒ, විපක්ෂයේ කාර්යභාරය නොකොට යූ.එන්.පී. ආණ්ඩුවක ඇමතිකම් ගැනීම පිළිබඳවය. මහින්ද රාජපක්ෂ කණ්ඩායම බිමේ මෙම මතය පැතිරවීම නිසා ආණ්ඩුව තුළ සිටින ශ්‍රීල.නි.ප. ඇමතිවරු අසීරුවට පත්වෙති. එවිට බිමේ පාක්ෂිකයාගේ හිත හැදීම සඳහා දේශපාලන තර්කයක් අවශ්‍යය. එම තර්කය වන්නේ ඔවුන් හවුල් ආණ්ඩුවේ සිටින්නේ ඒ තුළ සිටිමින් ශක්තිමත් වී ශ්‍රීල.නි.ප.ය ලෙස තනි ආණ්ඩුවක් ගොඩනැගීමට කටයුතු කරන බවය. එම කරුණ අනුව ගත් විටද ඔවුන්ට ඡන්ද ක්‍රමය වෙනස්කර ගැනීම අත්‍යවශ්‍ය වන අතර විධායක ජනාධිපති ක්‍රමය වෙනස් නොකර තබාගැනීමද අවශ්‍ය වේ.

රටට නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සකස් කරන්නේ නම් එය සකස් විය යුත්තේ, 2015 ජනවාරි 08 ජනාධිපතිවරණයේදී ප්‍රකාශ වූ ජනවරමේ හරය පදනම් කරගෙනය. එහෙත් දැන් ඒ වෙනුවට ශ්‍රීල.නි.ප.යේ බල වුවමනාව පදනම් කරගනිමින් නව ව්‍යවස්ථාවක් සැකසෙන්නේ නම් එය ඉතා බරපතළය. එවිට නව ව්‍යවස්ථාව මගින් ප්‍රකාශ වන්නේ 2015 ජනවාරි 08වැනිදා ජයගත් මතය නොව ඊට එරෙහිව සිට පරාජයට පත්වූවන්ගේ මතයය. එය සාධාරණ නැත.

මෙහිදී එ.ජා.ප.ය අනුගමනය කරන්නේද වැනෙන සුළු ප්‍රතිපත්තියකි. විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීමේ සැබෑ වුවමනාවක් ඔවුන්ටද නැති බව පෙනේ. ඔවුන් මැතිවරණයේදී විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීමේ සටන් පාඨය ගනු ලැබුවේ ඒ වෙනවිට එය රටේ බහුතරයේ ඉල්ලීම වී තිබූ නිසාය; ඉන් දේශපාලන වාසි ලබාගැනීමටය. දැන් මෛත්‍රීපාල කණ්ඩායමේ අවශ්‍යතාවය නිසා හෝ විධායක ක්‍රමය අහෝසි නොවන්නේ නම් එ.ජා.ප.ය ඊට ලොකු විරෝධයක් නොදැක්වීමටද ඉඩ ඇත. එය ඔවුන්ට වෙස්වළාගත් ආශිර්වාදයක් යයි ඔවුන් සිතන්නටද පුළුවන. ඔවුනට අවශ්‍ය වී ඇත්තේ නව ලිබරල්වාදී ආර්ථික ගමනට ගැලපෙන ව්‍යවස්ථාවක් හදා ගැනීමය. එක් මොහොතක සමාජයක් තුළ පවතින අවශ්‍යතාවයන් ඔවුන් තම මැතිවරණ සටන්පාඨ බවට පත්කර ගනු ලබන්නේ සැබෑ ලෙසම ඒවා ඉටුකිරීමට නොව එම සටන්පාඨ ඔවුන්ගේ බලය ලබාගැනීම සඳහා යොදාග ැනීමට පමණි. ලංකාවේ දේශපාලන ඉතිහාසයේම අත්දැකීම එයයි.

කෙසේ වුවත් නව ව්‍යවස්ථාව සකස්කරන විට ඒ තුළ විධායක ජනාධිපති ක්‍රමය ඉතුරු වී මැතිවරණ ක්‍රම සංශෝධනය පමණක් සිදුවන්නේ නම් ඊට ඉඩදිය යුතු නැත. එම ප්‍රජාතන්ත්‍ර විරෝධී උත්සාහය **15 වැනි පිටුවට**

> "රටට නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සකස් කරන්නේ නම් එය සකස් විය යුත්තේ, 2015 ජනවාරි 08 ජනාධිපතිවරණයේදී ප්‍රකාශ වූ ජනවරමේ හරය පදනම් කරගෙනය. එහෙත් දැන් ඒ වෙනුවට ශ්‍රීල.නි.ප.යේ බල වුවමනාව පදනම් කරගනිමින් නව ව්‍යවස්ථාවක් සැකසෙන්නේ නම් එය ඉතා බරපතළය. එවිට නව ව්‍යවස්ථාව මගින් ප්‍රකාශ වන්නේ 2015 ජනවාරි 08වැනිදා ජයගත් මතය නොව ඊට එරෙහිව සිට පරාජයට පත්වූවන්ගේ මතයය. එය සාධාරණ නැත.



"ධනපති ක්‍රමය යටතේ නිර්ධන පංතියට ලැබිය හැකි හොඳම රාජ්‍ය ආකෘතිය ලෙසට අපි ප්‍රජාතන්ත්‍රවාදී සමූහාණ්ඩුවකට පක්ෂ වන්නෙමු. එහෙත් ඉතාමත් ප්‍රජාතන්ත්‍රවාදී ධනපති සමූහාණ්ඩුව යටතේ පවා ජනතාවට අත්වන්නේ, වේතන වහල්භාවයය යන්න අමතක කිරීමට අපට අයිතියක් නැත."

**ලෙනින්**
**තෝරාගත් කෘති,**
**6වැනි වෙළුම -**
**26 වන පිටුව**

# සිසු සටන් සගයින් සැමරේ

මෙරට ශිෂ්‍ය ව්‍යාපාරය තරම් නිරන්තරයෙන් පාලක පංතිය සමඟ අරගල මඟට යොමුවන ව්‍යාපාරයක් නොමැති තරම්ය. එසේ වන්නේ ශිෂ්‍ය ව්‍යාපාරයේ ජන්ම ගතියකට නොවන බව තේරුම් ගෙන ඇත්තේ රටේ ජනයාගෙන් අතලොස්සක් පමණි. ඇතැම් ජනමාධ්‍ය මෙන්ම ඒ අනුව හිතන ඇතැම් මිනිසුන්ද ශිෂ්‍ය අරගලයන්හි තීව්‍ර අවස්ථාවන්හිදී උද්ඝෝෂණ ඇති වීමට හේතු සොයනවාට වඩා අවධානය යොමු කරනු ලබන්නේ එම ක්‍රියාමාර්ග හේතුවෙන් සිදුවන මාර්ග තදබදය පිළිබඳවය.

එහෙත් ශිෂ්‍ය ව්‍යාපාරය හුදු අධ්‍යාපන අයිතිවාසිකම්වලට ඔබ්බෙන් ඇති පොදු ජනයාගේ අයිතිවාසිකම් වෙනුවෙන්ද මැදිහත් වූ ඉතිහාසයක් මෙන්ම මැදිහත් වන වර්තමානයක්ද ඇති බව බොහෝ දෙනා නොදනිති. 1978 සාමාන්‍ය ජනයාගේ හාල් පොත කැපීමට එරෙහිව පාරට බැසීමද 1987 ඉන්දියානු ආක්‍රමණයට එරෙහිව සිදු කරන ලද අරගලයද ඒ අතර වෙයි.

රටේ පැවති ආණ්ඩුව සමග ඍජු ලෙසම ගැටීමට ශිෂ්‍ය ව්‍යාපාරයට සිදුවූයේ මෙසේ විශ්වවිද්‍යාල පරිශ්‍රය තුළ තමන්ට බලපාන ගැටලුවලට පමණක් සීමා නොවී පොදු ජනතාවගේ කප්පාදු වන අයිතිවාසිකම් සම්බන්ධයෙන් මැදිහත් වීම නිසාවෙන් බවද අවධානයට ගත යුතුව තිබෙන කරුණකි.

ජූනි 20, ජාතික ශිෂ්‍ය වීර දිනය ලෙස නම් වන්නේද පොදු අරගලයන් වෙනුවෙන් තම දිවි කුසුම පූජා කළ ඒ විරු සිසු සහෝදර, සහෝදරියන් හට උපහාරයක් වශයෙනි.

2016 ජූනි 20වැනිදා කොළඹ මහජන පුස්තකාලයේදී මෙම විරු සිසු සැමරුම් උත්සවය සංවිධානය කර තිබුණේ, සමාජවාදී ශිෂ්‍ය සංගමය විසිනි. එහි සමරු දේශන ජ.වි.පෙ. ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා, සමාජවාදී ශිෂ්‍ය සංගමයේ ජාතික සංවිධායක රංගන දේවප්‍රිය යන සහෝදරවරුන් විසින් සහ කථිකාචාර්ය අතුල සමරකෝන් මහතා



විසින් පවත්වන ලදී. දේශනවලින් අනතුරුව සමරු ගී ප්‍රසංගයක්ද පැවැත්වන ලද අතර මේ අවස්ථාවේ පාසැල් සිසුන්ගෙන් මෙන්ම විශ්වවිද්‍යාල සිසුන්ගෙන්ද පුස්තකාල ශ්‍රවණාගාරය අතුරු සිදුරු නොමැතිව පිරී පැවතීම විශේෂයක් විය.

# සාමය, එකමුතුව සහ සමාජ සාධාරණත්වය වෙනුවෙන්

"සාමය, එකමුතුව සහ සමාජ සාධාරණත්වය වෙනුවෙන් අපි අධිරාජ්‍යවාදයට එරෙහිව සටන් කරමු - අපගේ අතීතය ගෞරවයෙන් සිහිපත් කරමු - අනාගතය ගොඩනගමු" යන්න 2017 වසරේ රුසියාවේ මොස්කව් නුවර පැවැත්වෙන 19 වන ලෝක තරුණ හා ශිෂ්‍ය උළෙලේ ප්‍රධාන තේමාව විය යුතු යැයි පසුගිය ජූනි මස 3 -8 යන දිනයන්හිදි වෙනිසියුලාවේ කරකාස් නුවර පැවැත්වූ එම උළෙලේ පළමු සූදානම් කිරීමේ ජාත්‍යන්තර සමුළුවේදී සම්මත විය. මෙම සූදානම් කිරීමේ පළමු සමුළුව සඳහා ජ.වි.පෙ. මධ්‍යම කාරක සභික වෛද්‍ය නලින්ද ජයතිස්ස සහෝදරයා සහභාගි වූයේ සමාජවාදී ශිෂ්‍ය සංගමය සහ තරුණ සංගමය නියෝජනය කරමිනි. රටවල් 32ක නියෝජිතයෝ 65 දෙනෙක් මෙම සූදානම් කිරීමේ ජාත්‍යන්තර සමුළුවට සහභාගි වූහ. ජාත්‍යන්තර දේශපාලනය තුළ ජ.වි.පෙ. භූමිකාව දිනෙන් දින තහවුරු වන ආකාරය මෙවැනි සිදුවීම් තුළින් පෙන්නුම් වේ.




# නව දේශපාලන ගමනකට සැරසෙන උතුර

වත්මනේ වුවද උතුරේ දේශපාලනය බොහෝ කලක් පදනම් වූයේ ජාතිවාදය මතයි. උතුරේ සහ දකුණේ ජාතිවාදී දේශපාලඥයන්ගේ මුග්ධ හැසිරීම්, තිස් වසරක යුද්ධය මෙන්ම එය නිමවීමෙන් පසු පැවති රාජපක්ෂවරුන්ගේ ජාතිවාදී පාලනයද මෙයට හේතු වශයෙන් සැලකිය හැකිය.

රාජපක්ෂවරුන්ගේ පාලන කාලයේදී යුද්ධය නිම වීමෙන් පසුව වුවත් කිසිදු දේශපාලන පක්ෂයකට හෝ සිවිල් සංවිධානයකට හෝ උතුරට යෑම තහනම් විය. එහි ක්‍රියාත්මක වුයේ වෙනම හමුදා පාලනයකි. මේ සියලු දුෂ්කර තත්වයන් යටතේ වුවද ජ.වි.පෙ. එදා සිටම උතුරේ දේශපාලන කටයුතු වෙනුවෙන් මැදිහත් වීම ඇරඹීය. එහෙත් එය සීමාසහිත වූවක් විය.

නමුත් වර්තමානය වන විට උතුරු පළාත තුළ පක්ෂ කාර්යාල පිහිටවමින්ද එහි වෙසෙන ජනතාවගේ එදිනෙදා ගැටලු සඳහා මැදිහත් වෙමින්ද ජ.වි.පෙ. පියවර ගණනාවක් ඉදිරියට තබා ඇත. පසුගිය ජූනි මස 04 වෙනිදාද ජ.වි.පෙ. ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහෝදරයාගේ ප්‍රධානත්වයෙන් නව දේශපාලනය තත්වය පිළිබඳ සහ පක්ෂ සංවිධාන ගොඩනැගීම පිළිබඳ සාකච්ඡා කිහිපයක් යාපනේ අරියාලේ පිහිටි ජ.වි.පෙ. කාර්යාලයේදී පැවැත්වුණි. මීට අමතරව යාපනය ප්‍රදේශයේ පැවති තවත් දේශපාලන කටයුතු රාශියකටද ප්‍රධාන ලේකම් වරයා සහභාගි විය.





# අත්නොහරින සහෝදරත්වය

විවිධ විද්‍යුත් මාධ්‍ය නාලිකා පසුගිය කාලයේ ඇති වූ ගංවතුර සමග හටගත් හදිසි ආපදා තත්වය පදනම් කර ගනිමින් තම තමන්ගේ 'රේටින්' වැඩි කර ගැනීමේ නිර්ලජ්ජිත ක්‍රියාවලියක නිරත වූ බව රහසක් නොවේ. විපතට පත් ජනතාවට ආධාර ස්වල්පයක් ලබාදී විපතට පත්වූවන් ලවා තම නාලිකාවේ නම කියවා ගැනීමේ තරගයක එම නාලිකා නිරතවනු දක්නටද ලැබුණි. එසේම ඇතැම් දේශපාලඥයන්ද අනුන්ගෙන් ලද අධාර තමන්ගේ නම ගසා බෙදාහැරි අවස්ථා පිළිබඳවද ඒ සමයේ අසන්නට ලැබුණි. එහෙත් ගංවතුර බැස යාමත් සමග එම ජනයාගේ ජන ජීවිතය නැවත නගා සිටුවීමට හෝ ඉහත කී මාධ්‍ය නාලිකා, දේශපාලඥයන් හෝ ආණ්ඩුව කටයුතු කරන බවක් දක්නට නොවීය. ගංවතුර අවසන් වීමත් සමග ඔවුනුත් අතුරුදහන් වූවා වැනි විය.

එහෙත් මාධ්‍ය තුළ කතාබහට ලක් නොවූ, එසේම මාධ්‍ය ඉලක්ක කර පමණක් තම සහන කටයුතු සිදු නොකළ ජනතා විමුක්ති පෙරමුණ ගංවතුර සහ හදිසි ආපදාවට ලක් වූ ජනතාව වෙනුවෙන් තම යුතුකම් කොටස ඉටු කළේ එම අපදා අවස්ථාවේදී පමණක් නොවේ. ඉන් පසුවද ජ.වි.පෙ. ඔවුන්ගේ සාමාන්‍ය ජන ජීවිතය යථා තත්වයට පත් කිරීම සඳහා තම හැකි පමණින් මැදිහත් විය.

ශ්‍රම ක්‍රියාවලි මගින් පමණක් නොව වෙනත් ආකාරයන් තුළින්ද ජනතාවට සහන සැලසීමට ජ.වි.පෙ. කටයුතු කළේය. එනම් විපතට පත්වූවන්ගේ මානසික තත්වය යහපත් කිරීම සඳහාද නොයෙක් වැඩසටහන් ක්‍රියාත්මක කිරීමයි. අරණායක, එළගිපිටිය නායයෑමෙන් විපතට පත් ජනයා රැඳී සිටින කඳවුරු සඳහා මෙවැනි වැඩසටහන් මාලාවක් ජ.වි.පෙ. විසින් සංවිධානය කර තිබුණි. පසුගිය ජූනි 08 වෙනිදා මෙම වැඩසටහන් මාලාවේ එක් වැඩසටහනක් අරණායක විල්පොල මුස්ලිම් කනිෂ්ඨ විද්‍යාලයේ පවත්වන ලදී. එම කඳවුරේ සිටින දරුවන්ට චිත්‍ර සහ වෙනත් අත්කම් නිර්මාණයන්ද අනතුරුව කඳවුරේ සියලුම දෙනා සම්බන්ධ කර ගනිමින් සංගීතමය වැඩසටහනක්ද ක්‍රියාත්මක කෙරුණි. මෙම සංස්කෘතික වැඩසටහන සඳහා කඳවුරේ සියලු දෙනා මහත් මහත් උනන්දුවෙන් එක්වූහ.

ජ.වි.පෙ.ට අනුබද්ධ ලංකා ගුරු සේවා සංගමයේ සමන්ත රණසිංහ සහෝදරයා, මාවනැල්ල මූලික රෝහලේ වෛද්‍ය කමල් ධර්මවංශ, විශ්‍රාමික පාඨශාලාචාර්ය ජයලත් රූපසිංහ, හෙම්මාතගම දේවි බාලිකා විද්‍යාලයේ සංගීතාචාර්ය ලක්සිරි ප්‍රියබණ්ඩාර, කෑගල්ල රෝහලේ හෙද සහ වෛද්‍ය කාර්ය මණ්ඩලයේ පිරිසක්ද මෙම වැඩසටහන සඳහා ස්වේච්ඡාවෙන් දායකත්වය දැක්වූහ.





# බදු ගහනවා - ණය ගන්නවා රට නැත්තට - නැති කරනවා

ජනතාවගේ බදු බර උග්‍ර වෙද්දී රටේ පාලකයන් සිදු කළ යුත්තේ එය අවම කිරිම සඳහා සැලසුම් ඉදිරිපත් කිරීම වුවත් වත්මනේ සිදුවෙමින් තිබෙනුයේ ඔවුන් විසින් එය තවදුරටත් උග්‍ර කිරීමට කටයුතු කිරීමයි. නව වැට් බදු සංශෝධන තුළින් ජනතාව මත බදු බර තව වැඩිවෙද්දී, ඇතැම් ඇමතිවරුන්ට වාහන ගෙන්වීම සඳහා රුපියල් කෝටි 118ක් වෙන්කිරීමෙන් ගම්‍ය වනුයේ මේ අර්බුදය තව තවත් උග්‍ර කිරීම හැර ඔවුනට විසඳුමක් නැති බවයි.

මේ තත්වය හමුවේ මේ නව වැට් බද්දට එරෙහිව ජනතාව පෙළගැස්වීමේ වැඩපිළිවෙළකට ජ.වි.පෙ. අවතීර්ණ විය. එහි එක් පියවරක් ලෙස පසුගිය මැයි 30 වෙනිදා මේ සම්බන්ධයෙන් රටේ ජනතාව දැනුවත් කිරීම සඳහා දිවයින පුරා අත් පත්‍රිකා බෙදාහැරීමේ ව්‍යාපාරයක් ආරම්භ කරන ලදී.

එයට අමතරව පසුගිය ජූනි 03 වෙනිදා මෙම වැට් බදු සංශෝධනවලට මෙන්ම ජාත්‍යන්තරය ඉදිරියේ රට තවදුරටත් ණය කිරීමට එරෙහිවද නාස්තිකාර වියදම් සිදුකිරීමට එරෙහිවද රනිල් - මෛත්‍රී හවුල් පාලනයට එරෙහිවද විරෝධතා පා ගමනක් සහ උද්ඝෝෂණයක් පැවැත්වීමටද ජ.වි.පෙ. කටයුතු කරන ලදී.

කොළඹ ටෙක්නිකල් හන්දියේ සිට කොටුව දුම්රියපොළ දක්වා උද්ඝෝෂණ පාගමන පැවති අතර ප්‍රධාන උද්ඝෝෂණය පවත්වුණේ කොටුව දුම්රිය පොළ ඉදිරිපිටදීය. මේ අවස්ථාව සඳහා ජ.වි.පෙ. නායක අනුර දිසානායක, ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහෝදරයා ඇතුළුව ජ.වි.පෙ. සාමාජික සාමාජිකාවෝ රැසක් සහභාගි වි සිටියහ.



*මෙවර නියමුවා සමග ඇරඹෙන 'ගවේෂණ' ලිපි පෙළ බොහෝ දෙනාගේ හා සාම්ප්‍රදායික ජනමාධ්‍යයන්හි අවධානයට ලක් නොවූ ක්ෂේත්‍රයන්හි සමාජ, ආර්ථික, දේශපාලන ගැටලුවල විවිධ පැතිකඩ සාකච්ඡා කිරීම වෙනුවෙන් වෙන්වෙයි.*

# උඩින් මෙගා යටින් ඩෙංගා

උදැසන අවදිවන ස්ටොක්වත්තෙහි මෙහා කෙළවරේ ජනයා මීටර 200ක් 300ක් පමණ පසු කොට එහා කෙළවරට ගමන් කරනුයේ තම ශරීරකෘත්‍යය කර ගැනීම සඳහා නිම කර ඇති පොදු වැසිකිළිය දෙසටය. කොළඹ මරදානේ පිහිටි ස්ටොක්වත්තෙහි පවුල් 250 ක් 300ක් අතර ප්‍රමාණයක් ජීවත් වන නමුත් මෙය පිහිටා ඇත්තේ කොළඹ නගරයෙහි මළ අපද්‍රව්‍ය බැහැර කරන නළ පද්ධතියට පහළ මට්මෙන් හෙයින් මෙහි වැසිකිළි තැනීමට නොහැකි බව පැවසේ. එයට හේතුව වී තිබෙන්නේ එම වැසිකිළිවල මළ අපද්‍රව්‍ය සහිත නළ ප්‍රධාන නළ පද්ධතිය හා සම්බන්ධ කළ නොහැකි වී මෙනි. මෙනිසා ඇතැමෙකු මළ අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා ටැංකි භාවිතා කරන අතර තවකෙකු විසින් පොදු වැසිකිළිය භාවිතා කරනු ලබයි. නමුත් මේ දෙයාකාරයෙන්ම ජනයා පත්ව ඇත්තේ ඉතාම අසීරු අඩියකටය.


එමෙන්ම කොළඹ වනාත මැගසින් වත්ත ප්‍රදේශයේ නිවෙස්වල වැසිකිළි අපද්‍රව්‍ය එකතුවනු ලබන්නේ පොදු කාණු පද්ධතියටය. ඇතැම් විට ඉතා සුළු වර්ෂාවකදී පවා මෙම කාණු පද්ධති උතුරා ගොස් එම මළ මූත්‍ර සහිත ජලය නිවෙස් තුළට කඩා වදී. මෙයද බලධාරීන්ට මෙන්ම එම ජනතාවටද මෙය සාමාන්‍ය කාරණයක් වී තිබේ. එහෙත් මේ කරුණු ද්විත්වය සුළුවට තැකිය හැකි දේ නොවේ; බරපතළ ගැටලුවක මතුපිට ප්‍රකාශනය පමණි.

මෙරට පාලනය කළ බ්‍රිතාන්‍ය ජාතිකයන් විසින් කොළඹ නගරයේ මළඅපවහන පද්ධතියක් ආරම්භ කිරීම ක්‍රි.ව.1890 වසර දක්වා පමණ දිවයයි. එම කාලයේ ආරම්භ කළ මෙම පද්ධතියේ වැඩ වසර 1920 පමණ වන විට අවසන් කර තිබේ. ඒ අනුව එය අවම වශයෙන් වසර 90කටත් වඩා පැරණිය. ඒ වන විට කොළඹ නගරයේ ජනගහනය ලක්ෂයක් පමණ වන්නට ඇතැයි පැවසේ. එකල කර්මාන්ත ශාලා ආදිය නගරය තුළ නොතිබූ අතර ජනාවාස සහ පරිපාලන කටයුතු කේන්ද්‍ර කරගත් ස්ථාන පමණක් මෙහි විය. මෙම මළ නල පද්ධතිය ස්ථාපිත කරන විට කොළඹ නගරයේ ජනගහනය ලක්ෂයක් පමණ වුවත් අද වන විට නගරයේ පදිංචි ජනගහනය ලක්ෂ 07ක්ද එදිනෙදා කටයුතු කර ගැනීම සඳහා පැමිණෙන ප්‍රමාණය ලක්ෂ 06ක් වශයෙන්ද ආසන්න වශයෙන් පැවසිය හැක.

එදා මෙදා තුර ජනගහන වර්ධනයට සාපෙක්ෂව බැලූ කල ඕනෑම කෙනෙකුට පෙනී යනු ලබන්නේ ලක්ෂයක ජනතාවක් ඉලක්ක කර සැදූ නල පද්ධතියක් වර්තමානයේ ඊට වඩා වැඩි පිරිසක් පරිහරණය කිරීම නිසා මෙම නල පද්ධතිය ප්‍රමාණවත් නොවීම හේතුවෙන් කාණු පද්ධති උතුරා යෑම් ආදිය සිදුවන බවයි. බැලූ බැල්මට එසේ හැඟීගියද කරුණු අධ්‍යයනය කිරීමේදී පෙනී යන කරුණක් වනුයේ නල පද්ධතියේ ප්‍රමාණය ප්‍රධාන ගැටලුවක් නොවන බවයි.

ගණිතමය තර්කයක් අනුව නලයෙන් පිරී යනු ලබන්නේ එහි 1/3 ක ප්‍රමාණයක් බවට උපකල්පනය කර නලයෙන් ගමන් කරන මළ ද්‍රව පරිමාව ලෙස සලකන අතර එහි තව 2/3 ප්‍රමාණයක්ද ඉතිරිව පවතී. එසේම එම මළ නාලිකා දවසේ පැය 24 පුරාවටම සම්පූර්ණයෙන් පිරී ඉතිරී නොපවතින අතර වැඩිපුරම උදෑසන 5 - 7 කාල පරාසය තුළ මෙන්ම සවස 6 - 8 කාල පරාස තුළ පද්ධතියට වැඩි වශයෙන් මළ ද්‍රව්‍ය එකතු වේ. කොළඹ නගර සභාවේ මළ නාලිකා නඩත්තු කටයුතු කරන අයවළුන්ට අනුව ඇතැම් ස්ථානයන්ගෙන් මළ ද්‍රව්‍ය උතුරා යනු ලබන්නේ නලයේ පරිමාව මදි නිසා නොව අපද්‍රව්‍ය ඝන වී එම නාලිකා තුළ තැන්පත් වීම නිසාවෙනි.

අප මෙහිදී අවධානයට ලක්කරනු ලබන්නේ මළ අපද්‍රව්‍ය ඉවත් කිරීමේ ක්‍රියාවලිය පිළිබඳව වන අතර මේ ආකාරයට වැසි වතුර ඉවත් කිරීමේ ක්‍රියාවලියක්ද පවතී. මළ අපද්‍රව්‍ය ඉවත් කිරීමේ ක්‍රියාවලිය පිළිබඳව අවධානය යොමු කළහොත් එය සැකවින් මෙසේය. නගරයේ වැසිකිළි මගින් එන මළ අපද්‍රව්‍ය බට මාර්ගයෙන් විවිධ දිශා වල සිට ගුරුත්වබලය (Gravati) යටතේ පොළොවේ පහත් ස්ථානයකට එකතු කරනු ලබයි. මෙවැනි ස්ථානවල ඉදිකර ඇති පොම්පාගාර මගින් ගුරුත්වය යටතේ හෝ නොමැතිනම් පොම්පකර තවත් පොම්පාගාරයකට යවනු ලබයි. එසේ යවනු ලබන අපද්‍රව්‍ය අවසානයේ මුහුද අසළ ඇති පොම්පාගාරයක් (Pump House) මගින් මුහුදට පොම්ප කරනු ලබයි. ඇතැම් දියුණු රටවල මුහුදට අපද්‍රව්‍ය එකතු කිරීමට පෙර යම් පමණකට පිරිසිදු කිරීමක් (Treatment) සිදු කරනු ලබයි.




## අශ්වයා ගිය පසු ඉස්තාලය

මෙරට පැවති සහ පවතින ආණ්ඩු මෙන්ම ඒ හා ජාඩියට මූඩිය සේ ගැලපෙන නිලධාරි යාන්ත්‍රණයද කටයුතු කරනුයේ පූර්ව සැලැස්මකින් තොරව එදිනෙදා තම තමන්ගේ පැවැත්ම වෙනුවෙන් පමණි.

රටේ හෝ තමන්ගේ ක්ෂේත්‍ර තුළ හෝ සිදුවීමට නියමිත බිඳවැටීම්, අනතුරු පෙර වළක්වා ගත හැකි ක්‍රම තිබියදීත් ඔවුන් කටයුතු කරනුයේ අනතුර හෝ හානිය සිදුවන්නට ඉඩ හැර පසුව ඒ වෙනුවෙනුන් මැදිහත් වී තම මඩි තද කර ගැනීමයි.

කොළඹ නගරයේ පවතින මළ නාලිකා පද්ධතියටද සිදුව ඇත්තේ මෙයයි. වසර 90කට වඩා පැරණි මේ නල පද්ධතියේ නියම තත්වය පිළිබඳ වාර්තාවක් මේ වනතුරුත් කොළඹ නගර සභාව සතුව නැත. සාමාන්‍යයෙන් දෛනිකව සිදුවනු ලබන්නේ නගරයේ කොතැනක හෝ ස්ථානයක නාලයක් අවහිර වූ විට එම නාලයේ අවහිරතාව ඉවත්කර ආපසු පැමිණීම පමණි.

එසේ නොමැතිව නගර සභාව මගින් වසර 5 කට හෝ සැරයක් නැතිනම් මාස 3න් 3ට හෝ මෙම නල පද්ධතිය සම්බන්ධයෙන් කරුණු අධ්‍යයනය කර භාවිතයට නුසුදුසු නල ඇත්තේ කොහිද?,ඉදිරියේදී අවහිර විය හැක්කේ කුමන නාලයන්ද? එම අවහිරතාවය සිදුවීමට පෙර එනම් අශ්වයා පැන යාමට පෙර ඉස්තාලය වසා දමන්නාසේ එම නලයන් අවහිර වීමට නොදී වළක්වාගන්නේ කෙසේද යන්න පිළිබදව අදාළ බලධාරීන්ගේ තක්සේරුවක් නොමැත. එනම් Preventive Mentainance ක්‍රියාවලියක්, අනතුරු සිදුවීමට පෙර නඩත්තුවක් සිදුවන්නේ නැත.

## කාඩරය කෝ

කොළඹ නගර සභාව තම පරිපාලන කටයුතු සඳහා නගරය ඒකක 06 කට වෙන් කරනු ලැබ ඇති අතර ඒ සෑම ඒකකයකටම මෙම කටයුතු සඳහා ඉංජිනේරුවරයෙකුගේ අධීක්ෂණය යටතේ කණ්ඩායමක් යොදවා තිබේ.

ජනතාවගෙන් ලැබෙන පැමිණිලි අනුව අවහිරතාවයට ලක්ව ඇති මළ නාලිකා පවිත්‍ර කිරීමට අදාළ පුද්ගලයින් යොදවන මුත් ඉන් නියම ප්‍රතිඵලය ජනතාවට අත්වන්නේද යන්න ගැටලු සහගතය. මන්ද මෙම නාලිකා පවිත්‍රකරන පුද්ගලයින්ගේ පොදු ස්වභාවය වන්නේ අධික බීමත්කම සහ තමන් කරන වෘත්තියට වගකීමක් නොමැති කමයි. මළ නාලිකා කිහිපයක් පිළිසකර කිරීමට ගිය අවස්ථාවදී පළමු අවස්ථාවෙන්ම ඔවුනට හොද සංතෝෂමක් ලැබුණහොත් අනෙක් තැන රාජකාරියට යෑම පසෙක තබා අධිකම බීමත් වන තෙක් මත්පැන් පානය කරනු ලබයි. සාමාන්‍යයෙන් හවස 04න් පසු මොවුන් සොයා ගැනීමටවත් නොමැත. ඒ නිසා නගරයේ මළ නාලිකා අවහිර විය යුත්තේ උදෑසන 8 සිට සවස 4 දක්වා පමණය. තවද මළ නාලිකා පද්ධතිවල සේවය සඳහා වෘත්තිමය පළපුරුද්දක් නොමැති පිරිසක් සිටීමද මේ ගැටලු උග්‍ර කිරීමට තවත් එක් කාරණයක් වී තිබේ.

ජනතාව පීඩාවට පත් වන මෙවැනි සංවේදි කාරණ සම්බන්ධයෙන් එයට අදාළ දේශපාලන අධිකාරිය හෝ නිලධාරි තන්ත්‍රය විසින් කඩිනම් විසඳුම් ඉදිරිපත් කළ යුතු වුවත් එම කාරණාද මළ පහ සේ ලිස්සා යෑමට ඉඩදී ඔවුහු කර ඇර සිටිති.

> බ්‍රිතාන්‍යයන් තමන්ගේ ආර්ථික ක්‍රියාවලිය ශක්තිමත් කර ගැනීම සඳහා මෙරට දුම්රිය මාර්ග, මහා මාර්ග මෙන්ම යටතල පහසුකම් දියුණු කරන ලදී. කොළඹ නගරය ඔවුන්ගේ යටතේ කිසියම් සංවර්ධනයක් ලබා ගනු ලබන්නේද එම ආර්ථික ඉලක්කයන්ට අදාළ යටිතල පහසුකම් සාක්ෂාත් කර ගැනීමේ ක්‍රියාවලියේ ප්‍රතිඵල ලෙසය.

සාමාන්‍යයෙන් ඇමරිකාව, එංගලන්තය සහ ප්‍රංශය වැනි දියුණු ධනපති රටවල මේ කාර්ය සඳහා වෘත්තීමය පුහුණුව ලැබූ පිරිසක් (Shwoer Flusher) සිටින අතර ඔවුන් පුහුණු කිරීම සඳහා ආයතනද පවතී. මොවුන්ගේ කාර්යය සඳහා සැලකිය යුතු වැටුපක් ලැබෙන අතර සාමාන්‍යයෙන් ඇතැම් රටවල දිනකට මොවුන් සේවය කළ යුතුව ඇත්තේ පැය 04ක් වැනි කාලයක් පමණි. එහෙත් මෙරට තුළ එවැනි වෘත්තිමය තත්වයක් ඇති කම්කරුවන් පිරිසක් බිහි කිරීමට පෙර ඉටු වීමට ඇති කාරණා බොහෝය.

## නවීන තාක්ෂණයෙන් තොර වීම

මෙම මළ අපද්‍රව්‍ය ගෙන යන නාලිකා පද්ධතිය වැඩි දියුණු කර ගැනීම සඳහා නවීන තාක්ෂණික උපාංග යොදා නොගැනීමද බරපතළ ගැටලුවක්ව පවතී. ඇතැම් නඩත්තු කටයුතු කිරීමට සිදුව ඇත්තේ උපකල්පන මතය. එනම් එම පද්ධතියේ ඇති නළයක් එතැනින් ඉවත් කීරීමට තරම් කඩතොළු වී ඇද්ද? නොමැතිනම් මෙය සාදා නැවත භාවිතයට ගත හැකිද යන්න සොයා බැලීමට ක්‍රමවේදයක් අදාල ආයතන සතුව නැත. බොහෝ විට සිදුවනුයේ නළය පිළිසකර කරනවා වෙනුවට අදාළ කාර්මික නිලධාරියාගේ හෝ ඉංජිනේරුවරයාගේ උපදෙස් මත එම නළය ඉවත් කර අලුත් නළයක් සම්බන්ධ කිරීම පමණි. එහෙත් ඇතැම් රටවල කැමරා ආදිය උපයෝගි කර ගනිමින් බටයේ හානි වී ඇති ස්ථාන සොයා ඒවා පිළිසකර කරනු ගනු ලබයි.

අනෙක් පැත්තෙන් පද්ධතියේ වැඩි දියුණු කිරීම සඳහා මෙන්ම වෙනත් සංවර්ධන කටයුතු සඳහාද ඒ ඒ මළ නාලිකා තුළින් ගමන් කරන අපද්‍රව්‍ය පරිමාණය ගණනය කර ගත යුතු වුවත් ඒ සඳහාද අදාළ උපාංග නගර සභාව සතුව නැත. වෙනත් රටවල මෙන් අදාල නාලිකා තුළින් ගමන් කරන ද්‍රව්‍ය ප්‍රමාණය ගණනය කිරීම සඳහා flow meters සවි කර එම නාලිකා එකිනෙක සම්බන්ධ කර (net work) පරිගණක ජාලයකට සම්බන්ධ කළේ නම් තත්වය මීට වඩා හාත්පසින් වෙනස් වන්නට තිබුණි.

කොළඹ නගරය තුළ නිරන්තරයෙන් නිවාස සංකීර්ණ ආදිය ඉදිවෙමින් පවතී. මෙවැනි වටපිටාවක් තුළ මෙම නිවාස සංකීර්ණයන්ගේ මළ නාලිකා ආදියද ප්‍රධාන පද්ධතියට සවි කිරීමට යාමේදී එයට සම්බන්ධ වන නිලධාරීහුද කිසියම්ම අපහසුතාවයකට පත් වෙති. එනම් මේ නිවාස සංකීර්ණයන් ආසන්නයෙන් යන ප්‍රධාන මළ නාලිකාවන්ට මේ ප්‍රමාණය දරා ගත හැකි වේද නොහැකිවේද යන කරුණය. දියුණු තාක්ෂණික උපකරණ නොමැති වීම හේතුවෙන් පූර්ව අවබෝධයක් ලබා ගැනීමට නොහැකි වීම මින් ප්‍රධාන කාරණයක් වේ. එසේ තත්වය පර්ක්ෂා කිරීමකින් තොරව මෙම නළ පද්ධති සවි කිරීමට යාමේදී අවසානයේ සිදු වන්නේ එම නල පද්ධති අවහිර වීම් හා උතුරා යෑමයි.

## පදිංචියේ ගැටලු

කොළඹ නගරය තුළ අඩු ආදායම්ලාභී ජනයා ජීවත් වන වතු 1600ක් පමණ ඇතයි වාර්තා වේ. මෙහි ඇති කාරණය වන්නේ, මේ වතු පිහිටා ඇත්තේද 02වැනි පිටුවට



"ඔබට ප්‍රශ්නයක් විසඳන්නට බැරිද? හොඳයි, එහෙනම් වර්තමාන සත්‍ය කරුණු සහ ඒ ප්‍රශ්නයේ ඉතිහාසය විමසා බලන්න! ඔබ ප්‍රශ්නය හොඳහැටි විමසා බැලූ කල, එය විසඳන හැටි ඔබට වැටහෙනවා ඇත. සියලු නිගමන එන්නේ විමසා බැලීමෙන් පසුවය, ඊට කලින් නොවේ. කිසිම විමසා බැලීමක් නොකොට 'විසඳුමක් සෙවීම' හෝ 'අදහසක් ඇතිකරගැනීම' පිණිස තමාම හෝ පිරිසක් සමඟ එක්ව තම මොළයට වධ දෙන්නේ තකතීරුවෙක් පමණි."

**මාඕ සේතුං**
**උදෘත පාඨ**
**269වැනි පිටුව**

# බ්‍රිතාන්‍යය: ගිලෙන නැවෙන් මුහුදට

යුරෝපා සංගමය තුළ තවදුරටත් රැඳිය සිටිය යුතුද නැද්ද යන්න තීරණය කිරීම සඳහා පසුගියදා පැවැත්වූ ජනමත විචාරණයෙන් 52%ක ඡන්ද ප්‍රතිශතයක් ලබා ගනිමින් බ්‍රිතාන්‍යය ඉන් ඉවත් විය යුතුය යන මතය ජයග්‍රහණය කළේය.

| | ඡන්ද ප්‍රමාණය | ප්‍රතිශතය |
|---|---|---|
| රැඳී සිටිය යුතුය | 16,141,241 | 48% |
| ඉවත්විය යුතුය | 17,410,742 | 52% |

ඒ අනුව ඉදිරියේදී යුරෝපා සංගමයට එහි සාමාජික රටවල් 28 අතුරින් දෙවන විශාලතම අර්ථිකයද දෙවන විශාලතම ජනගහනයද ඇති රට අහිමි වී යයි.

ප්‍රතිඵලය නිකුත් වීමත් සමඟ සමස්ත ලෝකයම මොහොතකට සලිත වූයේ විවිධ අයුරින් අනාවැකි පළ කළද මෙවැනි ප්‍රතිඵලයක් අත්වේ යයි කිසිවෙකු නොසිතූ බැවින් විය යුතුය. මෙලෙස බ්‍රිතාන්‍යය යුරෝපා සංගමයේ ඉවත් වීමත් සමඟ ඇතිවිය හැකි ප්‍රතිඵලය ගැන බොහෝ අනාවැකි පළ කෙරෙමින් තිබේ.


බොහෝ දෙනෙකු විශේෂයෙන් අධිපති මාධ්‍ය මෙම තීරණය විසින් වෙළඳපොළ මත ඇතිකරනු ලබන බලපෑම පිළිබඳ අනාවැකි පළ කළහ. එහෙත් වඩා වැදගත් වනු ඇත්තේ මෙමගින් ඇති කරනු ලබන දේශපාලනික බලපෑමය.

ඉන් එක් ප්‍රධාන ගැටලුවක් වන්නේ ස්කොට්ලන්තය සහ උතුරු අයර්ලන්තය බ්‍රිතාන්‍යයෙන් ඉවත් වීමට ඇති ඉඩකඩයි. ජනමත විචාරණයේදී ඡන්ද පාවිච්චි කර ඇති ආකාරය අනුව ස්කොට්ලන්තයේ සහ උතුරු අයර්ලන්තයේ බහුතරයේ ඡන්දය ප්‍රකාශ කර ඇත්තේ යුරෝපා සංගමය තුළ රැඳී සිටිය යුතුය යන මතයටයි.

ඡන්ද ප්‍රමාණයේ ප්‍රතිශතය

| ප්‍රදේශය | රැඳී සිටිය යුතුය | ඉවත්විය යුතුය |
|---|---|---|
| 1. එංගලන්තය | 47% | 53% |
| 2. ලන්ඩන් | 60% | 40% |
| 3. ස්කොට්ලන්තය | 62% | 38% |
| 4. වේල්සය | 47% | 53% |
| 5. උතුරු අයර්ලන්තය | 56% | 44% |
| 6. සමස්ත ප්‍රතිඵලය | 48% | 52% |

මෙහිදී පෙනී යන කරුණ නම් නාගරික උගත් ජනයා බහුල එංගලන්තය සහ වේල්සය තුළ (ජනගහනයෙන් බහුතරයක් වෙසෙන්නේ එංගලන්තයේය) බහුතරයක් ඉවත්වීම වෙනුවෙන් ඡන්දය ප්‍රකාශ කිරීමයි. මෙම ප්‍රතිඵලය නිකුත්වීමත් සමඟ ඒ පිළිබඳ අදහස් දැක්වූ ස්කොට්ලන්ත විදේශ ඇමතිවරයා ප්‍රකාශ කළේ මේ සම්බන්ධයෙන්




සාකච්ඡා කිරීම සඳහා ස්කොට්ලන්ත පාර්ලිමේන්තුවේ හදිසි සැසිවාරයක් කැඳවීමට නියමිත බවයි. එබැවින් මෙම ප්‍රතිඵලයත් සමඟ යුරෝපා සංගමය පමණක් නොව මහා බ්‍රිතාන්‍යයද විසිර යාමේ අවදානමකට මුහුණ පා ඇති බව පෙනේ.

මීට අමතරව, යුරෝපා සංගමයට අයත් රටවල් කිහිපයක්ම යුරෝපා සංගමයෙන් ඉවත්වීම පිළිබඳ සලකා බැලීමට මෙම ප්‍රතිඵලය විසින් බලකෙරී තිබේ. විශේෂයෙන් ප්‍රංශය හා නෙදර්ලන්තය තුළ දැනටමත් එවැනි සාකච්ඡාවක් ආරම්භ වී ඇත.

ලෝක දේශපාලනය තුළ මින් ඉදිරියට බ්‍රිතාන්‍යයට වෙනමත් යුරෝපා සංගමයට වෙනමත් කටයුතු කිරීමට සිදුවේ. එහිදී ඔවුන්ගේ හැසිරීම් එකිනෙකට හාත්පසින්ම පරස්පර විරෝධී නොවන්නට ඉඩ ඇත. එහෙත් යුරෝපා සංගමය තුළ රැඳී සිටියදී ඔවුන් අතර තිබූ පොදු බව එලෙසින්ම නොපවතිනු ඇත. ලෝක බල තුලනයේදී එක්සත් ජනපදය, යුරෝපා සංගමය, චීනය, රුසියාව අතරට බ්‍රිතාන්‍යය ලෙසට බල කේන්ද්‍රයක් ඇතිවීමට ඉඩ තිබේ.

කෙසේ වෙතත් මෙම ප්‍රතිඵලය ගැන අදහස් දක්වන විද්වතුන් ප්‍රකාශ කරන්නේ මෙම ප්‍රතිඵලය අධිරාජ්‍යවාදයේ නව ලිබරල්වාදී ප්‍රතිපත්තියේ සහ යුදවාදී ප්‍රතිපත්තියේම අතුරු ඵලයක් බවයි. එක් අතකින් නව ලිබරල්වාදය ලතින් ඇමරිකානු කලාපය තුළින් පරාජය වෙද්දී, ලෝක ආර්ථික අර්බුදයත් සමඟ එය යුරෝපා සංගමය තුළට රිංගා ගත්තේය. ඒ යුරොපා කොමිසම, යුරෝප මධ්‍යම බැංකුව හා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල යන ත්‍රිත්වය හරහාය. ආර්ථික අර්බුදයට පිළියම් ලෙස එමගින් හඳුන්වා දුන් ක්‍රියා මාර්ග, විශේෂයෙන් අරපිරිමැසුම් වැඩපිළිවෙළ, දැවැන්ත ජනතා විරෝධයක් එක් එක් රට තුළ ඇති කළේය. අනෙක් අතින් ලිබියාව, සිරියාව, ඉරානය, ඇෆ්ගනිස්ථානය වැනි රටවල් තුළ ඇති කළ යුද්ධ විසින් උද්ගත කරනු ලැබූ සරණාගත ප්‍රශ්නය වැනි ප්‍රශ්න විසින්ද මෙම තත්වය වර්ධනය කර තිබේ.


# එක්සත් ජනපදය: ජනාධිපතිවරණ සටන් බිමක

සිව් වසරකට වරක් පැවැත්වෙන එක්සත් ජනපද ජනාධිපතිවරණය මෙම වසරේ නොවැම්බර් 08වැනි දිනට යෙදී තිබේ. මෙය එක්සත් ජනපදයේ 58වන ජනාධිපතිවරණයයි. මෙම ජනාධිපතිවරණයේදීම එක්සත් ජනපදයේ 48වන උප ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමද සිදුකෙරේ.

එක්සත් ජනපද ව්‍යවස්ථාව අනුව එක් පුද්ගලයෙකුට ජනාධිපති ධුරය දැරිය හැක්කේ අවස්ථා දෙකකදී පමණක් නිසා මෙවර ජනාධිපතිවරණයට වත්මන් ජනාධිපති බැරැක් ඔබාමාට ඉදිරිපත් විය නොහැකිය.

මෙවර ජනාධිපතිවරණයේදී එක් එක් පක්ෂය මගින් ඉදිරිපත් කරනු ලබන අපේක්ෂකයා තෝරා පත්කරගැනීම සඳහා වන මූලික ඡන්ද විමසීම් පෙබරවාරි 01වැනි දින ආරම්භ වූ අතර ජූනි 14වනදා දක්වා පැවැත්වුණි. ප්‍රධාන පක්ෂ දෙක වන රිපබ්ලිකන් පක්ෂය හා ඩිමොක්‍රටික් පක්ෂය ඉදිරිපත් කරන අපේක්ෂකයන් කවුරුන්ද යන්න දැටනමත් තීරණය කර අවසන්ය. ඒ අනුව බැරැක් ඔබාමාගේ පක්ෂය වන ඩිමොක්‍රටික් පක්ෂයෙන් හිටපු ජනාධිපති බිල් ක්ලින්ටන්ගේ බිරිඳ වන හිටපු රාජ්‍ය ලේකම් සහ නිව්යෝක් ප්‍රාන්තයේ සෙනෙට් සභික හිලරි ක්ලින්ටන්ද රිපබ්ලිකන් පක්ෂයෙන් ව්‍යාපාරිකයෙකු වන ඩොනල්ඩ් ට්‍රම්ප්ද තේරී පත්විය. මෙවර ජනාධිපතිවරණයේ ප්‍රධාන තරගය මොවුන් දෙදෙනා අතර පැවතියද මීට අමතරව තවත් පක්ෂ හා ස්වාධීන අපේක්ෂකයන් කිහිප දෙනෙකුද මෙවර එක්සත් ජනපද ජනාධිපතිවරණයට ඉදිරිපත් වීමට නියමිතය.








# බොලීවියාව එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලයට



2017-2018 කාල වකවානුව සඳහා එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය විසින් එහි ආරක්ෂක මණ්ඩලයේ තාවකාලික සාමාජිකයෙකු ලෙස බොලීවියාව තෝරා පත්කර ගනු ලැබ තිබේ. 193ක් වන මුළු සාමාජික රටවලින් රටවල් 183ක් බොලීවියාවට පක්ෂව ඡන්දය ප්‍රකාශ කර තිබුණි. මෙවර බොලීවියාව ආරක්ෂක මණ්ඩලයට තේරී පත්වන්නේ වෙනිසියුලාව ඉවත්වීමේ පුරප්පාඩුව වෙනුවෙනි.

අප්‍රිකානු කලාපය වෙනුවෙන් ඉතියෝපියාවද, යුරෝපය වෙනුවෙන් ස්වීඩනයද තාවකාලික සාමාජිකයින්ම ලෙස ආරක්ෂක මණ්ඩලයට තෝරා පත්කර ගැනුණි.

අසියානු-ෆැසිපික් කලාපය නියෝජනය කිරීම සඳහා තායිලන්තයටත්, කසකස්තානයටත් තේරී පත්වීමට නොහැකි වූයේ මුළු ඡන්ද සංඛ්‍යාවෙන් 2/3ක් ලබාගැනීමට අපොහොසත් වූ බැවින් බටහිර යුරෝපීය කලාපය නියෝජනය කිරීම සඳහාද තෝරා පත්කර ගැනීමක් සිදුකර ගැනීමට නොහැකි විය. මේ නිසා ඒ සඳහා ඉතාලිය හා නෙදර්ලන්තයද ආසියානු ෆැසිපික් කලාපය සඳහා කසකස්තානය හෝ තායිලන්තයද තෝරා පත්කර ගැනීම සඳහා යළි ඡන්ද විමසීමක් සිදුකිරීමට නියමිතව ඇත.

# යුනිසෙෆ් දත්ත කියන ඇත්ත



වැළැක්විය හැකි රෝගවලින් ළමුන් මිලියන 69ක් මිය යන බව යුනිසෙෆ් සංවිධානය පවසයි. එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල හෙවත් යුනිසෙෆ් සංවිධානය නිකුත් කර ඇති නවතම වාර්තාවට අනුව නිසි පියවර නොගතහොත් 2030 වසර වනවිට ලෝකයේ ළමුන්ගෙන් මිලියන 69ක් වැළැක්විය හැකි රෝග නිසා මිය යනු ඇත. එම වාර්තාව තවදුරටත් හෙළි කරන්නේ ළදරුවන් බිලියන 167ක් දරිද්‍රතාවයෙන් ජීවත් වන බවයි. එසේම කාන්තාවන් මිලියන 750ක් ළමා වියේදීම විවාහ වන බවයි.

ළමුන්ගේ තත්වය සම්බන්ධයෙන් නරකම සංඛ්‍යා ලේඛන වාර්තා වන්නේ අප්‍රිකාවේය. එහි මිලියන 247ක් ළමුන් ජීවත්වීම සඳහා අවශ්‍ය අවම පහසුකම් වත් නොමැති තරමේ දරිද්‍රතාවයක පෙළෙන බව එකී වාර්තාව පවසයි. එනම් ළමුන්ගෙන් 2/3ක්ම ජීවත් වන්නේ දරිද්‍රතාවයේය. තවද ලෝකයේ අනෙක් ප්‍රදේශවලට සාපේක්ෂව මෙම කලාපයේ ළමුන් වයස අවු. 5ට පෙර මිය යාම සඳහා ඇති ඉඩ දහ ගුණයකින් වැඩිය.

# කොලොම්බියාව ඓතිහාසික සාම මඟකට



ලතින් ඇමරිකානු ඉතිහාසයේ වැදගත් සිදුවීමක් සනිටුහන් කරමින් ජූනි 23දා කොලොම්බියාවේ විප්ලවවාදී සන්නද්ධ හමුදාව හෙවත් FRAC ගරිල්ලා සංවිධානය එහි ආණ්ඩුව සමඟ සටන් විරාම ගිවිසුමක් අත්සන් තැබීය. ඒ සඳහා අවශ්‍ය මැදිහත්වීම සිදුකරනු ලැබුවේ කියුබානු රජය හා නෝර්වේ රජයයි. දෙපාර්ශ්වය අතර සාම සාකච්ඡා අවුරුදු 03ක් පුරා පැවැත්වුණි.

1960 දශකයේදී ආරම්භ කෙරුණු මෙම ගරිල්ලා සංවිධානය සහ රජය අත ඇතිවූ ගැටුම්වලින් මේ වනවිට 2,20,000ක් පමණ මිය ගොස් ඇතැයි පැවසේ. 1990 වසරේදී සෝවියට් දේශය ප්‍රමුඛ සමාජවාදී කඳවුර බිඳවැටද්දී කලාපයේ අනෙකුත් රටවල ක්‍රියාත්මක වූ ගරිල්ලා සංවිධාන එක්කෝ විනාශකර දැමුණු අතර නැතිනම් ගරිල්ලා අරගලයෙන් ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලනයට පිවිසුණි. එහෙත් FRAC සංවිධානය එම කාලය තුළදී පවා වර්ධනය වූ අතර එක් කලක 17000ක පමණ ගරිල්ලා සාමාජික ප්‍රමාණයකින් එය සමන්විත විය.

එහෙත් හිටපු ජනාධිපති ඇල්වාරෝ උරිබේගේ කාලයේදී එනම් 2002 වසරේදී එක්සත් ජනපදයේ සහායෙන් ක්‍රියාත්මක වූ ගරිල්ලා විරෝධී ව්‍යාපාරයේදී FRAC සංවිධානයට දරුණු හානි පැමිනුණි. එහි ඉහළම පෙලේ නායකයින් අත්අඩංගුවට ගනු ලැබුණු අතර සමහරෙක් ඝාතනය කරනු ලැබිණි. ගරිල්ලා යුද ශක්තිය ගරිල්ලා සාමාජිකයින් 7000ක් දක්වා පහළ බැස්සේය.

අත්සන් කරනු ලැබූ සාම ගිවිසුමට අනුව දින 180කදී FRAC සංවිධානය සිය ආයුධ එක්සත් ජාතීන්ගේ සංවිධානයට බාරදිය යුතුය. ගරිල්ලා හමුදා තාවකාලික ප්‍රදේශ 23කට සහ කඳවුරු 8කට විසුරුවා හැරිය යුතුය. කොලාම්බියානු ආණ්ඩුව FRAC ගරිල්ලාවරුන්ගේ සහ ඔවුන්ගේ දේශපාලන මිතුරන්ගේ ජීවිත ආරක්ෂාව සැලැස්විය යුතු වේ.


# විගණකාධිපති කියන - ආණ්ඩුව නොකියන
# යහපාලන ණය අවුල

රජයේ විගණකාධිපතිවරයා විසින් පසුගියදා මුදල් අමාත්‍යාංශය විසින් ප්‍රකාශයට පත්කළ 2015 වසර සඳහා වන මුදල් අමාත්‍යාංශයේ වාර්ෂික වාර්තාවට ඇතුල් කළ තම වාර්තාවේ ආණ්ඩුවේ ණය ගැනීම් සීමාව පාර්ලිමේන්තුව අනුමත කළ ප්‍රමාණය ඉක්මවා යන බවට කළ සඳහන නිසා පාර්ලිමේන්තුව තුළත් ඉන් පිටතත් විශාල ආන්දෝලනයක් ඇතිවිය. ආණ්ඩුව තර්ක කළේ තමන් ණය ගැනීම නිවැරදි කර ඇති බවයි. විගණකාධිපතිවරයාද ස්වාධීන පුද්ගලයෙකු ලෙස තමන් ඉදිරිපත් කළ මතය වෙනුවෙන් සටන අත් නොහැර පෙනී සිටියේය.


ආණ්ඩුව තර්ක කර ඇත්තේ, විගණකාධිපතිවරයා ආණ්ඩුවට ගැලපෙන ලෙස ණය ගැන විගණන වාර්තාවේ සඳහන්කර නොමැති බවයි. කොටින්ම විගණකාධිපතිවරයා ආණ්ඩුවේ විගණකාධිපති නොවී ස්වාධීන විගණකාධිපතිවරයෙකු වීම ආණ්ඩුවට දරාගත නොහැකි වී තිබේ. මේ දෙපාර්ශ්වයේ අර්බුදය තුළින් රටට-ජනතාවට ගම්‍ය වන එක් වැදගත් සත්‍යයක් ඇත. ඒ, අන් යමක් නොව ලංකාවේ ආර්ථිකය කුමන ක්‍රමයට ගිණුම්ගත කළත් ගැලවීමට ඉඩක් පෙනෙන තෙක් මානයකවත් නොමැති දැවැන්ත ණය අර්බුදයක හිරවී ඇති බවය.

සාමාන්‍ය පිළිගත් සිද්ධාන්ත අනුව, රජයේ විගණකාධිපතිවරයා ස්වාධීන මතයක් ඉදිරිපත් කරන්නෙකු ලෙසට පිළිගැනීමට ලක්වේ. ලංකාවේද මෙතෙක් එම ධුරය දැරූ බොහෝ දෙනා ඒ පිළිගැනීමට ලක් වූවන්ය. ඒ නිසාම ඔවුන්ගේ මතය දේශපාලන ප්‍රහාරයකින් එකවර බිමට සමතලා කළ නොහැකිය. ඒ නිසාම විගණකාධිපතිවරයාගේ විගණන මතය ඉදිරිපත් කිරීමේදී ආණ්ඩුව ඔහු අභියෝගයට හා අපහාසයට ලක් කරනු වෙනුවට ඔහු විසින් මතු කර ඇති කරුණු විමසා බැලීම වඩා උචිතය.

විගණකාධිපතිවරයා මතු කරන ප්‍රධානම තර්කය වී ඇත්තේ, විසර්ජන පනතට අනුව, 2015 වසරේදී ආණ්ඩුවට නීති සීමාව යටතේ රු. බිලියන 1780ක් නොඉක්මවන සේ ණය ලබාගැනීමට හැකි වුවත් අදාළ වර්ෂයේදී (2015) දේශීය හා විදේශීය ලෙස ආණ්ඩුව විසින් රු. බිලියන 3394කුත් මිලියන 805ක් ණය ලබාගෙන තිබූ බවයි. එයින් 2015 වසර සඳහා ආණ්ඩුවට ණය ගැනීමට පාර්ලිමේන්තුව අනුමත කර තිබූ සීමාවට වඩා රු. බිලියන 1569කුත් මිලියන 805ක් ණය වැඩිපුර ලබා ගෙන ඇති බවයි. එසේම, 2015 දෙසැම්බර් 31 දිනට රජය විසින් ගෙවිය යුතු ණය ශේෂය රු බිලියන 7684කුත් මිලියන 954 වුවද නියැදි පරීක්ෂාවකදී අනාවරණය වී ඇත්තේ එය තවත් බිලියන 1025ක් අඩුවෙන් දක්වා තිබුණු බවයි.




ආණ්ඩුවම ප්‍රකාශයට පත් කරන විගණකාධිපතිතුමාගේ වාර්තාවද ඇතුළත් මුදල් අමාත්‍යාංශයේ වාර්ෂික වාර්තාවේ විගණකාධිපතිතුමාගේ ලේඛනයට පරස්පර සංඛ්‍යා දත්ත බොහෝමයක් ඇත.





එම ලේඛන අනුව 2015 අවසානයට සමස්ත රාජ්‍ය ණය ප්‍රමාණය රු. බිලියන 8503.3කි. එය 2014 වසරේ අවසානයට පැවති ප්‍රමාණය රු.බිලියන 7390.5කි. ඒ අනුව, 2015 වසරේදී ණය ගෙන ඇති ප්‍රමාණය වැඩිවීම රු. බිලියන 1112.3කි. නමුත් විගණකාධිපතිතුමාගේ ලේඛනය අනුව ආණ්ඩුව ණය ගෙන ඇති ප්‍රමාණය රු. බිලියන 3349කි. ආණ්ඩුව ණය ගත් ප්‍රමාණය ලෙස දක්වන ප්‍රමාණයට වඩා විගණකාධිපතිතුමා දක්වා ඇති ප්‍රමාණය රු. බිලියන (3349-1112.3) 2237කි. එය අසාමාන්‍ය ණය ගැනීම වැඩිවීමක් බව බැලූ බැල්මට පෙනී යයි.

## ආණ්ඩුව හා විගණකාධිපති

ආණ්ඩුවේ මුදල් අමාත්‍යාංශයේ වාර්තා හා විගණකාධිපතිවරයාගේ වාර්තා අතර මෙතරම් පරස්පරයක් මතුවී ඇත්තේ දෙපාර්ශ්වය කලින් සාකච්ඡා කර එක ඉලක්කමක් (හරි හෝ වැරදි) හදා නොගත් නිසා යැයි සමහරු මේ වැරැද්ද සාධාරණීකරණයට හේතු පහදති. නමුත් සත්‍යය එය නොවන බව ප්‍රකාශනවල මූලාශ්‍ර ලේඛන පිරික්සීමේදී පෙනී යයි.




විගණකාධිපතිවරයාගේ වාර්තා අනුව, 2015 වසරේ දේශීය හා විදේශීය මුළු ණය ගැනීම රු. මිලියන 3349,805 සකස් වී ඇත්තේ මෙසේය.

| | |
|---|---|
| විදේශීය ණය | 556,370 |
| භාණ්ඩාගාර බිල්පත් මගින් | 1532,545 |
| භාණ්ඩාගාර බැඳුම්කර මගින් | 926,357 |
| සංවර්ධන බැඳුම්කර මගින් | 334,533 |
| | 3349,805 |

නමුත් මුදල් අමාත්‍යාංශයේ අදාල රාජ්‍ය ණය පිළිබඳව 5.23 වගුව (පිටුව 90) පරීක්ෂා කිරීමේදී දැකිය හැකි තත්වය මෙපරිදිය.

මුදල් අමාත්‍යාංශයේ ලේඛන අනුව, 2015 වසරේදී නිකුත් කර ඇත්තේ 2014 වසර වඩා අඩු ප්‍රමාණයක බැඳුම්කරයි. නමුත් විගණකාධිපතිවරයාගේ ලේඛන අනුව භාණ්ඩාගාර බිල්පත් නිකුතුව මගින් රජය ලබාගෙන ඇති ණයවල ප්‍රමාණය රු. මිලියන 1532,454කි. භාණ්ඩාගාර බැඳුම්කර නිකුතුවද එලෙසමය, ආණ්ඩුවේ මුදල් අමාත්‍යාංශ වාර්තාව අනුව වසර තුළ නිකුත් කළ භාණ්ඩාගාර බැඳුම්කර ප්‍රමාණය බිලියන 461කි. නමුත් විගණකාධිපතිට අනුව, එම අගය රු. බිලියන 926කි. එයි වෙනස රු. බිලියන 465ක් ඉක්මවයි.

| අයිතමය | 2014 අවසානයේ | 2015 අවසානයේ වෙනස | 2015 වසරට(රු.බිලියන) |
|---|---|---|---|
| සමස්ත දේශීය ණය | 4277.8 | 4959.2 | 681.4 |
| භාණ්ඩාගාර බිල්පත් | 694.8 | 658.2 | -36.6 |
| ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර | 391.1 | 668.5 | 277.4 |
| මුළු විදේශ ණය | 3113.1 | 3544.0 | 430.9 |
| මුළු රාජ්‍ය ණය | 7390.9 | 8503.2 | 1112.3 |

මෙම දෙපාර්ශ්වයේ ලේඛනවල බරපතළම ගැටලුව වී ඇත්තේ භාණ්ඩාගාර බිල්පත් නිකුතුව ගණනය කර ලේඛනගත කිරීමේදී ආණ්ඩුව

> සාමාන්‍ය පිළිගත් සිද්ධාන්ත අනුව, රජයේ විගණකාධිපතිවරයා ස්වාධීන මතයක් ඉදිරිපත් කරන්නෙකු ලෙසට පිළිගැනීමට ලක්වේ. ලංකාවේද මෙතෙක් එම ධුරය දැරූ බොහෝ දෙනා ඒ පිළිගැනීමට ලක් වූවන්ය. ඒ නිසාම ඔවුන්ගේ මතය දේශපාලන ප්‍රහාරයකින් එකවර බිමට සමතලා කළ නොහැකිය. ඒ නිසාම විගණකාධිපතිවරයාගේ විගණන මතය ඉදිරිපත් කිරීමේදී ආණ්ඩුව ඔහු අභියෝගයට හා අපහාසයට ලක් කරනු වෙනුවට ඔහු විසින් මතු කර ඇති කරුණු විමසා බැලීම වඩා උචිතය.

## ණයවල ණය

මුදල් අමාත්‍යාංශයේ වාර්ෂික වාර්තාව අනුව, 2014 වසරේ රු. බිලියන 7390.9ක් වූ රාජ්‍ය ණය මුළු ප්‍රමාණය 2015 වසරේදී රු. බිලියන 1112.3කින් වැඩිවී රු. බිලියන 8503.2ක් වී ඇත. මෙම රාජ්‍ය ණය ප්‍රමාණයෙන් බිලියන 4932.2ක් දේශීය ණයද රු. බිලියන 3544ක් විදේශීය ණයද වශයෙන් වේ. 2014 වසරේදී දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස 70.7%ක් වූ රාජ්‍ය ණය ප්‍රමාණය 2015 වසරේදී 76%ක් දක්වා වර්ධනය වී ඇත. නමුත්, විගණකාධිපතිවරයාගේ මතය අනුව වන 2015 වසරේදී ණය ප්‍රමාණය බිලියන 3349.8ක් ලෙස සැලකුවහොත් රටේ රාජ්‍ය ණය ප්‍රමාණය 2015 වසරේදී රු. බිලියන 10,740.7ක් වනු ඇත. රටේ ණය බර ජනගහනයට අනුපාතිකව සැලකුවහොත් සෑම පුරවැසියෙකුම රු. 429,000ක පමණ ණයකරුවෙකු කර ඇත.

රටේ ජනතාවට වැදගත් වන්නේ මුදල් අමාත්‍යාංශයද විගණකාධිපතිවරයාද යන්න නොවේ. මේ වැට් වදින - දඩ වදින ආර්ථික පීඩනයට සැබෑ විසඳුම් ඇත්තේ කවුරුන් ළඟද යන්න පමණි.



"යම්කිසි එක් රටක සමාජවාදී ආණ්ඩුවක් ජය ලැබූ මොහොතේ සිට, ප්‍රශ්න විසඳිය යුත්තේ, එක් හෝ තවත් අධිරාජ්‍යවාදයක් වඩාත් යෝග්‍යයද යන්න අනුව නොව, දැනටමත් ආරම්භ වී ඇති සමාජවාදී විප්ලවයේ වර්ධනයට හා තහවුරු වීමට අදාල තත්වයන්ගේ සුවිශේෂී දෘෂ්ටි කෝණය අනුවය."

**ලෙනින්**
**විප්ලවවාදී වාග් පාඨ**
**11 පිටුව**


# බදු වෙනුවෙන් කප්පාදු වන අපේ ජීවිත

"මේ ලෝකය තුළ මරණය හා බදු හැර ස්ථිර වූ කිසිවක් නැත.''යි වරෙක බෙන්ජමින් ෆ්‍රැන්ක්ලින් පවසා ඇත. කෙනෙකුගේ ජීවිත කාලය තුළ මරණයට මුහුණදීමට වන්නේ එක් වරක් වන නමුදු බදු යනු මුළු ජීවිත කාලය පුරාවටම ගෙවීමට සිදුවන දෙයකි.

මෙරට පැවති හා පවතින ආණ්ඩු විසින් කලින් කලට අලුතින් බදු වර්ග හඳුන්වා දෙමින් එම බදු, වරින් වර වැඩි කළා මිස අඩු කිරීමක් කර නොමැත. තාවකාලිකව අඩු කිරීමක් කළා නම් ඒ මැතිවරණයක් අභියස තමන්ගේ බලය රැක ගැනීම උදෙසාය. බලය ලබාගත් පසු සිදුවන්නේ නැවත ක්‍රමයෙන් බදු වැඩි කිරීමය. වත්මන් ආණ්ඩුව විසින් පසුගියදා වැඩි කළ වැට් පිටුපසද ඇත්තේ එවැනි කතන්දරයකි.

මෙසේ බදු වැඩි කිරීම සමස්ත සමාජයටම බලපාන නමුත් එයින් වඩාත් වැඩි පීඩාවකට ලක්වන්නේ මෙරට කාන්තාවන්ය. ඒ, කාන්තාවන් පවුලේ පෝෂණය හා සෞඛ්‍යය සම්බන්ධයෙන් වැඩි මැදිහත් වීමක් කරනු ලබන බැවිනි. වෙළෙඳපොළින් රැගෙන යන බඩු මල්ල ක්‍රමයෙන් කුඩා වනවිට, ඇතැම් පෝෂ්‍යදායී ආහාර වර්ග බඩු ලැයිස්තුවෙන් කපා දැමීමට සිදුවන විට, දරුවන්ට ලබා දිය යුතු සමබර ආහාර වේල සිහිනයක් පමණක් වනවිට එයින් වඩාත් පීඩාවට පත්වන්නේ කාන්තාවන්ය.

එසේම තම පවුලේ සෞඛ්‍ය ගැටලු සම්බන්ධයෙන් දැරීමට සිදුවන මුදල ඉහළ ගොස් ඇතිවිටෙක, රජයේ රෝහලකට ගියද පිටතින් පරීක්ෂණ කර ගැනීමට,



බෙහෙත් මිලදී ගැනීමට සිදුවන විට ඒ සඳහා උපයන ආදායමෙන් වැඩි මුදලක් වැය කිරීමට සිදුවන විට එයින් වඩාත් අර්බුදයට පත්වන්නේ කාන්තාවන්ය.

අප රටේ විදෙස් විනිමය සංචිතයට වැඩි දායකත්වයක් ලබා දෙන්නේ ගෘහ සේවය සඳහා විදෙස්ගත වී ඇති කාන්තාවන්ය. මෙරට සිටින ඔවුන්ගේ සමීපතමයන්, දරුවන් ඔවුන් හා සම්බන්ධය පවත්වා ගන්නේ දුරකතනය මගිනි. දේශීයව හා විදේශීයව රැකියාව හා දුර බැහැරව කටයුතු කරන සියලු දෙනාම තම පවුලේ අය සමඟ, නෑදෑ හිතමිත්‍රාදීන් සමඟ සම්බන්ධතාවයන් පවත්වා ගැනීමට වර්තමානයේ වඩාත් වැඩියෙන් භාවිතා කරන්නේ දුරකතනයයි. බදු වැඩි කිරීම තුළ දුරකතන බිල සඳහා මේ වනවිට ගෙවන මුදලින් භාගයකට ආසන්න මුදලක් බදු ලෙස ගෙවීමට සිදුවන විට කප්පාදු වන්නේ එම මානව සබඳතාවන්ය; පවුල් බැඳීම්ය.

රටේ සෑම පුරවැසියෙකුටම බදු ගෙවීමට සිදුවන නමුත් අපට බදු බරක් වී ඇත්තේ කුමක් නිසාද? බදු වැඩි වීමේ ප්‍රමාණයට සාපේක්ෂව අපගේ පඩිපත වැඩි නොවන නිසාය; අපගේ නිෂ්පාදනයන්ට සාධාරණ මිලක් නොලැබෙන නිසාය. ආදායමට උසුලාගත නොහැකි ආකාරයට අසාධාරණ ලෙස බදු වැඩි කරන විට එය අපගේ ජීවිත උඩු යටිකුරු කරන්නේ එබැවිනි. පැවති හා පවතින ආණ්ඩුවල නාස්තිකාර වියදම්, දූෂණ වංචා දිගටම සිදුවන තත්වයක් තුළ මෙය වඩාත් බරපතල වී ඇත.

නිෂ්පාදන ආර්ථිකයක් නොමැති රටක, බදු හා ණය ගැනීම ප්‍රධාන ආදායම් මාර්ගය කරගත් රටක ජීවත්වන අපට බදුවලින් පීඩාවට පත්වීම ජාති ලක්ෂණයක් බවට පත්ව ඇත. කාලාන්තරයක් තිස්සේ මෙවැනි තත්වයන්ට මුහුණදීම නිසා අපේ බහුතරයක් කාන්තාවෝ 'කවුරු ආවත් මෙය වෙනස් කළ නොහැකියි, අපි හම්බ කරගත්තොත් තමයි අපිට කන්න පුළුවන් වෙන්නෙ' වැනි අදේශපාලනික මති මතාන්තරවල සිරවී සියල්ල ඉවසා සිටින තත්වයකට පත්ව සිටිති. සමාජය තුළ, පවුල තුළ ආර්ථික වශයෙන් වඩාත් වැඩි පීඩාවකට ලක්වන්නන් ලෙස අප තේරුම් ගත යුතු දෙයක් ඇත. රටට හිතකර ආර්ථික ප්‍රතිපත්තියක් තුළ මෙම තත්වයන් වෙනස් කළ හැකි බවය. එසේ වෙනස් කළ ජනතාවන් මේ ලෝකය තුළ සිටින බවය. බලයට පත්වන ආණ්ඩු විසින් අප මත පටවන සියලු පීඩාවන් නිහඬව ඉවසා සිටීම වෙනුවට කාන්තාවන් ලෙස අප ආණ්ඩුවලට බලපෑම් කරන පිරිසක් බවට පත්විය යුතුව ඇත්තේ ඒ නිසාය.

## සිව්දෙසින්

### 'ඉවත්ව යනු' හමුදා කඳවුරට විරෝධය...




ජපානයේ ඔකිනාවා හි පවත්වාගෙන යනු ලබන අමෙරිකා එක්සත් ජනපද හමුදා කඳවුර ඉවත් කර ගන්නා ලෙසට බල කරමින් ජපන් වැසියන් දස දහස් ගණනක් ඔකිනාවා වෙතට ජුනි 19 දින එක්රැස් වී විරෝධතා රැලියක් පවත්වන ලදි.

සිවිල් කම්කරුවකු ලෙස එම කඳවුරේ සේවය කළ හිටපු අමෙරිකානු නාවික සෙබළෙකු විසින් 20 හැවිරිදි ජපන් ජාතික තරුණියක් ලිංගික අතවරයට ලක්කර මරා දැමීම හේතුවෙන් ජපන් ජාතිකයන් නැවතත් මෙසේ විරෝධතාවය දක්වා ඇති බව වාර්තා වේ.

1995 වසරේදීද වයස අවුරුදු 12ක දැරියක් සමූහ ලිංගික අතවරයකට ලක්කිරීම සම්බන්ධයෙන් එම කඳවුරේ අමෙරිකානුවන් තිදෙනෙකුට චෝදනා එල්ල විය.

ඔකිනාවා හි හමුදා කඳවුර වසර 27ක් තිස්සේ පවත්වාගෙන යන අතර එහි හමුදා භටයින් 26 000ක් සිටින බව පැවසේ.

### 'ලිංගික දූෂණ සංස්කෘතිය'ට එරෙහිව වීදි බසී!




බ්‍රසීලයේ සාඕ පාවුලෝ නගරයේ 'ලිංගික අතවර සංස්කෘතියට' එරෙහිව විශාල විරෝධතා පෙළපාලියක් හා රැලියක් ජුනි 02 දින පැවැත්විණි. එයට බ්‍රසීල කාන්තාවන් 5 000කට අධික පිරිසක් සහභාගි වූ බව වාර්තා වේ.

බ්‍රසීලයේ රියෝ ද ජනෙයිරෝ හිදී 16 හැවිරිදි ගැහැණු ළමයෙකු සමූහ ලිංගික අඩන්තේට්ටමකට ලක් කිරීම මෙම විරෝධතාවයට හේතු පාදක වූ අතර

විරෝධතාකරුවෝ බ්‍රසීලයේ වර්ධනය වෙමින් ඇති ලිංගික අතවරයන්ට, ගෘහස්ථ හිංසනයට හා අනෙකුත් ලිංගික අපචාරයන්ට එරෙහිව හඬ නැගූහ.

අධ්‍යයනයන්ට අනුව බ්‍රසීල කාන්තාවන් 7.5%ත් 10%ත් අතර ප්‍රමාණයක් ලිංගික හිංසනයන්ට ගොදුරුවන බව හෙළි වී ඇත.

## ඔවුන් සොයා අතීතයට...



ෆිදෙල් කැස්ත්‍රෝ

සීලියා සාන්චේස්



සීලියා සාන්චේස්

හයිඩි සාන්තමරියා



විල්මා එස්පින්



මෙල්බා හර්නැන්දේස්

කියුබන් විප්ලවය සිදුවූයේ මීට අවුරුදු 57කට ඉහතදීයි. ඒ, 1959 ජනවාරි 01 දිනයි. එම විප්ලවය විජයග්‍රහණය කරවීමේ මූලික අඩිතාලම දැමුණේ 1953 ජුලි 26 මොන්කාඩා ප්‍රහාරයෙන්. ඒ ප්‍රහාරයට සහභාගි වුණේ ෆිදෙල් කැස්ත්‍රෝගේ නායකත්වය යටතේ 125 දෙනෙකුගෙන් සමන්විත විප්ලවවාදී කණ්ඩායමක්. ඒ කණ්ඩායමට ඇතුළත්ව සිටියා විප්ලවවාදී කාන්තාවන් දෙදෙනෙකුත්. ඒ, හයිඩි සාන්තමරියා හා මෙල්බා හර්නැන්දේස්.

මොන්කාඩා ප්‍රහාරය අසාර්ථක වීමත් සමග බොහෝ සටන්කාමීන් කුරිරු වධ බන්ධනයන්ට ලක්කර මරා දැමුවේ එවකට බලයේ සිටි ඒකාධිපති බැටිස්ටාගේ හමුදාව විසින්. සිරබාරයට පත් ඉතිරි අය අතර හයිඩිත් මෙල්බාත් සිටියා. 1953 ප්‍රහාරයෙන් පසුව ඇති වූ ජුලි 26 ව්‍යාපාරය සමග සම්බන්ධ වෙමින් කියුබන් විප්ලවය ජයග්‍රහණය කිරීමට දායක වූ කාන්තාවන් අතරින් සීලියා සාන්චේස් හා විල්මා එස්පින් කැපී පෙනෙන තවත් විප්ලවවාදී චරිත දෙකක්.

හයිඩි, මෙල්බා, සීලියා, විල්මා මේ සුවිශේෂී විප්ලවවාදී කාන්තාවන් හතර දෙනාම මේ වනවිට මෙලොවින් සමුගෙන ඇතත් කියුබන් විප්ලවය ජයග්‍රහණය කරවීමට හා ජයග්‍රහණයෙන් පසු ඔවුන් ඉටුකළ දැවැන්ත කාර්යභාරය අප සිත් තුළ සදා රැඳී පවතීවි.

දැනුම සමාජය හා චින්තනය 06

# මිථ්‍යාව තවමත් පවතින්නේ ඇයි?


මානව සමාජය තුළ දැනුම සංවර්ධනය වීමේදී සත්‍යය, මිථ්‍යාවන් හා අසත්‍යය සමග සිදු කළ අරගලය දැවැන්ත එකක් විය. එහිදී සත්‍යය වෙනුවෙන් මහා කැපකිරීම් සිදු කිරීමට ඒ වෙනුවෙන් පෙනී සිටි අයට සිදු විය. එතරම් මහා කැපකිරීම් කරමින් විද්‍යාව සංවර්ධනය කරමින් සමාජය පෙරට ආවද තවමත් මානව සමාජයේ විශාල පරාසයක් තුළ අවිද්‍යාව හෙවත් මිථ්‍යාව පවතී. විද්‍යාව සමග එකට පැවතීමට මිථ්‍යාවට නොහැකි වුවද එය එලෙස පවතී. දැනුම තුළ වන එකී ප්‍රතිවිරෝධය නිවැරදිව තේරුම් ගැනීම අවශ්‍යය.

මේ වනවිට ධනවාදය තුළ මිනිසා විද්‍යාවේ දැවැන්ත සොයා ගැනීම් සිදු කර තිබේ. ගුරුත්වාකර්ෂණයෙන් මිදෙන විද්‍යාත්මක නියාම සොයාගත් ඔහු දැන් අධිවේගී රොකට්වලින් අභ්‍යාවකාශ යානාවලින් අභ්‍යාවකාශයේ සැරි සරයි; සඳ මතට ගොඩ බසියි; අඟහරු වෙත මිනිසුන් රහිත යානා යවයි; විශ්වයේ ඇති තරු ගැන, තරු පොකුරු ගැන, මන්දාකිණි ගැන, විශ්වයේ බිහිවීම ගැන විද්‍යාත්ම උපකල්පන ගොඩනගා ඒවා පරීක්ෂණ නිරීක්ෂණ මගින් තහවුරු කොට නිගමනයන්ට පැමිණ විශ්වයේ බොහෝ රහස් හෙළිකර ගෙන සිටියි. එසේ තිබියදීම බොහෝ මිනිස්සු තවමත් 'අපට ඉහළින් ඇති' දෙව්ලොවක් ගැන, ස්වර්ගයක් ගැන විශ්වාස කරති. විශ්වය ගවේෂණය කරන විද්‍යාඥයින්ට 'අපට ඉහළින් ඇති' දිව්‍ය ලෝක හමුවී නැතත් මිනිස්සු තවමත් එය විශ්වාස කරති.

**පාඩම් ඉගෙන නොගැනීම**

එසේම විශ්වය තුළ පවතින විවිධ තරංග වර්ග හඳුනාගත් මිනිසා එම තරංග මානව සමාජයේ විවිධ අවශ්‍යතා වෙනුවෙන් උපයෝගී කර ගනියි; විවිධ කිරණ වර්ග හඳුනාගෙන ඒවායින් වැඩ ගනියි. එහෙත් ඒ අතරම මිනිස්සු තවමත් චිත්ත ශක්තිය ගැන, නොපෙනෙන අද්භූත බලවේග ගැන විශ්වාස කරති. රෝග සුව කිරීමේදී වෛද්‍ය විද්‍යාව ලබා ඇති ප්‍රගතියද විශ්මිතය. එහෙත් එලෙස තිබියදී බොහෝ ජනතාව තවමත් රෝග සුව කර ගැනීමට වෛද්‍යවරයා, වෛද්‍ය විද්‍යාව විශ්වාස කරනවා වෙනුවට මිථ්‍යාවත් ආගමික ස්ථානත් විශ්වාස කරති; ඉන් හානිද කර ගනිති. මෑතකදී අනුරාධපුර ප්‍රදේශයේ රෝගී කාන්තාවකට මතුරන ලද දෙහි බෑයක් බලෙන් ගිල්ලවීමට ගොස් ඇය මිය ගිය ප්‍රවෘත්තියක් වාර්තා කර තිබුණි. හොර කපුවා අත්අඩංගුවට ගෙන තිබේ. ඊට පෙරද රෝගී දරුවකුට එක්තරා ආගමික නිකායක මධ්‍යස්ථානයකදී ඖෂධ නොදී ජලය පමණක් පොවමින් සිටීම නිසා දරුවා මිය ගිය පුවතක් වාර්තා විය. එහෙත් ඉන් මිනිසුන් පාඩම් ඉගෙන ගන්නා බවක් නොපෙනේ. ගැටලුව වන්නේ සමහර වෛද්‍යවරු පවා රෝගීන් මෙවැනි මිථ්‍යාවන් වෙත යොමු කරවීමය.

එක් ඉතාලි කියමනක මෙසේ තිබේ. "රෝගියා මිය ගියහොත් වෛද්‍යවරු ඔහු මරා දැමුවෝය. රෝගියා සුව වුවහොත් දේව දූතයෝ ඔහු බේරා ගත්තෝය". යනුවෙනි. ඉන් කියැවෙන්නේද මිනිසුන් මිථ්‍යාවට යට වූ විට සිතන ආකාරය ගැනය.



සමාජය තුළ, මානව දැනුම තුළ පවතින මෙම ප්‍රතිවිරෝධය මෙලෙස පවතින්නේ ඇයි? සමාජ විඥානය තුළත් පුද්ගල විඥානය තුළත් තවමත් මිථ්‍යාව පවතින්නේ ඇයි? මේ ප්‍රශ්නවලට පිළිතුරු සොයා ගත යුතුය. ඇත්ත විශ්වාස කිරීමට මැලිවන මිනිසා මිථ්‍යාව ප්‍රශ්න නොකරම පිළිගන්නේ ඇයිද යන්න විමසා බැලිය යුතුය. සමහර අයට මිනිසා සඳ තරණය කිරීම බොරුවකි. එහෙත් දෙව් ලොවක් තිබීම සත්‍යයකි.

**මිථ්‍යාවන් පැවැත්මේ කොන්දේසි**

අප ජීවත් වන මෙම 21වැනි සියවසේදී විද්‍යාවේ ජයග්‍රහණ මෙතරම් තිබියදීත් මිථ්‍යාව සහ අසත්‍යය පවතින්නේ අහම්බයක් ලෙස නොවේ. ඒවායේ පැවැත්මේ කොන්දේසි හෙවත් හේතු පවතින්නේද මේ සමාජය තුළමය. මෙම සමාජ ක්‍රමය තුළය. දැනුම තුළ මිථ්‍යාවට එරෙහිව සත්‍යය වෙනුවෙන් සටන් කර අය සියල්ලට පෙර එම සත්‍යය අවබෝධ කර ගත යුතුය.

වර්තමාන සමාජය තුළ මිථ්‍යාවන්ගේ පැවැත්මට උපකාරී වන හේතු රැසක් පවතින අතර ඉන් ප්‍රධාන හේතු කිහිපයක් තිබේ. ඒවා නම්,

i. නූගත්කම හා ගතානුගතික බව නිසා ii. ආර්ථිකමය හා ලාභ ඉපැයීමේ අවශ්‍යතා නිසා

> මිනිසුන් මිථ්‍යා විශ්වාසවලට යොමු වීමේ අතීත හේතු පැවතුණේ ඔහු සොබාදහම වටහා ගැනීමට අපොහොසත් වීමත් ඊට බිය වීමත් නිසාය. ඈත අතීතයේ මිනිස්සු ගස්, ගල්, ඉර, හඳ, ගින්දර ආදියට දේවත්වය ආරෝපණය කොට වඳිනු ලැබුවේ සොබාදහම තේරුම් නොගැනීම හා එහි දේවල්වලට බිය වූ නිසාය. සමාජය තුළ වර්තමානයේද මිත්‍ය විශ්වාස පිටුපස වැඩිපුරම දුවන්නේ කවුද? ඒ, බියට පත් මිනිසුන් හා දුකට පත් මිනිසුන්ය.

iii. සමහර සමාජ සංස්ථාවන්ගේ ආයතනයන්ගේ පැවැත්ම උදෙසා
iv. දේශපාලනමය හා පංතිමය අවශ්‍යතා උදෙසා යන හේතූන්ය.

මෙම හේතු වෙන වෙනමත් එක්වත් සමාජය තුළ මිථ්‍යාවන් හා බොරු ප්‍රතිනිර්මාණය කිරීමත් පවත්වාගෙන යෑමත් සිදුකරන බව හොඳින් නිරීක්ෂණය කරන විට පැහැදිලි වේ.

**i. නූගත්කම හා ගතානුගතික බව**

වත්මන් සමාජය තුළ, දැනුම තුළ, මිථ්‍යාව හා බොරුව පැවතීමට බලපාන ප්‍රධාන සාධකයක් වන්නේ, මිනිසුන්ගේ නූගත්කම, ගතානුගතික බව හා ඒ මත නිර්මාණය වන බිය හා සැකයයි. මෙම තත්වයට මුළුමනින්ම වගකිව යුත්තේ මිනිසුන් නොව පවතින ධනවාදී සමාජයයි. මේ වනවිට ලෝක ජනගහනය බිලියන 7ක් හෙවත් කෝටි 700ක් ඉක්මවා තිබේ. එහෙත් අප 21 වැනි සියවසට පා තබන විටත් ලෝක ජනගහනයෙන් 1/7ක් හෙවත් බිලියන එකක් පාසල් අධ්‍යාපනය නොලැබූවන් බව වාර්තාවලින් පෙන්වා දේ. ලෝක ජනගහනයෙන් බිලියන එකක් නූගත්කමේ ගිල්වා අධ්‍යාපනයෙන් පිටමං කර ඇති සමාජයක, ඉතිරි බිලියන හයෙනුත් විශාල ප්‍රමාණයක් අතරමඟදී පාසල් අධ්‍යාපනය අවසන් කර ජීවන අරගලයට බසින සමාජයක, විද්‍යාවේ දැනුම ඉතාම සීමිත පිරිසකට පමණක් සීමා කොට ඇති ලෝකයක, අධ්‍යාපනයේදී විද්‍යාව සමග මිථ්‍යාවන්ද ආගමික සංකල්පද උගන්වන ලෝකයක පුදුම විය යුත්තේ මිථ්‍යාව නොපවතින්නේ නම්ය.

ලොව මිථ්‍යා විශ්වාස වැඩිපුරම පවතින්නේ, ලෝකයේ පසුගාමී සංවර්ධනයක් සහිත රටවල හා විවිධ ජන කණ්ඩායම් තුළය. ලොව මෙවැනි බොහෝ රටවල විවිධ ජන සමාජයන් හා කණ්ඩායම් වෙත විද්‍යාවේ දැනුම, අධ්‍යාපනය ගලා නොයන විට ඔවුන්ගේ චින්තනයේ පරාවර්තනය වන්නේ මොනවාද? ඒ, ලෝකය පිළිබඳ නව දැනුම නොව පරපුරෙන් පරපුරට පැවත ආ මිථ්‍යාවන්ය. මිනිසුන්ගේ ගතානුගතික බවද මෙයට එක්වූ විට මිනිසා මිථ්‍යාවන් තුළ ගිලී යෑම අරුමයක් නොවේ.

මිනිසුන් මිථ්‍යා විශ්වාසවලට යොමු වීමේ අතීත හේතු පැවතුණේ ඔහු සොබාදහම වටහා ගැනීමට අපොහොසත් වීමත් ඊට බිය වීමත් නිසාය. ඈත අතීතයේ මිනිස්සු ගස්, ගල්, ඉර, හඳ, ගින්දර ආදියට දේවත්වය ආරෝපණය කොට වඳිනු ලැබුවේ සොබාදහම තේරුම් නොගැනීම හා එහි දේවල්වලට බිය වූ නිසාය. සමාජය තුළ වර්තමානයේද මිථ්‍ය විශ්වාස පිටුපස වැඩිපුරම දුවන්නේ කවුද? ඒ, බියට පත් මිනිසුන් හා දුකට පත් මිනිසුන්ය.

මෙය න්‍යායිකව තේරුම් කරන්නේ නම් මිනිසාගේ 'බිය' ඇති වන්නේ, සොබාදහමේ නියාම තේරුම් නොගැනීම නිසාය. මිනිසාගේ 'කරදර' හා 'දුක' පවතින්නේ පංති සමාජය තුළ පවතින සූරාකෑම, පංති පරතරය, අසාධාරණය, අයුක්තිය, මර්දනය ලෙඩ රෝග හා අපරාධ නිසාය. එය එලෙස වටහා ගත්විට මෙම ඛේදවාචකයේ වගකීමෙන් ධනවාදයට මිදීමට නොහැක. එහෙත් ඒ වෙනුවට දුක් කරදරවල වගකීම පෙර කරුමයට හෝ, ග්‍රහලෝකවලට පැවරූ විට ධනවාදය එහි වගකීමෙන් නිදහස් වේ. සිදුවී ඇත්තේ එයයි. එසේම ප්‍රකෘතිය තේරුම් ගැනීමට මිනිසා අසමත් වීම නිසා, එය ඔහුට තේරුම්කර නොදීම නිසා මිනිසා විශ්වීයත්වය හා විශේෂිතය වටහා නොගනී. ඔහුට සමහර විශේෂිතයන් පොදු විශ්වීය දේවල් ලෙස පෙනේ. මැලිබන් මුදලාලි පොහොසත් වූ ආකාරය විශේෂයක් ලෙස නොසලකා එය පොදු දෙයක් ලෙස සලකන්නේ ඒ අනුවය. මිනිසා අනිවාර්ය හා අහම්බය තේරුම් නොගත් විට සිදු වන්නේ කුමක්ද? අහම්බ සිදුවීම්වලට මිථ්‍යාව ආරෝපණය කිරීමයි. හූනන් ඇඩීම, බල්ලන් කන්පට ගැසීම අසුබ යැයි මතයක් හැදෙන්නේ ඒ අනුවය. පලාපල කීම, සාස්තෘ කීම පිළිගැනෙන්නේද අහඹු ලෙස අනාවැකි සත්‍ය වීම පදනම් කර ගෙනය. ජෝතිෂ්‍ය අනාවැකි 100ක් බොරු වී අහම්බයෙන් එකක් ඇත්ත වූ විට මිනිස්සු එම එක් අහම්බය මත සිය විශ්වාසය ගොඩනගා ගනිති. හරය හා පෙනුම තේරුම් නොගැනීම නිසාද හේතුව හා ඵලය තේරුම් නොගැනීම නිසාද මිනිසා මිථ්‍යාවන්ට වැටුණු බව පැහැදිලිය. පෘථිවි කේන්ද්‍රවාදය නිර්මාණය වූයේ හරය හා පෙනුම තේරුම් නොගත් නිසාය. එනම් හරයෙන් නොව පෙනුමෙන් සූර්යයා පෘථිවිය වටා ගමන් කරනා සේ පෙනුණ නිසාය. තමන්ගේ දුප්පත්කමට, කරදරවලට, ස්වභාවික විපත්වලට හේතුව පෙර කළ කර්මය හෝ ග්‍රහ බලපෑම් යැයි සිතන්නේද

15වැනි පිටුවට

නියමුවා



"විඥානය සත්තාවෙහි ප්‍රතිඵලයක් වන බවත්, එහි විලෝමය සිදු නොවන බවත් ද්‍රව්‍යවාදයේ පොදු වශයෙන් විස්තර කරනු ලබන නිසා, එසේ විට, ද්‍රව්‍යවාදය මිනිස් වර්ගයාගේ සමාජ ජීවිතයට ගලපන කල සමාජ විඥානය සමාජ සත්තාවේ ප්‍රතිඵලයක් ලෙසට විස්තර කිරීමට සිදුවේ."

**ලෙනින්**
**තෝරාගත් කෘති,**
**1වන වෙළුම -**
**20 වැනි පිටුව**

# ආපදා කළමනාකරණය සහ කළමනාකරණයේ ආපදාව

ආපදාවක් ස්වාභාවික ආපදාවක් ඃහ්එමර්ක ඃසීඑුර* මිනිස් ක්‍රියාකාරකම් විසින් ඇති කරන ලද ආපදාවක් (Man Made Disaster) අද නිතර අසන්නට ලැබෙන මාතෘකාය. මෙම ආපදාවක් යන්න බොහෝ නිර්වචන ඇතත් ස්වාභාවික හෝ ස්වාභාවික නොවන ආකාර මගින් ජන ජීවිත හා දේපළවලට (life and property) දැඩි හානි පැමිණේ නම් එය ආපදාවකි. (එය සිදුවන කාල පරාසය තත්පර දශම ගණනක් හෝ වසර කිහිපයක් විය හැක.) අප ජීවත් වන ජන සමාජ ක්‍රමය ධනවාදී ආර්ථික ක්‍රමයකි. ධනවාදී ආර්ථික ක්‍රමය තුළ මිනිස් ජීවිත හා දේපළ යනු මුදල් වන අතර ප්‍රධාන වශයෙන් මෙම දෙකෙහි එකතුවෙන් සමාජයේ ආර්ථිකය නිර්මාණය වී ඇත. ධනවාදයේ ආර්ථිකයට සිදුවන හානි ආපදාවක් ලෙස අර්ථකතනය කිරීමට ඇතැම් විද්වත්හු උත්සහ කරමින් සිටිති. නමුත් මෙම ඊනියා බුද්ධිමත්හු ධනවාදයේ පැවැත්ම වෙනුවෙන් තෙල් නිධි හා ඛනිජ සම්පත් වෙනුවෙන් අරාබිකරයෙත් අප්‍රිකා මහද්වීපයේත් බොහෝ රාජ්‍යවල සිදුවන මිනිස් සංහාරයත් ටොන් ගණනින් වූ බෝම්බවලින් සිදුවන දේපළ විනාශ ආපදාව ලෙස නොදකිති. අප රටේ යුද හමුදාව මූලික කරගෙන පිහිටුවා ඇති ආපදා කළමනාකරණ දෙපාර්තමේන්තු පනත සෑදීමේදී රටේ ආර්ථික අර්බුද නිසා හටගනු ලබන ජන අරගලද ආපදා ලෙස අර්ථකථනය කිරීමට ඇතැම් ඊනියා බුද්ධිමත්හු උත්සහ කළහ.

අප රටේ සිදුවන ආපදාවන් මොනවාද යන්න සලකා බැලූ විට බහුලව ඊසාන දිග මෝසම හේතුවෙන් නොවැම්බර් මස උතුර, උතුරු මැද, නැගෙනහිර, වයඹ පළාත්වල සිදුවන ගංවතුර හා නැගෙනහිර දිශාවට වන්නට සිදුවන මධ්‍ය කඳුකරයේ නායයාම්ද, අගෝස්තු-සැප්තැම්බරයේ සිදුවන නියං තත්වයක්ද, මැයි මස නිරිත දිග මෝසම සක්‍රිය වීම හේතුවෙන් උතුරු බස්නාහිර වයඹ පළාත්වල ඇති වන ගංවතුර, මධ්‍ය කඳුකරයේ බටහිරට වන්නට සිදුවන නායයෑම් තත්වයන්ද බොහෝ විට නොවැම්බර් මස ඇති වන සුළි සුළං තත්වයන් ආදී ස්වාභාවික ලෙස පෙනෙන සිදුවන ආපදා ලෙස හඳුනා ගෙන ඇත. මධ්‍ය කඳුකරයේ සිදුවන නායයාම් ස්වාභාවික ක්‍රියාවලියක් වන අතරම ධනපති ක්‍රමය විසින් එය වඩාත් තීව්‍ර කර ඇත. පොදුවේ අප රටේ සිදුවන හා සිදුවිය හැකි ආපදාවන් සැලකූ විට ඒවායේ හේතුකාරක අවබෝධ කර ගැනීම සඳහා අංක 01 වගුව පාවිච්චි කළ හැක. අංක 1 සිට 7 දක්වා වූ ආපදාවන් සඳහා ස්වාභාවික බලපෑම වැඩි වුවත් ඉන් පහළට වූ ආපදාවන් සඳහා ධනපති ක්‍රමයේ බලපෑම ඉතා ඉහළය. ගංවතුර සඳහා ධනපති ක්‍රමයේ බලපෑම වඩා තීව්‍ර කර ඇත්තේ, පැයක් ඇතුළත මි.මී.100 ගණනට වඩා වැඩි වර්ෂාපතනයන්ය. එවැනි වර්ෂාපතනයන් ලැබීමට ප්‍රධානතම හේතුව වනුයේ පාරිසරික උෂ්ණත්වය ඉහළ යාමය. ධනපති ක්‍රමයේ අධික ලාභයත් අධි පරිභෝජනවාදයත් හේතුවෙන් පරිසරයට මුදාහරින හරිතාගාර වායුන් හා ඝන අංශු උෂ්ණත්වය ඉහළයාමට බලපාන ප්‍රධාන සාධකයන් ලෙස හඳුනා ගෙන ඇත. එමෙන්ම මෙවැනි විශාල වර්ෂා පොළවට පතිතවීම පාලනය කිරීමටත් වැසි ජලයෙන් වැඩි ප්‍රමාණයක් පොළවට උරා ගැනීමටත් අවශ්‍ය වනගහනය විනාශ කර හමාරය. මෙම හේතූන් නියඟවල තීව්‍රතාවයද වැඩි කරයි.



අංක 01 වගුව

| ආපදාව | ස්වාභාවික බලපෑම් | ධනපති ක්‍රමයේ බලපෑම් |
|---|---|---|
| 1. නායයාම් | ✓✓ | ✓✓ |
| 2. සුළි සුළං | ✓✓✓✓ | |
| 3. භූමි කම්පා | ✓✓✓✓ | |
| 4. සුනාමි | ✓✓✓✓ | |
| 5. ග්‍රහ වස්තූන් වැටීම් | ✓✓✓✓ | |
| 6. ගංවතුර | ✓✓✓ | ✓ |
| 7. නියඟ | ✓✓✓ | ✓ |
| 8. සෞඛ්‍යය | ✓ | ✓✓✓ |
| 9. වකුගඩු | ✓✓ | ✓✓ |
| 10. රිය අනතුර | ✓ | ✓✓✓ |
| 11. මත්ද්‍රව්‍ය භාවිතාව | | ✓✓✓✓ |
| 12. පොදුවේ සෞඛ්‍ය ක්ෂේත්‍රයට | | ✓✓✓✓ |
| 13. අධ්‍යාපනය | | ✓✓✓✓ |
| 14. ප්‍රවාහනය | | ✓✓✓✓ |
| 15.සියදිවි නසා ගැනීම් | | ✓✓✓✓ |

8 සිට පහළ කරුණු සැලකීමේදී එයින් මිය යන මිනිස් ජීවිත ප්‍රමාණය ඉතා අධිකය. 2004 දෙසැම්බර් 26 සුනාමියෙන් මිය ගිය ප්‍රමාණය 40,000 කි. වසර කීපයකදී රිය අනතුරුවලින් සිදුවන මරණ මෙම සීමාව ඉක්මවා යා හැකිය. දිනකට මෙවැනි ආකාරවලින් මිය යන ප්‍රමාණය කුඩා වුවත් වසරකදී එය අති මහත්ය. රටේ දුම් පානය නිසා වසරකට සිදු වන මරණ සංඛ්‍යාව වසරකට 20,000 කි. රිය අනතුරු හේතුවෙන් වසරකට 3000ක් මිය යති. ඩෙංගු වසංගත තත්වය නිසා වසරකට 150-200ක්ද ලෝකයේ සෞඛ්‍ය ක්ෂේත්‍රය කෙතරම් දියුණු වී ඇතත් අප රටේ හඳුනා නොගත් වකුගඩු රෝගයෙන් වසරකට දළ වශයෙන් 1000ක් පමණද ධනපති ආර්ථිකයේ අර්බුදයනට මුහුණ දීමට නොහැකිව සිය දිවි නසා ගැනීම් 2600ක්ද පිළිකා, හෘද රෝග, දියවැඩියාව ආදී රෝග නිසා මිය යන ප්‍රමාණයන් මෙයට නොදෙවෙනිය. (2004 දෙසැම්බර් 26 සිදු වූ සුනාමිය හේතුවෙන් සිදුවූ විනාශය ආපදාවක් ලෙස හැඳින්වූ අතර එම ආපදාව හේතුවෙන්ම ආපදා කළමනාකරණ දෙපාර්තමේන්තුව උපත ලැබීය.)

දහස් ගණනින් සිදුවන ජීවිත හානි මෙන්ම පවුල් ඒකකවල සිදුවන ආර්ථික පරිහානීන් සැලකීමේදී මේවා දැවැන්ත ආපදාවන්ය. ධනපති ආර්ථිකයේ සැඟවුණු නිශ්ශබ්ද මිනීමරුවන් ලෙස මෙම ආපදාවන් හැඳින්විය හැකිය.ඃසකැබඑ නසකකැරි* අප රටේ පාලකයන් මෙන්ම ආපදා කළමනාකරණ දෙපාර්තමේන්තුව මෙම ජීවිත හානි ආපදාවක් ලෙස නොදැකීම ක්‍රමයේ නොහැකියාව වසන් කිරීමකි.

රටක අපදා කළමනාකරණය යනු ආපදාවක් සිදුවීමට පෙර එය වැළැක්වීමට හෝ අවම කිරීමට කටයුතු කිරීම, ආපදා සිදුවීමට පෙර ජනතාව ඉවත් කිරීම, ආපදාවක් සිදු වූ පසු එය කළමනාකරණය කිරීම පසුව ආපදාවට ලක්වූවන්ගේ ජන ජීවිතය නගා සිටුවීම, ආදී කර්තව්‍යයන්ය. පසුගාමී ධනපති ආර්ථිකයකින් හෙබි අප රටේ මෙම ක්‍රියාවලිය නිසි ආකාරයෙන් සිදුවනවාදැයි විමසා බැලිය යුත්තකි. එය පසුගිය ගංවතුරෙන් ආපදාවට ලක්වූ ජනතාව තමන් සතු නිවාස හා තම පරිභෝජන භාණ්ඩවල ආරක්ෂාවට තම නිවෙස්වලම රැඳුණු ජනයා කොපමණදැයි කිව නොහැක. ඇතමුන් තම ජීවිත පරදුවට තබා තම නිවෙස් වහල මත නතර වූයේ ගංවතුර බැස ගිය පසු තමන් උපයා ගත් දෑ නොමැතිව ජීවත්වීමේ අසීරුවත් රාජ්‍ය ආපදා කළමණාකරණයේ ඇති අවිශ්වාසයත් නිසාය. මෙයට වසර කීපයකට පෙර සිදු වූ ආපදාවලින් ආපදාවට ලක් වූ ජනතාව තවමත් එම පීඩාවේ සිටීම ඔවුන්ගේ එම තීරණය වඩාත් සාධාරණය කරවයි. අප රටට වැනි නොදියුණු පසුගාමී ආර්ථිකයන් සහිත රටවල් මෙන්ම දියුණු ධනපති රටවල්ද ආපදාවක් කළමනාකරණය සිදු කිරීම අපොහොසත් වී ඇත. ඉන්දියාව, පාකිස්ථානය, ඉරානය, ඉන්දුනීසියාව, පිලිපීනය, දකුණු ඇමරිකානු බොහෝ රටවල් මෙයට කදිම උදාහරණයන්ය. නමුත් කියුබාව ආපදාවකදී සිදුවන මැදිහත්වීම හා කළමනාකරණය අපට බොහෝ පාඩම් කියාදේ. මෙයට වසර කීපයකට පෙර එක්සත් ජනපදයේ සිදු වූ කත්‍රිනා සුළි සුළඟින් පසු බොහෝ බටහිර විද්වත්හු කියුබාව සම්බන්ධයෙන් පැසසුම් සහිත ප්‍රකාශ නිකුත් කරන ලදී. ජපානය, ස්විස්ටර්ලන්තය ආදී දියුණු ධනපති රාජ්‍යයන් ආපදාවක් සිදුවීමට ප්‍රථම ඉදිකිරීම් ක්ෂේත්‍රය, ඉඩම් පරිහරණය, සෞඛ්‍ය, අධ්‍යාපනය ප්‍රවාහනය ආදී ක්ෂේත්‍රය යටතේ සියලු දෑ ආවරණය වන පරිදි මුළු රටටමත් ප්‍රතිපත්ති හා වැඩපිළිවෙළවල් තුළ ආපදාවකදී සිදුවන හානිය අවම කිරීමට කටයුතු කර ඇත. එය ඉන්දියාවේ සිදුවන භූමිකම්පාවකදී ඇතිවන ව්‍යවසනයෙනුත් ජපානයේ භූමිකම්පාවකදී සිදුවන ව්‍යවසනයෙනුත් වෙනස පැහැදිලි වේ. කෙසේ නමුත් පොදුවේ ධනපති ක්‍රමය ආපදා කළමනාකරණයේලා අසමත්ය.

අප රටේ ආපදා කළමනාකරණයේ යාන්ත්‍රණය දිසා ලේකම්, ප්‍රාදේශීය ලේකම්, ග්‍රාම නිලධාරී නිලධාරීන්ටත් ආපදා කළමනාකරණ දෙපාර්තමේන්තුවටත් නෛතිකව පවරා ඇතත් ආපදාවක් සිදු වූ විගස ආපදාවට ලක්වූවන්ට සහන සැලසීමේ ප්‍රධාන කර්තව්‍යය සිදු කරනුයේ ස්වේච්ඡා සංවිධාන හා සිවිල් සංවිධානයන්ය. ඇතැම් පෞද්ගලික මාධ්‍යයද ලොරි කිහිපයකට ජනතාවගෙන් ඒකරාශී කරන භාණ්ඩ මහා දැවැන්ත ප්‍රචාරයකින් පසු බෙදා හැරීමද අමතක කළ නොහැකිය. මෙම සියලු අංශ මගින් සිදු කරනුයේ ආපදාවට ලක්වූ ජනතාවට තාවකාලිකව සහන සැලසීමය. ත්‍රිවිධ හමුදාව විසින් ආපදාව සිදු වූ පසු ජනතාව බේරා ගැනීමේ කටයුතු ඊටම ඇතුළත්ය. ආපදා හඳුනා ගැනීම ඒවා අවම කිරීමට කටයුතු සිදු කිරීම ආපදාවකට පෙර කාර්යයනුත්, ආපදාවක් සිදු වන විටදීත් ආපදාවකට පසුත් කාර්යයන් ප්‍රධාන වශයෙන්ම සිදු කළ යුත්තේ රජය විසිනි. නායයාමක් අවම කර ගැනීම සඳහා දැවැන්ත මුදල් ප්‍රමාණයක් වියදම් කළ යුතුය. එහෙයින් බොහෝ රටවල් සිදු කරනුයේ එවැනි ප්‍රදේශ හඳුනාගෙන ඒවායින් ජනතාව ඉවත් කොට සුදුසු ස්ථානවල පදිංචි කිරීමය. අප රටේ එවැනි ස්ථාන හඳුනා ගැනීම සඳහා 1990 දශකයේ මුල් භාගයේ රටේ එක් කොටසක එ.ජ.සං. ඃඹගහගෘගඡ* මගින් සිදු කළ නායයෑම් ප්‍රදේශ හඳුනා ගැනීමට සිදු කළ සිතියම් ගත කිරීම හැරුණු කොට වෙනත් කටයුත්තක් නොමැත. වර්තමානයේ රජය සිදු කරනුයේ මධ්‍ය කඳුකරයේ ජීවත් වන ජනතාවගේ ඉදිකිරීම් සඳහා බද්දක් අය කිරීම පමණි. එම බද්ද අය කිරීමේදී (භූමිය පරීක්ෂා කිරීමේ ගාස්තු) ඉදි කිරීමට නුසුදුසු භූමි සඳහා අයථා ක්‍රම මගින් අවසරයක් ලබා ගැනීමට ජනතාවත් අදාළ නිලධාරීනුත් පෙළඹීම සාමාන්‍යයෙන් සිදුවන්නකි. ජීවත්වීමට ඉඩම් ප්‍රමාණය සීමා වීම තුළ අයථා ක්‍රියාමාර්ග වඩාත් තීව්‍ර වීමත් ආපදාවන් එලෙසම පැවතිමත් අනිවාර්ය වන්නකි. පසුගිය නායයාම් හා ගංවතුරෙන් පසුව රජය ප්‍රකාශ කළේ මුළු රටේම යම් ඉදිකිරීමක් සඳහා අවසර පත්‍රයක් ලබා ගත යුතු බවය. ඒ සඳහා බද්දක් ගෙවිය යුතුය. මෙයින් ගම්‍ය වන්නේ ආපදාවන් දුබල ධනපති ආණ්ඩුවට ආශීර්වාදයක් වී ඇති බවය. ආණ්ඩුවක් සිදු කළ යුත්තේ ජනතාවට සුරක්ෂිතව ජීවත්වීම සඳහා සුදුසු ඉඩම් තෝරා ඒවා ජනතාව අතර ප්‍රසිද්ධ කිරීමය.

> "ධනපති ආණ්ඩුව හා ඇතැම් ඊනියා බුද්ධිමතුන්ගේ ප්‍රකාශ අනුව ආපදාවට හේතුව පොදු ජනතාවගේ නොසැලකිලිමත් ක්‍රියාකාරකම්ය. නමුත් සත්‍ය වශයෙන්ම ආපදාවන් නිර්මාණය වීමට බලපාන මිනිස් ක්‍රියාකාරකම් යැයි කියනු ලබන දෑ සිදු කරනු ලැබූයේ ධනපති පංතිය විසිනි. එය ඔවුන්ගේ ලාභය සඳහාය. ගෝලීය උෂ්ණත්වය ඉහළ යෑමත් කඳුකර ප්‍රදේශයන්හි කැලෑ එළිකිරීමත් අවිධිමත් සංවර්ධන කටයුතුත් ආපදාවන්ගෙන් පීඩා විඳීමට ජනතාව එහි පදිංචි වීමට ඉඩ හැරීමත් ධනපති ක්‍රමයේ මැදිහත්වීම මත සිදුවූ ඒවාය. නියඟ වඩාත් තීව්‍ර කරනුයේද දුබල ධනපති ආණ්ඩුමය."

ධනපති ආණ්ඩුව හා ඇතැම් ඊනියා බුද්ධිමතුන්ගේ ප්‍රකාශ අනුව ආපදාවට හේතුව පොදු ජනතාවගේ නොසැලකිලිමත් ක්‍රියාකාරකම්ය. නමුත් සත්‍ය වශයෙන්ම ආපදාවන් නිර්මාණය වීමට බලපාන මිනිස් ක්‍රියාකාරකම් යැයි කියනු ලබන දෑ සිදු කරනු ලැබූයේ ධනපති පංතිය විසිනි. එය ඔවුන්ගේ ලාභය සඳහාය. ගෝලීය උෂ්ණත්වය ඉහළ යෑමත් කඳුකර ප්‍රදේශයන්හි කැලෑ එළිකිරීමත් අවිධිමත් සංවර්ධන කටයුතුත් ආපදාවන්ගෙන් පීඩා විඳීමට ජනතාව එහි පදිංචි වීමට ඉඩ හැරීමත් ධනපති ක්‍රමයේ මැදිහත්වීම මත සිදුවූ ඒවාය. නියඟ වඩාත් තීව්‍ර කරනුයේද දුබල ධනපති ආණ්ඩුමය. (අවිධිමත් ලෙස වැලි - මැටි කැණීම, ජල පෝෂක ප්‍රදේශ විනාශ කිරීම, ජල ධරයන් වැලි ලෙස කපා ඉවත් කිරීම, ජල පෝෂක ප්‍රදේශවල කැලෑ එළිකිරීම ප්‍රධාන කර්තව්‍යයන්ය.)

අප රටේ ජනතාවට සුරක්ෂිතව ජීවත්වීම සඳහා සුදුසු ප්‍රදේශ ලබා දීමට ඉඩම් ප්‍රතිපත්තියක් නොමැත. සෞඛ්‍ය, අධ්‍යාපන, ප්‍රවාහන, ආදීන්ගේ ප්‍රතිපත්තියක් හා වැඩපිළිවෙලක් නොමැත. මේ හේතුවෙන් දුබල ධනපති ආණ්ඩු සිදු කරනුයේ ආපදාවේ නිර්මාතෘ හෝ චූදිතයා නිර්ධන පංතිය බවට පත් කිරීමත් ආපදාව ආශීර්වාදයක් කොට ගෙන ආදායම් සෙවීමේ මඟක් සෙවීමත්ය. සෞඛ්‍ය, අධ්‍යාපන, ප්‍රවාහනය ආදී නොයෙක් ක්ෂේත්‍රයන්ගේ සිදුවන ආපදාවන් ධනපති පංතියේ (දැවැන්ත බහු ජාතික සමාගම්වල, බෙහෙත්, පොහොර, බීජ, ජලය පිරිසිදු කිරීමේ උපකරණ නිෂ්පාදන සමාගම්වල) ලාභයක් උපයීමේ ක්‍රමවේදයක් බවට පත්වී හමාරය. මේ අනුව ආපදාවක් නිර්ධන පංතියේ පීඩාවක් බවටත් ධනපති පංතියේ ආශීර්වාදයක් බවටත් පත්වී තිබීම පවතින ක්‍රමවේදයේ ආභාග්‍ය කියාපාන්නකි.

ජනතා විමුක්ති පෙරමුණේ මහජන නියෝජිතයින් විසින් පළ කළ අදහස් වෙනුවෙන් නියමුවා වේදිකාව වෙන්වෙයි.

2016 ජුනි 10

# යුද්ධයට මුහුණ දුන් ජනතාවගේ ගැටලුවලට ප්‍රායෝගිකව විසඳුම් ලැබී නැහැ

## පාර්ලිමේන්තු මන්ත්‍රී බිමල් රත්නායක සහෝදරයා

(යුද්ධයට මුහුණ දුන් ජනතාවගේ ගැටලු පිළිබඳ කල් තැබීමේ විවාදයට එක්වෙමින්)

පසුගිය අවුරුදු තිහකට ආසන්නව පැවැති යුද කාලය තුළදී, ඒ යුද්ධයෙන් විශාල පිරිසක් මිය ගියා. මියගියා වාගේම= සැලකිය යුතු පිරිසක් අතුරුදහන් වූවන් බවටත් පත්වෙලා තිබෙනවා. ඔවුන් පිළිබඳව කාර්යාලයක් ආරම්භ කරන්නට ආණ්ඩුව තීරණයක් ගෙන තිබෙනවා. ඒ සම්බන්ධ මූලික වැඩකටයුතු අවසන් බවත් පසු ගිය දවස්වල පුවත් පත්වල වාර්තා කර තිබුණා. නමුත් ඇත්තටම අතුරුදහන් වූ අයගේ පවුල්වලට අයත් ජනතාව, යුද්ධය නිසා ඉතාම පීඩාවට ලක් වුණු, යුද්ධය සහ වෙනත් සමාජමය හේතු නිසා අධ්‍යාපනික වශයෙනුත් පහළ මට්ටමක සිටින, ආර්ථික වශයෙන් අන්ත දුගී තත්ත්වයක සිටින, සාමාන්‍යයෙන් දවසකට වේලක් හෝ දෙකක් කන, ගෙදරක ප්ලාස්ටික් පුටු තුන හතරක්වත් නැති ඉතාම දුෂ්කර ජීවිතයක් ගත කරන පිරිසක්.

විශේෂයෙන්ම එවැනි පිරිසක් තමයි මේ මුලතිව්, කිලිනොච්චි වාගේ දිස්ත්‍රික්කවල වැඩි වශයෙන් ඉන්නේ. ඒ නිසා අතුරුදහන් වූවන් සම්බන්ධ තොරතුරු ඉදිරිපත් කිරීමේදී, ඔවුන් මුහුණ දී තිබෙන විවිධ හේතු නිසා ඊට අදාළ කරන මූලික ලිපිලේඛන සම්පාදනය කර ගැනීමේ බරපතළ ගැටලුවක් තිබෙනවා. අපි මේ පිළිබඳව ඇතිවෙන්න අදහස් ඉදිරිපත් කර තිබෙනවා. මම හිතන විධියට අනෙක් මන්ත්‍රීතුමන්ලාත් අදහස් ඉදිරිපත් කර තිබෙනවා. නමුත් ප්‍රායෝගිකව මේ ප්‍රශ්නවලට විසඳුමක් නැහැ.

**ඒ අයට වන්දි ලබා ගැනීම සඳහා මරණ සහතික ලබා ගන්න වෙනවා. එසේ මරණ සහතික ලබා ගන්න ඒ දෙමව්පියන් කැමැති නැහැ. ඒ දෙමව්පියන් කැමැතියි තමන්ගේ දරුවා ඉන්නවා කියලා විශ්වාස කරන්න. ඔබතුමාලත් දන්නා විධියට, 1987 - 1990 කාලයේ ඝාතනය වුණු අපේ පක්ෂයට සම්බන්ධ සහ සම්බන්ධ නොවූ දස දහස් ගණනක් ආදරණීය සහෝදර සහෝදරියන්ගේ අම්මලා තාත්තලා ඒ දරුවන් එන තෙක් අවුරුදු විස්ස, තිහ බලා ගෙන ඉන්නවා.**

ඒ නිසා තමයි මේ Certificate of Disappearance කියන අතුරුදහන් වූවන් වෙනුවෙන් සහතිකයක් දෙන්න යෝජනා කරන්නේ. ඒක හොඳ දෙයක්. රිද්දන්නේ නැතිව මේ ප්‍රශ්නය විසඳා ගන්න යෝජනා වෙලා තිබෙන ක්‍රමයක්. ඒ නිසා අපි ඉල්ලා සිටින්නේ ඒ පනත් කෙටුම්පත සම්මත කර ගන්න කියලායි. ඒ අයට ඒ සහතිකය ලැබුණා වුණත්, අනිවාර්යයෙන්ම ගත යුතු තවත් සහතික ගණනාවක් තිබෙනවා.

අපි විශේෂයෙන්ම ආණ්ඩුවෙන් ඉල්ලා සිටිනවා, මේ සම්බන්ධයෙන් කරන්න ඕනෑ මොනවාද කියන එක ගැන අඩු ගණනේ පත්‍රිකා මාර්ගයෙන් හරි ජනතාව දැනුවත් කරන්න කියලා. හරි ක්‍රමයක් දන්නා නිලධාරියෙක් ඇත්තේත් නැහැ. වන්දි ලබා ගැනීමට පැමිණිලි කිරීමේදී ඉදිරිපත් කරන්න ඕනෑ දේවල් මොනවාද කියන එක සම්බන්ධයෙන් හරි අදහසක් ඒ ජනතාවට නැහැ. එක එක්කෙනා එක එක දේවල් කියනවා. ආණ්ඩුවත් එක එක අවස්ථාවල යම් යම් දේවල් වෙනස් කරනවා. ඒ නිසා හැම ගෙදරටම පත්‍රිකාවක් ලබා දෙන්න කියලා අපි ආණ්ඩුවෙන් ඉල්ලා සිටිනවා. මහා ලොකු පොතක් නොවෙයි. පිටුවක දෙකක පත්‍රිකාවක් ලබා දෙන්න. "ඔයගොල්ලන් වන්දි ගන්නවා නම් කරන්න ඕනෑ මෙන්න මේකයි, අතුරුදන්වූවන්ගේ කාර්යාලයට ගිහිල්ලා පැමිණිලි කරනවා නම් මෙන්න මෙහෙමයි කරන්න ඕනෑ" කියලා සඳහන් පුංචි පත්‍රිකාවක් ලබා දෙන්න. මොකද, යුද්ධයෙන් වෙච්ච සියලු වේදනාවන් විසඳන්න බැහැ. නමුත්, අඩු ගණනේ දැන් ඒකෙන් නිදහස් වෙන්න දරන උත්සාහයේදී හරි එහෙම දෙයක් කරනවා නම් හොඳයි.

මේ රටේ පැවැති යුද්ධය අවසන්වීම සමරන සෑම අවුරුද්දකම මැයි 19වැනිදා ජාතිවාදී වශයෙන් යම් යම් කරුණු මතුවෙන නිසා, අපි යම් යෝජනාවක් ඉදිරිපත් කරන්න කැමැතියි. **ජනතා විමුක්ති පෙරමුණ පක්ෂයක් වශයෙන් අපේ රට බෙදීමට විරුද්ධයි. අපි හිතනවා, මේ රටේ සිංහල, දෙමළ, මුස්ලිම්, හැම කොනාටම සියයට සියයක් සමාන අයිතිවාසිකම් තිබෙනවා කියලා. ඒ නිසා අපි රට බෙදීමට කැමැති නැහැ. ඒ වාගේම අනෙක් පැත්තෙන් 2009 මැයි 19වැනිදා යුද්ධය අවසන්වීම පිළිබඳ ප්‍රශ්නය කරේ තියාගෙන හැමවිටම ඒකෙන් යම්කිසි ජාතිවාදී උණක් හදාගන්න, ඒකෙන් ඡන්ද කරන්න, ඒකම තොරොම්බල් කර කර ඉන්න කොහෙත්ම අපේ කැමැත්තක් නැහැ.** අපි පසුගිය අවස්ථාවකත් මේ කාරණය ඉදිරිපත් කළා.

2009 මැයි 19 වැනිදා දෙමළ ජනතාවගේ දරුවෝ තමයි එල්ටීටීඊ සංවිධානයට ගිහිල්ලා හරි නැතිව හරි මැරුණේ. ඔවුන් ඒක සමරනවා. ඒක වළක්වන්න පුළුවන් කවුරුවත් නැහැ. නමුත් අපි දන්නවා, යුද්ධයෙන් මැරිච්ච සිංහල, දෙමළ, මුස්ලිම් කවුරුත් ඉන්න බව. කැබිතිගොල්ලෑව වෙන්න පුළුවන්, මුස්ලිම් ජනතාව වැඩිපුර ජීවත් වෙන ප්‍රදේශවල වෙන්න පුළුවන්. කොළඹ දෙහිවල වෙන්න පුළුවන්, යුද්ධයෙන් මිය ගිය පිරිස් ඉන්නවා. ඒ නිසා අපි යෝජනා කරන්නේ සම්පූර්ණ උත්තර නොවුණත්, අඩුම ගණනේ ආණ්ඩුවකට පුළුවන් ඒ ජනතාවට තමන්ගේ



දරුවන් සමරන්න අයිතිය දෙන ගමන් ආණ්ඩුවක් විධියට උතුරේත්, දකුණේත්, නැගෙනහිරත්, බටහිරත් මේ යුද්ධයෙන් මිය ගිය හැම කෙනා වෙනුවෙන්ම ස්මාරකයක් හදන්න. එතකොට සිංහල අයට තමන්ගේ දරුවන් සමරන්න පුළුවන්. දෙමළ අයට තමන්ගේ දරුවන් සමරන්න පුළුවන්. ලෝකයේ එහෙම කරපු රටවල් තිබෙනවා. මායාවරුන් සමූල ඝාතනය කරපු රටවල් තිබෙනවා. එහෙම තමයි සමහර රටවල ප්‍රශ්න විසඳලා තිබෙන්නේ. දැන් මෙතැන අවශ්‍ය වෙලා තිබෙන්නේ, ඒ අයගේ දරුවන් නැවත එන්නේ නැහැ. ඒ අයට මේ දුක විමෝචනය කරගන්න යම්කිසි සාධාරණ ඉඩ කඩක් ලබා දීමයි. නැත්නම් හැම වෙලාවෙම තමන්ගේ දරුවන්ගේ මරණය සමරන වෙලාවේදී ඒක තවත් පැත්තකින් විවේචනය වෙනකොට ඒ දෙමව්පියන්ට රිදෙනවා. ඒක අපි හොඳටම දැක්කා.

නිවාස පිළිබඳ ප්‍රශ්නය ගැනත් මා කියන්න කැමැතියි. ඒ පිළිබඳව කථා වුණා. ගරු ඇමතිතුමා අලුත් නිවාස 65,000ක් ගැන කථා කරනවා. නමුත් අපි කියන්න ඕනෑ, තවමත් ඉන්නවා, පළමුවැනි අවස්ථාවේ හදපු නිවාස හම්බවුණේ නැති මිනිස්සු. මොකද, ඒක දෙද්දී ඉන්දියානු නිවාස ණය ආධාර ක්‍රමය යටතේ හදපු නිවාසවලට යම් යම් කොන්දේසි දැම්මා. නමුත් යුද්ධය අවසන්වෙලා අවුරුදු 7ක් ගිහිල්ලත් මට කියන්න පුළුවන් නිශ්චිතවම කිලිනොච්චියේ භාරතීපුරම් කියන ගම්මානයේ සමහර ජනතාව ඉන්නවා, ඒ ඉන්දියානු නිවාස ණය ආධාර ක්‍රමය යටතේ හදාපු නිවාසවත් ලැබිලා නැහැ. ඇමතිතුමා කථා කරනවා, අලුත් නිවාසවල structures ගැන. ඒ නිසා අපි ඉල්ලා සිටිනවා, ඒ අයට ඒ නිවාස ලබා දෙන්න කියලා.

ඊළඟ කාරණය මේකයි. යුද්ධයෙන් පසුව යාපනයේ - උතුරු ප්‍රදේශයේ - ජනතාව උත්සාහ කරන්නේ ආර්ථික වශයෙන් ගොඩ එන්නයි. ආර්ථික වශයෙන් නැගී සිටින්නයි. උතුරේ අති විශාල පිරිසක් ධීවර කර්මාන්තයෙන් ජීවත් වෙනවා. අපි කවුරුත් දන්නා ආකාරයට ඒ ධීවර ජනතාව මුහුණ දී තිබෙන ප්‍රධාන ගැටලුවක් තමයි ඉන්දියානු ධීවර ආක්‍රමණය.

උතුරු ප්‍රදේශයේ විශාල වශයෙන් ආර්ථික ගැටලු තිබෙනවා. කර්මාන්ත හා වාණිජ කටයුතු ඇමතිතුමා මේ අවස්ථාවේ ගරු සභාවේ නැහැ. නමුත් කතානායකතුමා ඇතුළු ආණ්ඩුවේ ප්‍රධාන ඇමතිවරු ඉන්නවා. උතුරු පළාතේ රජය සතු කර්මාන්තශාලා කොපමණ තිබෙනවාද කියලා සොයා බලන්න. මේ ආණ්ඩුව බලයට පත් වෙලා දැන් අවුරුදු එකහමාරක් වෙනවා. උතුරේ පරන්තන් ප්‍රදේශයේ ප්‍රධාන රසායනික කම්හලක් තිබෙනවා. උතුරේ තිබෙනවා, තල් සංවර්ධන මණ්ඩලය . පරණ කර්මාන්තශාලා ගැනයි මම මේ කියන්නේ. ඒ වාගේම ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව තිබෙනවා. මේවා ඔක්කොම යුද්ධය නිසා විනාශ වෙලායි තිබෙන්නේ. නමුත් මේ ආණ්ඩුව බලයට පත් වෙලා අවුරුදු එකහමාරකට පසුවත් මේ කිසිම එකක් පටන් අරගෙන නැහැ. ඒ වාගේම මේවායේ අති විශාල දූෂණ සිදු වෙලා තිබෙනවා.

යුද්ධය පැවැති කාලයේ වැඩ කරපු සිංහල හා දෙමළ ගුරුවරුන් සිටිනවා. සමහර අයට දේශපාලන හිතවත්කම සහ ජාතිකත්ව පදනම මත පසු ගිය කාලයේ පත්වීම් දුන්නා. නමුත් ස්වේච්ඡා ගුරුවරු සුවිශාල ප්‍රමාණයක් සිටිනවා. ඇත්තටම ඔවුන් යුද්ධය පැවති කාලයේ උගන්වපු අය. ඔවුන්ට එම අවස්ථාව ලබා දීලා නැහැ. ඒ නිසා අපි ඉල්ලා සිටිනවා, මේ වාගේ ප්‍රශ්න ඔඩු දුවන්න දෙන්නේ නැතුව කරුණාකරලා ඒවා විසඳන්නය කියා.

වවුනියාවේ සිට මාමඩුව හරහා පදවියට යන ප්‍රධාන මාර්ගයක් තිබෙනවා. ඒ මාර්ගය අබලන් වෙලා අවුරුදු ගණනාවක් ගත වෙලා තිබෙනවා. නමුත් තවම එය හදලා නැහැ. මම ඒ ප්‍රශ්නය මහාමාර්ග අමාත්‍යතුමාට ඉදිරිපත් කළා. එතුමා කිව්වා, ලබන අවුරුද්දේ එම මාර්ගය හදන්නම් කියා. නමුත් ජනතාව ඒ සම්බන්ධයෙන් ආණ්ඩුවේ ඇස් ඇරවීමට කළ උද්ඝෝෂණයට සම්බන්ධ වුණු ගුරුවරුන් පස් දෙනෙකුට විරුද්ධව අද ආණ්ඩුව නඩු දමා තිබෙනවා. මේ පාර හදන්න කියායි එසේ උද්ඝෝෂණය කළේ. එහෙම නැතුව building කඩා හෝ වෙන මොනවත් කරලා නොවෙයි. මෙ පාර හදන්නම් කියා මහාමර්ග ඇමතිතුමා අත්සනත් යොදා ලිපියක් ලබා දීලා තිබෙනවා. ඒ නිසා අපි ඔබතුමාගෙන් ඉල්ලා සිටින්නේ, කරුණාකර උතුරේ ජනතාවට දෙන්න පුළුවන් සහනයක් ලබා දෙන්න කටයුතු කරන්න කියලයි.

2016 ජුනි 07 දින

# දුප්පත් අම්මා තාත්තාගේ දරුවෝ ගැන කථා කරන්න ඇමැතිවරු නැහැ!

(අධ්‍යාපන ගැටලු පිළිබඳ කල්තැබීමේ විවාදයට සහභාගී වෙමින්)

විශ්වවිද්‍යාල අධ්‍යාපනය මේ රටේ දරුවන්ට ලැබෙන ඉතාම සුවිශේෂ අවස්ථාවක්. අප රටේ සාමාන්‍ය පන්තියේ දරුවන්ට ඉස්සරහට යන්න තිබෙන එකම ක්‍රමය එයයි. නමුත් විශ්වවිද්‍යාලවලට බඳවා ගන්නා සිසුන් ප්‍රමාණය දිගින් දිගටම කප්පාදු කිරීම පිළිබඳව අපි උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගේත් ජනාධිපතිවරයාගේත් අවධානය යොමු කර තිබෙනවා.

1990 වසරේදී අපේ රටේ උසස්පෙළ සමතුන්ගෙන් සියයට 20.79ක්; දළ වශයෙන් සියයට 21ක් විශ්වවිද්‍යාලවලට ඇතුළත් කර ගත්තා. අවුරුදු 25කට පස්සේ අද එම ප්‍රමාණය සියයට 17ක් දක්වා අඩු වෙලා තිබෙනවා. 2014 අවුරුද්දේ උසස්පෙළ ප්‍රතිඵල ගත්තොත් සිසුන් 1,49,572ක් විශ්වවිද්‍යාලවලට සුදුසුකම් ලබනවා. අවුරුදු 25ක් තිස්සේ විශ්වවිද්‍යාලවලට බඳවා ගන්නා සිසුන් ප්‍රමාණය කප්පාදු කර තිබෙනවාය කියන එක ආණ්ඩුවක් වශයෙන් - මේ ආණ්ඩුව පමණක් නොවෙයි. මේ ආණ්ඩුවටත් ලොකු වගකීමක් තිබෙනවා - පිළිගත යුතුයි. ඒක ආණ්ඩුවේම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසමේ සංඛ්‍යාලේඛනවලින් ඉතා පැහැදිලිව පෙන්නුම් කර තිබෙනවා. 1990 වාගේ කාලයකදී සිසුන් 100ක් පාස් වුණාම 21ක් බඳවා ගත්තානම්, අද 100ක් පාස්වුණාම විශ්වවිද්‍යාලයට බඳවා ගන්නේ 17යි. නමුත් පසුගිය අවුරුදු 11ක කාලය ඇතුළත එකදු රජයේ විශ්වවිද්‍යාලයක් අලුතින් ආරම්භ කිරීම සඳහා අයවැය තුළින් රාජ්‍ය මුදල් වෙන් කර නැහැ.

මේක බරපතළ ගැටලුවක්. **අඩුම ගණනේ 1990 දී බඳවා ගත් මට්ටමටවත් රජයේ විශ්වවිද්‍යාලවලට ශිෂ්‍ය ශිෂ්‍යාවන් බඳවා ගන්න. පෞද්ගලික විශ්වවිද්‍යාලවලට යන්න පුළුවන් ප්‍රමාණය ඉතාම සීමිතයි. ඒවා වංචනිකව ආරම්භ කළා වුණත් ඒවාට යන්න පුළුවන් ප්‍රමාණය සීමිතයි. ඒ නිසා මේ අවුරුද්දේ උසස් පෙළ විභාගයේ ප්‍රතිඵල අනුව සමත් වන දරුවන්ගෙන් අඩු ගණනේ සියයට 21ක් වත් රජයේ විශ්වවිද්‍යාලවලට බඳවා ගැනීමට කටයුතු ආරම්භ කරන්නය කියලා අපි ඉතාම බරපතළ ලෙස අවධාරණය කරනවා.**

දෙවන කාරණය මෙයයි. අපි මේ කාරණයත් රටේ අවධානයට යොමු කරනවා. ආණ්ඩුවෙන්, උසස් අධ්‍යාපන අමාත්‍යාංශයෙන්, විශේෂයෙන් UGC එකෙන් හැම අවුරුද්දේම පම්පෝරි ගහනවා. "අපි මෙවර ශිෂ්‍යයන් 25,000ක්, 26,000ක් බඳවා ගන්නවා"යි කියලා. සෑම වසරකම සුදුසුකම් මත ළමයින් 25,000ක් තෝරා ගත්තාට 22,000ක්, 23,000ක් වැනි පිරිසක් තමයි විශ්වවිද්‍යාල ඇතුළට යන්නේ. විශේෂයෙන්ම UGC එකේ තිබෙන දුර්වලතාව නිසා, ඔවුන්ගේ පරිපාලන අපහසුතා නිසා හැම අවුරුද්දකම විශ්වවිද්‍යාලවලට තේරුණු දරුවන්ගෙන් 2,000ක් පමණ විශ්වවිද්‍යාල ඇතුළට එන්නේ නැහැ. මේ සම්බන්ධව වැඩිදුරටත් කථා කරන්න

15වැනි පිටුවට

කවුළුව හැරිම් තබමි


# අරාජික රට අනාරක්ෂිතය



ලංකාවේ සෙසු බේදවාචකයන් මෙන්ම 'සාලාවේ' බේදවාචකයද ඉක්මනින්ම මැකී යාමට නියමිතය. දැනටමත් එහි ලකුණු පහළ වී තිබේ. නියඟය, ඊට පසු මහවැස්ස ගංවතුර සමග නායයාම්, ඉන්පසු සාලාවේ පිපිරීම මේ සියල්ල වේගයෙන් දුවන දුම්රියක පෙට්ටි මොහොතකින් නොපෙනී යන්නාක් මෙන් අද වන විට සමාජයෙන් මැකී යමින් තිබේ. මේවා හුදෙකලා සිදුවීම් ලෙස හෝ සාමාන්‍ය දේ ලෙස හෝ කෙනෙකුට බැහැර කළ හැක. එහෙත් දේශපාලන සවිඥානික අයෙකුට එසේ කළ නොහැක. මේ කියාපාන්නේ රටේ අරාජිකත්වය මිස වෙන කුමක්ද? සැලැස්මක්, ඉලක්කයක්, නිසි පාලනයක්, නිවැරදි දේශපාලන, ආර්ථික දැක්මක් සහ මෙහෙයුමක් නොමැතිව දුවන්නන් වාලේ දුවන රටක මෙවැනි දේ සිදුවීම අරුමයක් නොවේ.

රටක ආරක්ෂාව යනු ජනතාවගේ ආරක්ෂාවයි. ජනතාවගේ ආරක්ෂාවකින් තොරව රටක ආරක්ෂාව ගැන කථා කිරීම විහිළුවකි. මෙතෙක් රට පාලනය කළ පාලකයින් විසින් කර ඇති එකම දෙය ජනතාව අනාරක්ෂිත කිරීමය. අරාජික වූ රට අනාරක්ෂිතය. බලගතු පුපුරණ ද්‍රව්‍ය සහිත හමුදා කඳවුරක් ජනාවාස මැද පිහිටුවාලීමෙන්ම රටේ පාලකයින්ගේ 'සැලසුම් සහගත' බව මොනවට ඔප්පු වේ. මෙවැනි පාලකයින්ට රටක් භාරදීම ගැන නැවත කල්පනා කිරීමට ජනතාවට සිදුවේ. පාලකයින්ට පසුගිය දිනවල සිදුවූ බේදවාචකයන් තමන්ට ලකුණු දමා ගැනීමේ සහ පුරාජේරු කථා කිරීමේ වේදිකා පමණි. රටේ දැවෙන ප්‍රශ්න යට ගැසීමට තිබෙන හොඳම අවස්ථාය. දැන් අනාථ වූවන් අනාථ වී හමාරය. හරිහම්බ කරගත් දේ විනාශ වී හමාරය. අවසානයේ ඉතිරි වී ඇත්තේ අනාථ බව සහ විනාශය පමණි. පාලකයෝ සුපුරුදු සූදුවේ නිරත වී සිටිති. ජනතාව එහි එහාට මෙහාට ඇදෙන ඉත්තෝ බවට පත් වී සිටිති. මේ බේදවාචකය නිවැරදිව තේරුම්ගෙන ඉන් මිදීමට ජනයා පියවර නොගතහොත් රටම සාලාවක් හෝ මීරියකන්දක් වීම වැළැක්විය නොහැක.

# අනේ අපි කවදාක පිහිනමුද ඒ ගඟේ



මේ ළඟකදී පුවත්පතක වාර්තාවක් තිබුණි. එයින් කියැවුණේ 1983 සිට මේ දක්වා ලංකාවේ සියදිවි නසාගත් අයගේ සංඛ්‍යාව යුද්ධයෙන් මිය ගිය අයගේ සංඛ්‍යාවට වඩා වැඩි බවය. මෙහෙම වෙලා තියෙන්නේ උදේ - දිවා රාත්‍රී බණ කියන, බණ අසන පන්සල් පල්ලි යන බණ භාවනා කරන රටකය. ඒ අනුව ගත්තම මේක ස්වර්ග රාජ්‍යයක් වෙලා බොහොම කල්ගත වෙන්න ඕනැය. ඒ වෙනුවට දැන් මේක යම පල්ලන්ගේ රාජ්‍යයක් වෙලාය. සමහර හාමුදුරුවරුවරු, පූජකයින් ළමයි දූෂණය කරන ගමන් රට පුරා සදාචාර, ධාර්මික දේශනා පවත්වනවාය. බලවතුන්ගෙ සල්ලි පිපාසාව නිසා රටේ හැම තැනම මත්කුඩු ජාවාරම සමාජය වෙලාගෙනය. පන්සල්, පල්ලි, කෝවිල්වල අනුග්‍රාහකයින් වී සිටින්නේ සමාජයට වින කරන වුන්ය. ඔවුන් ඒවාට අල්ලස් දෙනවාය. ආගමික නායකයින් ඔවුන්ට මොක් සැප පතනවාය. ඔවුන් සුදෝ සුදු සිල්වතුන් කරනවාය. රටම සුදුපිටියක් වෙලාය. ලෞකික සැප සම්පත්වලට වහ වැටිලාය. ලොතරැයි කූඩුවට හැමෝම තම තමන්ගෙ ජීවිත සූරනවාය. ඒ සූදු කරවන සූදු කාරයන්ගෙ පත්තර පිටුවල සාධාරණය, සදාචාරය, සංස්කෘතිය ගැන ලිපි පළවෙනවාය. ඔවුන්ගෙ චැනල්වල සාරධර්ම උදේ හවා දෝරෙ ගලනවාය.

ඒත් දන්න කියන සියලුම කෙළිවලින් ජීවිතය ගොඩදාගන්න බැරිවෙච්ච බොහෝ දෙනා අවසානයේ තෝරගන්නෙ කෝච්චිය, ගඟ, මුහුද, වහ කුප්පිය, පිස්තෝලය, කඹය. දිවිනසා ගැනීමේ මෝක්ෂයය. ඉතිං වැරදිලා තියෙන්නෙ කාටද, කොතනදැයි පෙනෙන්නේය. මේ පාලකයින් අපිට අන්තිමට ඉතිරි කළේ මොනවද? දුක, වේදනාව, බලහත්කාරය, තරඟය, අසහනය, රැවටිල්ල, කලකිරීම, යුද්ධය, සියදිවි නසා ගැනීම පමණක් නොවේද? ආගම්වල උගන්වන මනුෂ්‍යත්වයේ ආදරයේ නාමයෙන් කිසිවක් සිදුවී තියෙනවාද? එහෙම වෙන්න පුළුවන්ද? ආගමත් මේ සමාජය කන වනසනවුන්ගෙ ශුද්ධ වතුර වුණාට පස්සේ අපරාධ ගැන බණ කියල වැඩක් තියෙයිද? ප්‍රාග්ධනයට ශුද්ධ වූ සියල්ල ජනතාවට අශුද්ධය. මේ සත්‍ය අප තේරුම් ගන්නේ කවදාද?

# විනාශ කළද මරා දැමිය නොහැකි වූ මිනිසා

අපි සියල්ලෝම උපදින මැරෙන මිනිසුන්ය. එහෙත් උපදින මැරෙන සියල්ලෝම සැබෑ මිනිසුන් වන්නේ නැත. ඒ සඳහා අත්කර ගත යුතු ගුණයන් බොහෝය. එය අභ්‍යාස කර අත්කර ගත යුතුය. ශරීරය සහ ජීවය පමණක් රැගෙන සමාජයට බිහිවන මිනිසකු එම සමාජයේ ගමන් මඟ යෝධ බරකින් ප්‍රශ්න කර එම සමාජයේ සියලු මුග්ධකම් ප්‍රශ්න කරමින් එම සමාජය මහා කම්පනය කර දැමීමකට ලක්කරන්නේ නම් ඔහු සමාජ බලයක් බවට පත්වන්නේය. එය දුර්ලභ සංසිද්ධියකි. අද අපි කථා කරන්නේ එබඳු සමාජ බලයක් බවට පත් වූ පුංචි එහෙත් දුර්ලභ මිනිසකු ගැනය.



ඔහු අන් කවරකුත් නොව ජ.වි.පෙ. නිර්මාතෘ රෝහණ විජේවීර සහෝදරයාය. ඔහු උපන්නේ 1943 ජූලි 14 දිනයි. හතුරා විසින් ඔහු මරා දැමුවේ 1989 නොවැම්බර් 13දිනයි. එවිට ඔහුගේ වයස අවුරුදු 46 කි. අද සිටියා නම් දැන් ඔහුගේ වයස 73 කි. ඔහු තනියෙන් 'බුදුවීමට' පෙරුම්පිරූ මිනිසකු නොවීය. තනියෙන් 'බුදුවීමට' මිනිසුන් පොළඹවා සිටි නරුම සමාජ ක්‍රමයක සියලු මිනිසුන්ගේ සැබෑ විමුක්තිය සඳහා සිය දිවි හිමියෙන්ම සටන් වැදි මිනිසෙකි. අවුරුදු 46 පිරෙනකොටම සතුරා ඔහු අපෙන් උදුරා ගත්තේය. එහෙත් ඔහු තැනූ මාවත, ඔහුගේ දර්ශනය, ඔහු ගොඩනැගූ ජීවමාන සමාජ ව්‍යාපාරය සතුරාට කිසිවිටෙක මරා දැමීමට නොහැකි විය. රෝහණ විජේවීර නොමැති දේශපාලනය සොහොන් බිමක් වැනියැයි හතුරා පවා විටෙක කීවේ ඔහු මේ සමාජයෙන් කිසිදිනෙක මකා දැමිය නොහැකි මිනිසකු බව සනාථ කරමිනි.

ඔහු වරක් මෙසේ පැවසීය. "අපි යා යුතු තැන දැනගෙන, යා යුතු විධිය නොදැන සිටීමට වඩා යා යුතු තැන නොදැන යා යුතු විධිය පමණක් දැනගෙන සිටීම වඩා භයානකය'' කියාය. ඔහු යායුතු තැන හොඳින් දැනගෙන සිටියේය. එතනට යා යුතු විධිය පිළිබඳව ඔහු සිය ජීවිත කාලය පුරාම අභ්‍යාස කළේය. ඒ අභ්‍යාසයේ උස්වල නෙළා ගැනීමට සූදානම් මොහොතේම සතුරා ඔහු මරා දැමීය. එහෙත් ඔහු සෙවන දුන් යා යුතු තැන මකා දැමීමට සතුරා කිසි විටෙක සමත් නොවීය. අන් සියල්ලටම වඩා රෝහණ සහෝදරයා ඒ ගැන ප්‍රත්‍යක්ෂ කරගෙන සිටියේය. ඔහුගේ විෂද බුද්ධි මහිමය සහ අනාගත දැක්ම මැන ගැනීමට මින් දශක ගණනකට පෙරම මධ්‍යම කඳුකරයේ නායයාම් සහ ජල ගැලීම්, ස්වාභාවික විපත් සහ එහි සැබෑ හේතු ගැන කළ විවරණයම ප්‍රමාණවත්ය. සතුරා ඔහු විනාශ කළේය. එහෙත් මරාදැමීමට සමත් නොවීය. විනාශ කළද මරා දැමිය නොහැකි වූ ලාංකේය මිනිසා ඔහුමය.

## ජනතාවට COPE...

15 පිටුවෙන්

ලැබෙනවාද?

පසුගිය දවස්වලා අගමැතිවරයත් කියල තිබුණා අපි බදු ගහන්නේ මිනිසුන්ට සහන දෙන්න කියලා. එහෙම නම් මේ ආයතනවලට ලැබෙන ආදායම නැවත ප්‍රතිලාභයක් හැටියට ජනතාවට යන්න ඕනැ. නමුත් ඇත්ත යථාර්ථය ඒක නොවේ. මේ බොහෝ ආයතන ජනතාවට ප්‍රතිලාභ දෙන්නේ නැහැ. ඒ දේශපාලඥනයෝ පත්කර ගන්නා සංස්ථා සභාපතිවරු අධ්‍යක්ෂක මණ්ඩල තමන්ගේ හෙංචයියො ටික බොහොම සීමිත පිරිසක් තමා මේ සියලු ප්‍රතිලාභ භුක්ති විඳින්නේ. ජනතාව නොවෙයි. ඒ කුමන ප්‍රමාණයටද ඒවා විනාශ කරලා තියෙන්නේ කියන එක අපට හෙළිදරව් කරන්න පුළුවන්. එය කෙරෙනවා. පසුගිය රාජපක්ෂ පාලන කාලය තුළ රාජ්‍ය බැංකු පද්ධතිය කොහොමද විනාශ කළේ. ලංකා පුත්‍ර වගේ බැංකු ආයතන කොහොමද විනාශ කළේ. ණය දුන්නේ කොහොමද තමන්ගේ හිතවතුන්ට. කියන එක අපට හෙළිදරව් කරන්න පුළුවන්කම තිබෙනවා. ඒක ඒ විදියටම මේ දැනට වර්තමාන කාලයේත් සිද්ධවෙන බවත් අපි ඉතා පැහැදිලිව හෙළිදරව් කරනවා. රජයේ ඉඩම්, මහපරිමාණව තිබෙන වතු, සමාගම්, රාජ්‍ය වැවිලි සමාගම් ඒව කොහොමද ජනතාවට බුක්ති විඳින්නව වෙනුවට අත්පත් කරගත්ත බලෙන් අල්ලගත්ත කිහිපදෙනෙක් බුක්ති විඳින්නෙ කොහොමද කියන එක එළිදරව් කරන්න පුළුවන්.

මේ සමස්තය විසින් ජනතාව තේරුම් ගත යුත්තේ මේ පැලැස්තර විසඳුම්වලින් උත්තර හොයන්න බැහැ කියන එක. අපි හැමදාම වැරදි පාලකයෝ පත්කරගෙන නිවැරැදි මිනිස්සු වැරදි විදියට දුක්විඳිනවා. නිවැරැදි මිනිස්සු වැරදි තීන්දුවලින් දුක් විඳිනවා. ඒක තමා යථාර්ථය. ඉතින් ඒක වෙනස් කරන්න ජනතාවට වගකියන පාලකයො පත්කර ගන්න ඕන කියන එක ජනතාව තේරුම් ගන්න ඕනැ. අපි මේ උත්සාහ කරන්නේ මේ ආයතන පිරිසිදු කරන්න නොවේ. නැත්නම් මේ ආයතනවල වැරැදි පුද්ගලයෝ ඉවත් කරලා මේ තුළ නිවැරැදි පුද්ගලයෝ ස්ථානගත කරන්න නොවේ. ඒක කරන්න බැහැ. වැරැදි ක්‍රමය තුළ නිවැරැදි පුද්ගලයෝ නැහැ. වැරැදි ක්‍රමයයි වෙනස් කරන්න ඕනැ. වැරැදි ක්‍රමය වෙනස් කරලා නිවැරැදි ක්‍රමයක් ස්ථානගත කළොත් නිවැරැදි සමාජ ක්‍රමයක් ඇතුලේ පමණයි නිවැරැදි මිනිස්සු ඉන්නේ. එතකොට මේ නාස්තිය දූෂණය හොරකම කියන්නේ මේ ශ්‍රමයේ සුජාත දරුවො වගේ. නාස්තිය දූෂණය නැති සමාජයක විතරයි නාස්තියට දූෂණයට වංචාවට හවුල්වෙන්නේ නැති මිනිස්සු බිහිකරන්න පුළුවන්කම තියෙන්නේ.

***නියමුවා:-*** *වැට් බදුවලින් ජනතාව හොඳටම පීඩාවට පත්වෙලා. ඒ නිසා ජනතාව උද්ඝෝෂණය කරනවා. පාරට බැහැල තියෙනවා. ව්‍යාපාරිකයෝ, සුළු ව්‍යාපාරිකයෝ පාරට බැහැලා දිස්ත්‍රික්ක මට්ටමින් අද උද්ඝෝෂණය කරමින් ඉන්නවා. වැට් බදු සංශෝධනයකින් නැවත මේ බදු බර ඉවත්කරගන්න ජනතාවට පුළුවන්කම ලැබේවිද?. එවැනි තාවකාලික සහනවලින් උත්තර හොයන්න ආණ්ඩුවට දැන් පුළුවන්ද?*

*සුනිල් හඳුන්නෙත්ති සහෝදරයා:-* ඇත්තටම බැහැ. දැන් තිබෙන්නේ නහයටත් උඩට ගිලිච්ච ආර්ථික ක්‍රමයක්. මේක ඇතුළේ ජනතාව මොනතරම් උද්ඝෝෂණ කළත් ඒ උද්ඝෝෂණය කරන ජනතාවට සහන දෙන්න ආණ්ඩුවට පුළුවන්කමක් නැහැ. මොකද ආණ්ඩුව මුහුණ දෙන අසහනය ඊට වඩා වැඩියි. ජනතාවගේ පැත්තෙන් බැලුවොත් මේ උද්ඝෝෂණය අතිශය සාධාරණයි. ජනතාවට මේ බදු දරාගන්න බැහැ. හැබැයි ඒවාගේ තමයි ධනපති ආණ්ඩුවටත් දැන් තමන්ගේ ආර්ථික අර්බුදය දරාගන්න බැහැ. ඒ නිසා මොනම ආකාරයකින්වත් මම හිතන්නේ නැහැ මේක වැට් බදුවලට විරුද්දව උද්ඝෝෂණය කරනවිට මොහොතකට වැට් බද්දෙ කොටසක් අඩුකරලා පුංචි සහනයක් දෙන්න පුළුවන්කම තිබේවි. ඒක උපක්‍රමයක් හැටියට. හැබැයි වෙනත් බද්දක් හඳුන්වාදීලා ඊළඟ දවසේදීම ඒ ජනතා විරෝධය හමුවේ අකුළගන්න සහනය යළි ආණ්ඩුව අයකරගන්න ක්‍රමය ආණ්ඩුව හදනවා.

මොකද ඒ තරමට ආණ්ඩුව අර්බුදයට පත්වෙලා. ආණ්ඩුවට ණය ගන්න තිබෙන ක්‍රම සියල්ල පාවිච්චිකරල තියෙනවා. රටේ ජනතාවගේ නමින් තියෙන ආණ්ඩුව භාරයේ තියෙන අර්ථසාධක අරමුදල විශ්‍රාම වැටුප් අරමුදල, ඒකාබද්ධ අරමුදල වැනි සියලු අරමුදල්වල මුදල් මේ වනකොට ආණ්ඩුව පාවිච්චිකරලා අවසානයි. මේ අංගවිකල දේශපාලන ගුණය සහිත ආණ්ඩුවට ණය දෙන එක පිළිබඳවත් ණය දෙන රටවල් දෙතුන් පාරක් හිතනවා. ඒ හින්දා අද ආණ්ඩුව බලාපොරොත්තු වූ තරම් ණය ලබාගන්න හැකියාවකුත් ලැබිලා නැහැ. එකනිසා දෛනික ආණ්ඩුවේ කටයුතු පවත්වගේන යන්න සිද්දවෙලා තියෙන්නේ වැඩිපුර ජනතාව පාවිච්චි කරන භාණ්ඩවලට බදු අයකිරීමෙන් පමණයි.

මේ තියෙන ආර්ථික අර්බූදයට මේ ක්‍රමය ඇතුළේ උත්තර නෑ කියලා ජනතාව තේරුම් ගන්න ඕනැ. නැත්නම් නැවත වරක් වෙන්නෙ ධනපති පංතියේම තවත් කොටසකට රැවටෙන්න වෙන එකයි. නමුත් අපි අද දකින අලුත් තත්වය තමයි නව ප්‍රවණතාවය තමයි දැන් ජනතාව තේරුම් අරන් තියෙනවා මේ දෙකම එකක් කියලා. ජනතාවට දැන් තියෙන ප්‍රශ්නෙ තමා අපි විකල්පය හැටියට ජනතා විමුක්ති පෙරමුණ වටා ගම් මට්ටමෙන් බිම් මට්ටමෙන් සංවිධානය වෙන්නේ කොහොමද කියන එකයි. ඒ සම්බන්ධයෙන් වන සංවිධාන වැඩපිළිවෙලක් සකස්කර තියෙනවා. අපි දිරිය පුරවැසි සමිති හදලා තියෙනවා. ජනතාවට ඒ සමිති හා ඒකාබද්ධ වෙන්න පුළුවනි. යූ.එන්.පී. - ශ්‍රීලංකා දේශපාලනය අද සමාජයෙන් අතුගෑවිලා යන අතරේ ජනතාව තුළ නව ප්‍රබෝධයක් සහිතව ජනතා විමුක්ති පෙරමුණ කෙරෙහි විශ්වාසයේ දෑස් දල්වාගෙන ඉන්නවා. ඒක අපි හිතන්නේ අපේ රටේ අනාගතය පැත්තෙන් ඉතා ශුභවාදී තත්වයක් කියලා.

## දුප්පත් අම්මා

13 පිටුවෙන්



මට වෙලාව නැහැ. මේ සම්බන්ධයෙන් අපි ඇමතිතුමාට කියා තිබෙනවා. සුදුසුකම් තිබෙන ළමයින් ඕනෑ තරම් පෝලිමේ ඉන්නවා. එක ළමයකු විශ්වවිද්‍යාලයට එන්නේ නැති වුණාම ඊළඟ ළමයා බඳවා ගන්න පරිගණක ක්‍රම ඕනෑ තරම් හදලා තිබෙනවා. මේ සම්බන්ධයෙන් නිලධාරීන් පරිපාලන හේතු කියන්න පුළුවන්. අපි නිලධාරීන්ටයි මේ ප්‍රශ්නය ඉදිරිපත් කරන්නේ. අඩුම ගණනේ 25,000ක් නම් බඳවා ගන්නේ, ඒ 25,000 බඳවා ගන්න ආණ්ඩුව වගබලා ගන්න ඕනෑ. ඒ 25,000න් 2,000 ගණනේ අවුරුදු 10ක් බඳවා ගන්නේ නැති වුණාම කොපමණ ප්‍රමාණයක්ද ගරු කථානායකතුමනි? එක අවුරුද්දක එක දරුවකුවත් විශ්වවිද්‍යාලයට බඳවා ගත්තේ නැති හා සමානයි. 2005 ඉඳලා 2015 දක්වා එක අවුරුද්දකට 2,000 ගණනේ බඳවා ගත්තේ නැත්නම් ඒ අවුරුදු 10 ඇතුළත දරුවන් 20,000ක් විශ්වවිද්‍යාලයට බඳවා ගෙන නැහැ. ඒ නිසා උසස් පෙළ විභාගය සමත්ව සුදුසුකම් ලබන ශිෂ්‍ය ශිෂ්‍යාවන් අඩු ගණනේ විශ්වවිද්‍යාලවල ඉඩකඩ ඇති ප්‍රමාණයටවත් බඳවා ගන්න වැඩපිළිවෙළක් සකස් කරන්නය කියලා අපි බරපතළ ලෙස අවධාරණය කරනවා.

තුන්වන කාරණය මෙයයි. මේ පිළිබඳවත් අවස්ථා ගණනාවකදී ගරු ඇමතිතුමාගේ අවධානයට යොමු කළා. ඔබතුමා දන්නවා, අද අපේ රටේ දරුවන්ට දෙවන වර සහ තෙවන වර දක්වා උසස් පෙළ විභාගයට ලියන්න අවස්ථාවක් තිබෙනවාය කියලා. පසුගිය වතාවේ මතු වුණු ගැටලුව මෙයයි. උසස්පෙළ විභාගයේ දෙවන වර ප්‍රතිඵල මත වෛද්‍ය පීඨවලට, ඉංජිනේරු පීඨවලට තේරුණු දරු දැරියන් විශාල ප්‍රමාණයක් ඉන්නවා. හැබැයි ඔවුන්ගේ පළමුවන වතාවේ ප්‍රතිඵල මත ඔවුන් සුදුසුකම් ලබා තිබෙන්නේ සමහර විට ඊට වඩා අඩු ලකුණු මට්ටමක් අවශ්‍ය පීඨවලටයි. හැබැයි ඔවුන් දෙවන වර විභාගය කරනකොට ඒ පීඨ එකක්වත් පටන් ගෙන නැහැ. පළමුවන වර විභාගයට ලියලා ප්‍රතිඵල එනකොටත් ඔවුන්ගේ පළමුවන වර ප්‍රතිඵල මත ආරම්භ කළ යුතු පීඨ පටන් ගෙන නැහැ. නමුත් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම ඉතාම දැඩි, ඉතාම අසාධාරණ තීන්දුවක ඉන්නවා. ඔවුන් පළමුවන වර ලැබූ ලකුණු මත යම් කිසි පීඨයකට තේරුණා නම් එයටම ඇතුළත් කළ යුතුය කියා.

ළමයෙක් විශ්වවිද්‍යාලයට ඇතුළත් වීම සඳහා ලියාපදිංචි වෙලා තිබිලා ඒ පීඨයට ඔහු හෝ ඇය ඇතුළත් නොවුණොත් එයින් යට ඉන්න ළමයෙකුට අසාධාරණයක් වෙන්නේ ඒ ළමයාට ඒ පීඨයට ඇතුළත් වෙන්නට බැරි වුණොත් පමණයි. නමුත් මම මේ කියන අවස්ථාව එහෙම එකක් නොවෙයි. ළමයෙක් පළමුවන වතාවට විභාගයට ලියලා දෙවන වතාවේ විභාග ප්‍රතිඵල එනකොටත් ඔහු පළමුවන වතාවේ සුදුසුකම් ලැබූ පීඨය පටන් අරගෙන නැත්නම්, ඒ දරුවා අලුත් පීඨයකට ඇතුළත් වීමෙන් ඔහු කලින් සුදුසුකම් ලබා තිබූ පීඨයේ ඇතිවන පුරප්පාඩුවට යට ඉන්න දරුවෙක්ව ඇතුළත් කර ගන්න පුළුවන්.

අද විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම තමන්ගේ අකාර්යක්ෂමතාව වසාගන්න කටයුතු කරනවා. අපි මේ කාරණය ගරු ඇමතිතුමා වෙත ගෙනාවා. වෛද්‍ය පීඨයට තේරුණු දැරිවියන් පස් දෙනෙක් සහ ඉංජිනේරු පීඨයට තේරුණු දරුවෝ තුන් දෙනෙක් සම්බන්ධව. ඔවුන් අතිශය සාමාන්‍ය පවුල්වල දරුවෝ. ඔවුන් වෛද්‍ය පීඨයට තේරිලා තිබෙනවා. අද මේ රටේ මන්ත්‍රීවරු, ඇමතිවරු, ජනාධිපතිවරු හුඟක් අය කිඹුල් කඳුළු හෙලනවා. "S" සාමාර්ථ තුනක් ගත්තු අයට වෛද්‍ය උපාධිය දෙන්න ඕනෑය කියලා. එහෙම ආණ්ඩු මේ "S" සාමාර්ථ තුනක් නැති, ලක්ෂ සියය, දෙසිය වියදම් කරන්න සල්ලි තිබෙන කට්ටියට උපාධිය දෙන්න ඕනෑය කියනවා. නමුත් නාරම්මල මයුරපාද විද්‍යාලයේ ඉගෙන ගත්ත රටේ සාමාන්‍ය දුප්පත් අම්මා - තාත්තාගේ දැරිවියක් වෛද්‍ය පීඨයට තේරෙනවා. ඒ ගැන කථා කරන්න කවුරුවත් නැහැ. ඒ ගැන කථා කරන්න මේ රටේ පාර්ලිමේන්තුවේ ඇමතිවරු, අගමැතිවරු නැහැ. අද පෞද්ගලික සරසවි වෙනුවෙන් කොච්චර අය ඉදිරිපත් වෙනවාද කියා අපි දන්නවා.

එම නිසා ආණ්ඩුවට, ගරු අමතිතුමාට අවධාරණය කර අප මේ කාරණය කියා සිටිනවා. එම නිසා අපි ඉල්ලා සිටින්නේ මෙයයි. දෙවන වර විභාගයේ ලකුණුවලින් ඉහළට යන්නට අවස්ථාව ලැබෙන හැම ළමයාටම නොවෙයි; දෙවන වර විභාගයේ ලකුණුවලින් ඉහළ පීඨයට යන්න පුළුවන් ළමයින් ඉන්නවා නම්, ඔවුන්ගේ පළමුවන වර විභාගයේ ප්‍රතිඵල මත ඔවුන්ව යවන්නට සුදුසුව තිබුණු පාඨමාලා පටන් ගෙන නැත්නම් ඒ ළමයින්ට මේ අවස්ථාව ලබා දෙන්න. එයින් කිසිම හානියක් පහළ ලකුණු ප්‍රමාණයේ ඉන්න දරුවන්ට සිද්ධ වන්නේ නැහැ. අපේ රටේ නොමිලයේ ලැබූ අධ්‍යාපන ක්‍රමයෙන් ඉහළට ගිය නිලධාරීන් ඉන්නවා. ඔවුන් කුහකයි. ඔවුන්ට තමන් ඉහළට ආ ක්‍රමය තේරෙන්නේ නැහැ. ඒ ගැන කථා කරන්න ගියොත් බොහෝ කාලය ගත වෙනවා. එම නිසා මේ කාරණා තුන මම ඔබතුමාගේ අවධානයට යොමු කරනවා.

## විධායක ජනාධිපති...

05 පිටුවෙන්

පරාජයට පත්කළ යුතුය. රනිල් වික්‍රමසිංහලාට මෙන්ම මෛත්‍රීපාල මහතාටද විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීම තම ප්‍රධන පොරොන්දු ලෙස ප්‍රකාශ කිරීමට සිදුවූයේ, ජනතා විමුක්ති පෙරමුණත් මෙරට සිවිල් සංවිධාන රැසකුත් සමාජය තුළ ගොඩනැගූ විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කළ යුතුය යන ප්‍රබල ජනමතය නිසාය. දැන් තම බලලෝභය වෙනුවෙන් ජනාධිපතිවරයා හා ශ්‍රීල.නි.ප. කණ්ඩායම එම ජනමතයට පයින් ගැසීමට සූදානම් වන්නේ නම් ඊට එරෙහිව ප්‍රජාතන්ත්‍රවාදය ඉල්ලා සිටි, විධායක ජනාධිපති ක්‍රමය වෙනස් කළ යුතු යැයි ඉල්ලා සිටි, සියලු බලවේග, සංවිධාන පෙරට පැමිණිය යුතුය. තම හඬ අවදිකළ යුතුය. නැතිනම් නිහැඬියාව තුළ ප්‍රතිගාමීන් තම අරමුණ සපුරා ගන්නවා ඇත.



විධායක ජනාධිපති ක්‍රමය රැක ගනිමින් ඡන්ද ක්‍රමය පමණක් වෙනස්කරන ව්‍යවස්ථාවක් නිර්මාණය වුවහොත් එය නව ව්‍යවස්ථාවක් නොවන නිසා එය පැරදවීමටත්, විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරන බවට ජනාධිපතිවරයා කිහිප වරක් දුන් පොරොන්දුවට අනුව කටයුතු කරන ලෙස ඔහුට බල කිරීමටත් විධායක ජනාධිපති ක්‍රමය තවදුරටත් තබාගැනීමට දරන කුමන හෝ උත්සාහයක් පැරදවීමටත් සියලු ප්‍රගතිශීලි හා ප්‍රජාතන්ත්‍රවාදී බලවේග සක්‍රීය ලෙස මැදිහත් විය යුතුය.

## මිථ්‍යාව තවමත්...

11 පිටුවෙන්

හේතුව හා ඵලය වටහා නොගන්නා නිසාය. පරිසර විනාශයන්ට මෙන්ම මිනිසාගේ දුප්පත්කමට හේතුව ධනපති ක්‍රමය පරිසරය විනාශ කිරීමත් සමාජ ධනය කිහිප දෙනෙකු අත ගොඩගසා ගැනීමත් බව ඔවුහු නොසිතති.

මේ සියල්ලෙන් පැහැදිලි වන්නේ මිථ්‍යාවන් තහවුරු වීමට නූගත්කම හා ගතානුගතික බව විශාල සාධකයක් වන බවය. අනෙක් සාධක ගැන කතා කිරීමට මීළඟ කලාපයෙන් හමු වෙමු.

## ජනතාවට COPE...

03 පිටුවෙන්

බැහැ. මෙතෙන්දී සිද්ධවෙලා තිබෙන්නේ අර්ථසාධක මුදල, රක්ෂණ භාර අරමුදල, විශ්‍රාම වැටුප් අරමුදල වැනි මහා පරිමාණව ජනතාවගේම මුදල් එකතුවෙලා තිබෙන අරමුදල් තමයි බොහෝ වෙලාවට මේ බැඳුම්කර ගනුදෙනුවලදී ණය දෙන්න මූලික වෙන්නේ. හැබැයි ඒ මූලික වෙන පාර්ශවයන් ඒ ක්‍රියාවලියෙන් ඉවත් කරලා ඔවුන්ට ඉවත්වෙන තැනට වැඩ සිද්ධකරලා තමන්ගේ බලය පාවිච්චි කරල රුපියල් 100යේ බැඳුම්කරයක් රුපියල් 80ට 88ටවැනි මුදලකට අරගෙන නැවත රුපියල් 120කට විතර රජයටම, අර්ථසාධක අරමුදල් වැනි අරමුදල්වලට අලෙවි කරල රජයට එක් වරක් නොව දෙවරක් පාඩු සිද්ධකිරීමේ ක්‍රියාවලියක් තමයි මෙතන තියෙන්නේ.

එක පැත්තකින් එවැනි අරමුදල් සැපයීමේ වගකීම අර්ථසාධක අරමුදල වැනි ආයතනයකට අරගෙන රජයටම ඒ අරමුදල්වලට යම්කිසි පොලී ප්‍රතිශතවලින් වාසියක් ලබාගන්න තියෙන ඉඩකඩ නැතිවෙනවා. ඒ විතරක් නොවෙයි ඉතාම පැහැදිලිව ඒවා පෞද්ගලික තැරැව්කරුවන් අතට පත්වෙලා තියෙනවා. විශේෂත්වය තමා මහ බැංකුවට ණයට දෙන්න ණය පහසුකම් සලසන්න බැඳුම්කර ගන්න උදවිය ඒවට මුදල් සපයගෙන තියෙන්නේත් මහ බැංකුවෙන්ම ණයට අරගෙන. මහ බැංකුවෙන් ණයට අරගෙන මහ බැංකුවටම ණයට දීපු තත්වයක් තමයි තියෙන්නේ. ඒක ඇවිල්ල ඌරගේ මාලු ඌරගේ ඇඟේ තියලා කපනවා කීව එකේ වර්තමාන උදාහරණය. ඒක තමයි බැඳුම්කර ක්‍රියාවලියේදී අපට පේන්නේ. ඒකෙදී විශේෂයෙන්ම ජනතා විමුක්ති පෙරමුණ පක්ෂයක් හැටියට වගේම අපි යම් වගකීමක් භාරගත්තොත් ඒ වගකීම හරියට ඉෂ්ටකරන පිරිසක් හැටියට මේ අවස්ථාවේ අපි කටයුතු කරලා තියෙනවා. ඒක ගැන අපිට සැහීමකට පත්වෙන්න පුළුවන්කම තියෙනවා. එහිදී රටේ ජනතාව අප කෙරෙහි තබන විශ්වාසය අපි ආරක්ෂා කරලා තියෙනවා.

***නියමුවා:- කෝප් කමිටු වාර්තා ගණනාවක් පසුගිය කාලයේ එළි දුටුවා. රාජ්‍ය ආයතන ගණනාවක දූෂණ අක්‍රමිකතා පිළිබඳව සහ ඒවායේ ප්‍රධානීන්ගේ මැදිහත්වීම් හෙළි වී තිබෙනවා. එහෙත් රටට අහිමි වූ මුදල් සංඛ්‍යා වශයෙන් රට දැනගන්නවා හැරෙන්නට ඒවා නැවත අයකර ගැනීමට හෝ දඬුවම් දීමට කෝප් කමිටුව අසමත්. මේ තුළ කෝප් කමිටුවට කළ හැක්කේ කුමක්ද?***

***සුනිල් හඳුන්නෙත්ති සහෝදරයා:-*** ඇත්ත. මොකද මේ කාරක සභාවන් මේ වගේ කමිටු හදාගෙන තිබෙන්නේ පවතින ධනපති ක්‍රමයේ බොරු ප්‍රජාතන්ත්‍රවාදය පෙන්නන්න මිසක් ඇත්තට හොරුන්ට දඬුවම් දීලා දූෂිතයින්ට දඬුවම් දීලා මේ ක්‍රමය නිවැරැදි කරන ආකාරයට නොමෙයි. කොටින්ම ගත්තොත් ධනේශ්වර ප්‍රජාතන්ත්‍රවාදයේ තිබිය යුතු පාරදෘෂ්‍යභාවය විනිවිදභාවය ප්‍රජාතන්ත්‍රභාවය පෙන්නන්වත් මේවා අසමත්. ඇත්තටම තියෙන්නේ හොරුන්ට දඬුවම් දෙනවා වෙනුවට ඔවුන්ව ශුද්ධ පවිත්‍ර කරන ක්‍රමයක්. ඒක හැදිලා තියෙන්නේ මේ නීතිරීතිවලින්. මේ නීතිරීති ගත්තොත් පොදු ව්‍යාපාර කාරක සභාවේ කථා කරන දෙයක්. මට සභාපතිවරයා හැටියට මාධ්‍යයට කියන්නත් බැහැ. ඒ වගේ තමයි පාර්ලිමේන්තුවට වාර්තාවක් ඉදිරිපත් කිරීම පමණයි කළ හැක්කේ. වාර්තාවෙන් පසුව තීන්දු තීරණ ගන්න ඕනෑ පාර්ලිමේන්තුව. ඒක තමා නීත්‍යානුකූලව තිබෙන සීමාව.

එතකොට ප්‍රශ්නෙ ගත්තොත් ඇයි මාධ්‍යයට මේ ගැන මොකුත් කියන්න බැරි. හරි විධිය නම් හොරු ආරක්ෂා කරන්නේ නැති පාලනයක් නම්, ක්‍රමයක් නම් රාජ්‍ය ව්‍යාපාරවල රාජ්‍ය ආයතනවල දූෂණ වංචා හෙළිකිරීමේ හැකියාව තියෙන්න ඕනෑ. ඇත්තටම ගත්තොත් මාධ්‍යයට විවෘත කරන්න ඕනෑ. පාර්ලිමේන්තුව අද මාධ්‍යයට විවෘත කරලා තියෙනවා වගේ ඊට වඩා වැඩි ප්‍රමාණයකින් රටේ මහජනතාවගේ මූල්‍ය පාලනය විගණනය කටයුතු පරීක්ෂා කරන තැන කවුද හොරකම් කරලා තියෙන්නේ කවුද හොරකම් කරන්න නියෝග දීලා තියෙන්නේ කවුරු කවුරුද ඒවට සම්බන්ධවෙලා තියෙන්නේ කියන ඒවා ජනතාව දැනගන්න ඕනෑ. ජනතාවට දැනගන්න තියෙන ක්‍රමය වහලම තමයි මේ ගොල්ලන්ගේ මේ ප්‍රජාතන්ත්‍රවාදය පෙන්නලා තිබෙන්නේ. ඒක ඇත්තට ගත්තොත් බොරු ප්‍රජාතන්ත්‍රවාදයක්. බොරු විනිවිදභාවයක්. ඕක තමයි යථාර්ථය. ඊළඟට දඬුවම්දීම ගත්තත් එහෙමයි.

නමුත් දැන් මේ පොදු ව්‍යාපාර කාරක සභාවෙන් මීට කලිනුත් අධිකරණ ක්‍රියාමාර්ග ගන්න අල්ලස් හෝ දූෂණ කොමිසමට පැමිණිලි කරන්න නීත්‍යානුකූලව කටයුතු කරන්න කියා දීපු නියෝග ක්‍රියාත්මක වෙලා නැහැ. නමුත් ඒ තත්වය අද යම් ප්‍රමාණයකට වෙනස් කරගෙන තිබෙනවා. ඒ වෙනස් කරගන්න අවශ්‍ය කරන විකල්ප නව ක්‍රමවේද අපි හඳුන්වා දී තියෙනවා. එයින් එකක් තමයි ප්‍රධාන වශයෙන් ස්ථාවර නියෝග වෙනස් කරලා පාර්ලිමේන්තුවේ නීතිරීති වෙනස් කරලා අපි කියන්නේ මේක මාධ්‍යයට ඉඩ විවෘත කරන්න ඕනෑ. මාධ්‍යවල මේ වාර්තා පළකරන්න ඉඩදෙන්න ඕනෑ. විකල්ප ෆේස්බුක් අන්තර්ජාල වැනි වෙබ් අඩවිවල මේවා පළවෙන්න ඉඩදෙන්න ඕනෑ. ජනතාවට පොදු ව්‍යාපාර කාරක සභාවේ කටයුතුවලට සම්බන්ධ වෙන්න පැමිණිලි කරන්න ඉඩ හදන්න ඕනෑ.

දැනටත් තියෙන නීතිමය බාධාවන් සීමාවන් යටතේ වුණත් අපි ඒ දේ කරනවා. මොකද අපිට මේවායේ රැකිය යුතු සදාචාරය තියෙන්නේ ජනතාවට මේ ආයතන වටිනවාද නැද්ද මේවායෙන් වන සේවය මොකක්ද යන්න මතයි. මේවා ආරක්ෂා විය යුත්තේ ජනතාව වෙනුවෙන් නම් ජනතාවට මේ දේවල් විවෘත විය යුතුයි. මීට කලින් සිදුවූයේ වාර්ෂිකව වාර්තාවන් ඉදිරිපත් කිරීම. ඒනිසා සමහරවිට නීතිය හමුවට පමුණුවලා නැත්නම් අයකර ගැනීම් කරලා දඩගහලා මේ වැරැදිකරන අයගෙන් මේ මුදල් අයකර ගන්න හොයනකොට ඒගොල්ලො විශ්‍රාම ගිහිල්ලා. නැතිනම් මිය ගිහිල්ලා. නැත්නම් රට ගිහිල්ලා. නැත්නම් සේවය අතහැර ගිහිල්ලා. හුඟක් වෙලාවට වුණේ ඒක තමා. දැන් අවුරුදු ගණනක් පරණවෙලා තමා පාර්ලිමේන්තුවට එන්නේ. නමුත් දැන් අපි ක්‍රමවේදය වෙනස් කරලා තියෙනවා. කමිටුවට යම් ආයතනයක් කැඳවූ දිනයේම පසුදාම ඔවුන්ට නිර්දේශ යොමුකරන ක්‍රමයක් හදලා තිබෙනවා.

ඊට අමතරව කාර්තු ගතව වාර්තා ඉදිරිපත් කරන්න අපි ක්‍රමයක් හදලා තියෙනවා. මේ බැඳුම්කර සම්බන්ධ ගනුදෙනුවත් විශේෂ කමිටු වාර්තාවල් හැටියට අපි හෙළිදරව් කළේ. නැත්නම් මේකත් අවුරුදු ගණනක් හමස් පෙට්ටියට යනවා. දැන් පළමුවන දේ හැටියට කවුද හොරු කියල රට දැනගන්නවා අපි නිසා. ඊළඟට අපි කියන්නේ කාර්තුවකට සැරයක් මාස 03කට සැරයක් විතර අපි කැඳවන ආයතන පිළිබඳව වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනවා. රටට ඉදිරිපත් කරනවා. දැනටමත් අපි යම් නිර්දේශ ඉදිරිපත් කරලා තියෙනවා. සමහර සභාපතිවරුන්ව ඉවත් කරන්න කියලා නිර්දේශ ඉදිරිපත් කරල තියෙනවා. ඒ නිසා අලුත් පණක් පාර්ලිමේන්තුව තුළින් අපට කළ හැකි උපරිම ආකාරයට පොදු කාරක සභාවට කොප් කමිටුවට අපි දීල තියෙනවා. ඒක කළ හැක්කේ දේශපාලන වශයෙන් ස්වාධීන මුදල්වලට කෑදරකමට වරප්‍රසාදවලට යට නොවූ මහජන නියෝජිතයින්ට පමණයි. එවැනි මහජන නියෝජිතයින් හැටියට ජනතා විමුක්ති පෙරමුණේ අපි පාර්ලිමේන්තුවට යවපු ජනතාවට මේ ගැන සතුටුවෙන්න පුළුවන්.

මහජනතාවගේ අදහස් විමසන ක්‍රමවේදයක් අපි සකස් කරගෙන තියෙනවා. ඉදිරියේදී සෑම ආයතනයකටම අපි බලාපොරොත්තු වෙනවා ප්‍රශ්නාවලියක් යොමුකරන්න. ඒ ආයතනවල තියෙන ගැටලු අපට ලබාගන්න ක්‍රමයක් හැටියට මහජන පැමිණිලි ලබාගැනීමේ ක්‍රමවේදයක් හදන්න බලාපොරොත්තු වෙනාවා. මෙවැනි ක්‍රම හරහා විකල්ප වශයෙන් ජනතා විමුක්ති පෙරමුණේ පාලනයක් තුළදී කොහොමද මෙවැනි කාරක සභාවක් පණ ගන්වන්නේ කියන එක වර්තමාන තත්වය තුළ සජීවීව කටයුතු කරවන්න අපට තියෙන සීමිත මහජන නියෝජිත බලය තුළ අපි කරලා පෙන්වනවා. නමුත් අධිකරණයෙන් කරන්න පුළුවන් දේ පොදු කාරක සභාවෙන් කරන්න පුළුවන් කියලා අන්ධ විශ්වාසයක අපි නැහැ.

***නියමුවා:- ධනේශ්වර ප්‍රජාතන්ත්‍රවාදය තමන්ගේ සුජාතභාවය පෙන්වීම සඳහා හඳුන්වාදුන් කෝප් වැනි ආයතනයකින් කළ හැක්කේ පුද්ගලයින්ගේ දූෂිත බව ඔප්පු කිරීමටයි. එහෙත් එය ජනතාවට මේ ක්‍රමයේ දූෂිත බව හෙළිදරව්කිරීම වෙනුවෙන් යොදාගත හැකිද?***

***සුනිල් හඳුන්නෙත්ති සහෝදරයා:-*** මේ ක්‍රමයේ දූෂිත බව හෙළිදරව් කරන්න සමස්ත වශයෙන් යොදාගන්න බැහැ. මේ ක්‍රමය විසින් නිර්මාණය කරන දූෂිත පුද්ගලයින් සහ දූෂිත යාන්ත්‍රණයන් හෙළිදරව් කරන්න පුළුවන්කම තියෙනවා. මේ රාජ්‍ය ව්‍යාපාරවල සංස්ථාවල මණ්ඩලවල පාවිච්චි කරන්නේ මහජනතාවගේ මුදල්. වැඩකරන ජනතාව දුක් විඳින ජනතාව බදු මුදල් හැටියට වැට් බදු හැටියට විවිධ ආකාරයෙන් ගෙවන මුදල් තමයි මේ ආයතනවලින් පාවිච්චි කරන්නේ. ඇත්තට වෙන්න ඕනෑකම තියෙන්නේ එමගින් ජනතාවට ලැබෙන ප්‍රතිලාභයයි වැදගත් වෙන්නේ. ජනතාව බදු ගෙවන ප්‍රමාණයට ජනතාවට ප්‍රතිලාභයක් 14 වැනි පිටුවට

# නියමුවා

ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත

464/20. පන්නිපිටිය පාර පැලවත්ත. බත්තරමුල්ල දුර. 0112-785612 Email: niyamuwanews@gmail.com






වැට් බද්දට එරෙහි තරුණ විරෝධය..



වැට් බද්දට එරෙහි කාන්තා විරෝධය...



අධ්‍යාපන සමුපකාරයේ වැඩ භාරගනිමින්...



විරු සිසු ගුණ සමරා...



ලන්ඩනයේදී ශ්‍රී ලාංකිකයින් අමතමින්...

## මහ බැංකු බැඳුම්කර වංචාවෙන් රටට අහිමි වූ මුදල් නැවත අත්පත් කරගත යුතුයි

**ජ.වි.පෙ. නායක අනුර දිසානායක සහෝදරයා**

මහ බැංකු අධිපතිවරයා වංචනිකයෙකු බව දැන සිටිමින්ම ඔහු මෙතරම් කාලයක් තනතුරේ තබා ගැනීම ආණ්ඩුවේ බරපතළ වරදක් බවත් ඔහුට නැවත පත්වීම ලබා නොදීමෙන් ප්‍රශ්නය අවසන් නොවන බවත් පෙන්වා දුන් ජ.වි.පෙ. නායක අනුර දිසානායක සහෝදරයා එම වංචාකාරී බැඳුම්කර ගනුදෙනු හේතුවෙන් රටට අහිමි වූ මුදල් නැවත අත්පත් කරගත යුතුව ඇති බවත් ඔහුට දඬුවම් ලබාදිය යුතු බවත් අවධාරණය කළේය.

ඔහු මෙම අදහස් පළ කළේ පසුගිය 28වැනි දින ජ.වි.පෙ. ප්‍රධාන කාර්යාලයේ පවත්වන ලද ජනමාධ්‍ය හමුවකදීය.

වැඩිදුරටත් අදහස් දැක්වූ අනුර දිසානායක සහෝදරයා මෙසේද පැවසීය.

"රාජපක්ෂ පාලනය තුළ කබ්රාල් අධිපතිවරයාගේ ප්‍රශ්නකාරී හැසිරීම හේතුවෙන් මහ බැංකුව සම්බන්ධයෙනුත් මහ බැංකු අධිපතිවරයාගේ ක්‍රියා කලාපය ගැනත් රට තුළ වඩා වැඩි අවධානයක් යොමු වී තිබුණා. එවැනි තත්වයකදී රනිල් වික්‍රමසිංහ අගමැතිවරයා තමන්ගේ ගජ මිතුරා වූ අර්ජුන මහේන්ද්‍රන් එම පුටුවේ වාඩි කළා. ඉන් පසු 2015 පෙබරවාරි 27වැනිදා සිදුවූ බැඳුම්කර ගනුදෙනුවේදී මහ බැංකු අධිපතිවරයා තමන්ගේ බෑනාට වැඩි වාසි අත්වන ආකාරයට බැඳුම්කර නිකුතුව රුපියල් බිලියන 01 සිට රුපියල් බිලියන 10ක් දක්වා වැඩිකළා. මෙම ගනුදෙනු මගින් තමන්ගේ බෑනාගේ සමාගමට වැඩි



ලාභයක් අත්කර දීමට ඔහු කටයුතු කළා.

මෙම මුදල් ගනුදෙනු අර්ජුන මහේන්ද්‍රන් සහ ඔහුගේ බෑනා අතර සිදුවූ පෞද්ගලික ගනුදෙනුවක් නම් ඒ පිළිබඳව අපිට ප්‍රශ්නයක් පැන නගින්නේ නැහැ. නමුත් මෙයට මහජන මුදල් සම්බන්ධයි.

## දූෂිත ගනුදෙනු යට ගසා ආණ්ඩුවට ඉදිරියට යා නොහැකියි

**ජ.වි.පෙ. ප්‍රචාරක ලේකම් විජිත හේරත් සහෝදරයා**

දූෂිත ගනුදෙනු හේතුවෙන් රටට බරපතළ පාඩුවක් සිදුවී ඇති බවත් එම අලාභයන් පියවා ගැනීම සඳහා වත්මන් ආණ්ඩුව ජනතාවට බදු පැනවීමටත් ණය ගැනීමටත් කටයුතු කරන බව කියා සිටි ජ.වි.පෙ. ප්‍රචාරක ලේකම් විජිත හේරත් සහෝදරයා මෙම දූෂිත ගනුදෙනු යටපත් කර ආණ්ඩුවට තවදුරටත් ඉදිරියට යාමට හැකියාවක් නොමැති බව ප්‍රකාශ කළේය. එසේම එවැනි තත්වයක සිටියෙදීත් වත්මන් ආණ්ඩුව මහ බැංකු අධිපතිවරයා ආරක්ෂා කිරීමටත් අයථා ගනුදෙනු ආරක්ෂා කිරීමටත් කටයුතු කිරීම ලැජ්ජා සහගත යැයිද ඔහු පෙන්වා දුන්නේය.

විජිත හේරත් සහෝදරයා මෙම අදහස් පළ කළේ පසුගිය 26වැනි දින ජ.වි.පෙ. ප්‍රධාන කාර්යාලයේදී පවත්වන ලද මාධ්‍ය සාක්ච්ඡාවකදීය. එහිදී තවදුරටත් අදහස් දැක්වූ විජිත හේරත් සහෝදරයා මෙසේද පැවසීය.

"මහ බැංකුවේ අධිපති ධුරය පාවිච්චි කරලා අපේ රටේ ජනතාවගේ මුදල් සමඟ සෙල්ලම් කරන්න දෙන්න බැහැ. මහබැංකුව තුළ සිදුවන ඉලක්කම් දශම ගණනක ගනුදෙනු නිසා අපේ රටේ ජනතාවට මුදල් කෝටි ගණන් පාඩු වෙනවා. මහ බැංකුව කියන්නේ රටේ මූල්‍ය පාලනයේ හදවතයි. ඒ නිසා මහ බැංකු අධිපතිධුරයට පත්වන



පුද්ගලයා කවුද කියලා අපට අදාල නැහැ. ඕනෑම පුද්ගලයෙකු එම තනතුරේ සිට වැරදි කළොත් ඊට එරෙහිව අපි මැදිහත් වෙනවා."

## මේ සියලුම දෙනා එක අත්තේ වහන කුරුල්ලන්

**ජ.වි.පෙ. නායක අනුර දිසානායක සහෝදරයා**

සොරකම් හෙළිදරව් වී තිබියෙදී නිසි කියා පටිපාටිය අනුව නීතිය ක්‍රියාත්මක නොවන්නේ ඒ සියලු දෙනා මිතුරන් ලෙස ක්‍රියාත්මක වන, එක අත්තේ වසා සිටින කුරුල්ලන් නිසා යැයි ජ.වි.පෙ. නායක අනුර දිසානායක සහෝදරයා ප්‍රකාශ කළේය.

ඔහු මෙසේ පැවසුවේ පසුගිය 01වැනි දින ජ.වි.පෙ. ප්‍රධාන කාර්යාලයේ පවත්වන ලද මාධ්‍ය හමුවකදීය.

"අපි වංචාවක් ගැන චෝදනා එල්ල කරන්නේ සියල්ල සත්‍යනම් පමණයි. දෙගිඩියාවක් තිබෙනවා නම් චෝදනා එල්ල කරන්නේ නැහැ. අපි හොරු ගැන අහලා තිබෙනවා. හොරකම් දැකලා තිබෙනවා. හොරු දැකලත් තිබෙනවා. නමුත් හොරකම වෙලා තිබියදී, හොරා හසුවෙලා තිබියදී අදාල විදියට නීතිය ක්‍රියාත්මක වෙලා නැහැ. මේ සියලු දෙනා ගජ මිතුරෝ. කැබිනට් එකේ තීරණ ගන්නවා, ශිරන්ති රාජපක්ෂ අත්අඩංගුවට ගන්නේ නැහැ කියලා. එවැනි කැබිනට් මණ්ඩලයක් කොහොමද වංචනිකයින්ට-දූෂිතයින්ට දඬුවම් දෙන්නේ. වජිර අබේවර්ධන ඇමතිවරයා තම බලය පාවිච්චි කරමින් දූෂිතයින් ආරක්ෂා කරනවා. පොදු දේපොළ පනත යටතේ නඩු දාන පුද්ගලයින්ට ඇප ලබාදිය නොහැකිව තිබියදී එක දවසක්වත් හිර ගෙදර නොගිය දූෂිතයින් ඉන්නවා. ජනාධිපති කොමිසමේ සිදුකරන පරීක්ෂණ පිළිබඳව ජනාධිපතිවරයා නිර්දේශ ලබාදෙන්නේ නැහැ. මේ සියලු දෙනාම කරන්නේ රඟපෑමක්. මේ සියලුම දෙනා එකට කන බොන එකට පාටි දාන එක අත්තේ වහන කුරුල්ලන්.

අවුරුදු එක හමාරක් ගතවන විට මේ ආණ්ඩුව මේ රට අශිෂ්ටත්වය දක්වා රැගෙන යමින් තිබෙනවා. අශිෂ්ට පාලනය වෙනුවට ශිෂ්ට සම්පන්න පාලනයක් ගේන්නයි ජනතාව ඡන්දය දුන්නේ. එනිසා අපි යහපාලනය බලාපොරොත්තු වෙන ජනතාවට කියනවා ඕපපාතිකව යහපාලනය උදාකරගන්න බැහැ කියලා. ඒ සඳහා සමාජ ආර්ථික දේහයේ වෙනසක් සිදුකළ යුතුව තිබෙනවා. ශිෂ්ට සම්පන්න සමාජ ආර්ථික වෙනසක් වෙනුවෙන් සියලුම දෙනා පෙළගැසිය යුතු කාලයක් එළඹී තිබෙනවා. ඒ වෙනුවෙන් අපි සියලු දෙනාට ආරාධනය කරනවා." වැඩිදුරටත් අදහස් දැක්වූ අනුර සහෝදරයා කීය.

මේ මාධ්‍ය හමුව සඳහා ජ.වි.පෙ. මධ්‍යමකාරක සභික පළාත් සභා මන්ත්‍රී ලක්ෂ්මන් නිපුණආරච්චි සහෝදරයාද එක්ව සිටියේය.

## ජීවිත බේරාගත් ජනතාවගේ ජීවිතය පවත්වාගෙන යෑමට ආණ්ඩුව කඩිනමින් මැදිහත්විය යුතුයි

**ජ.වි.පෙ. ප්‍රචාරක ලේකම් විජිත හේරත් සහෝදරයා**



මුදල් අමාත්‍යවරයාට විශ්වාසභංගයක් ගෙන එන අවස්ථාවේ ඇමතිවරුන්ට වාහන ගෙන්වීම සඳහා කෝටි 118ක් වෙන්කරන ආණ්ඩුව මෙතෙක් ගංවතුරෙන් විපතට පත්වූවන් වෙනුවෙන් අවශ්‍ය කටයුතු ඉටුකර දීමට අසමත්ව ඇති බවට චෝදනා කළ ජ.වි.පෙ. ප්‍රචාරක ලේකම් විජිත හේරත් සහෝදරයා කොස්ගම සාලාව යුද හමුදා කඳවුරේ පිපිරීමෙන් විපතට පත්වූ ජනතාවට තමන් වෙනුවෙන් කඩිනමින් මැදිහත් නොවන්නේ මන්දැයි උද්ඝෝෂණය කරමින් ආණ්ඩුවෙන් ප්‍රශ්න කිරීමට සිදුවී ඇතැයි පෙන්වා දුන්නේය.

ඔහු මෙසේ කියා සිටියේ පසුගිය 10වැනි දින ජ.වි.පෙ. ප්‍රධාන කාර්යාලයේදී පවත්වන ලද මාධ්‍ය හමුවකදීය.

"ආණ්ඩුව විපතට පත්වූ සියලු දෙනාට රු. 50,000ක් දෙන බවට ප්‍රකාශ කර තිබුණත් එය ලැබෙන්නේ කොහොමද, ලැබෙන්නේ කවදද කියලා කිසිම තොරතුරක් ජනතාවට ලබාදී නැහැ. එනිසා ජනතාව කිසිදු තොරතුරක් නොමැතිව විශාල පීඩාවකට ලක්වෙලා ඉන්නවා. අසීරුවෙන් තම ජීවිතය බේරා ගත් ජනතාවට තම ජීවිතය පවත්වාගෙන යාමට අවශ්‍ය මැදිහත්වීම ආණ්ඩුව විසින් ලබාදිය යුතුයි. ඒ සඳහා කඩිනම් මෙහෙයුමක් දියත් කළ යුතුයි."





බත්තරමුල්ල, පැලවත්ත, පන්නිපිටිය පාරේ 464/20 හි පදිංචි එම්.ටිල්වින් සිල්වා වන මා විසින් අංක 43/20, නුගගහ පෙදෙස, පිළියන්දල පාර, මහරගම පිහිටි නියමුවා ප්‍රකාශන ආයතනයේ මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.